# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2019

**මංගල සමරවීර, පා.ම.**
**මුදල් අමාත්‍ය**

## 2019 මාර්තු 05

*2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2019 (4, 5 සහ 6 වගන්තිවලට අනුකූලව) සහ අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2019 (7, 8 සහ 9 වගන්තිවලට අනුකූලව) ගරු මුදල් අමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලැබේ.*

**ISBN 978-955-0814-23-7**

කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ කොළඹ 01, ලෝටස් පාරේ මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල් අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

## පටුන


| | පිටු අංකය |
|---|---|
| මූලික ආර්ථික දර්ශක | vii |
| 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා | viii |
| අනුකූලතාවය - 2018 | ix |
| **I කොටස** | |
| **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2019** | |
| **1. මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය** | |
| 1.1 මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය | 3 |
| 1.2 2019 අයවැය සඳහා පාදක වන පුළුල් ප්‍රමුඛතාවන් | 4 |
| 1.3 මතුවිය හැකි අවධානම් තත්ත්වයන්, අභියෝගයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන් | 5 |
| 1.4 මැදිකාලීන රාජ්‍ය මූල්‍ය අරමුණු | 7 |
| 1.5 මැදිකාලීන සාර්ව ආර්ථික උපකල්පන | 8 |
| **II කොටස** | |
| **අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2019** | |
| **1. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය** | |
| 1.1 සමාලෝචනය | 13 |
| 1.2 රජයේ ආදායම | 16 |
| 1.3 රජයේ වියදම | 30 |
| 1.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 33 |
| 1.5 විදේශ මූල්‍යයනය | 34 |
| **2. ගෝලීය සන්දර්භය තුළ ආර්ථිකය** | |
| 2.1 සමාලෝචනය | 45 |
| 2.2 ආර්ථික වර්ධනය | 45 |
| 2.3 මූල්‍ය අංශයේ ප්‍රවණතා | 53 |
| 2.4 කොටස් වෙළඳපල | 55 |
| 2.5 විදේශ අංශයේ ප්‍රවණතා | 56 |
| 2.6 ගෝලීය ආර්ථික සන්දර්භය | 59 |
| **3. රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය** | |
| 3.1 සමාලෝචනය | 63 |
| 3.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් පිළිබඳව කෙටි හැඳින්වීම | 63 |
| **4. 2019 අයවැය ඇස්තමේන්තු සැකසීම සඳහා පදනම් වූ සාධක** | |

| වගු | | |
|---|---|---|
| | | පිටු අංකය |
| | **I කොටස** | |
| වගුව 1.1 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අරමුණු - මැදිකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව | 3 |
| | **II කොටස** | |
| වගුව 1.1 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය | 13 |
| වගුව 1.2 | ඇස්තමේන්තුගත තත්‍ය ආදායම සහ වියදම - 2018 | 15 |
| වගුව 1.3 | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සංක්ෂිප්තය | 16 |
| වගුව 1.4 | ආදායම් බදු කාර්යසාධනය | 17 |
| වගුව 1.5 | එකතු කළ අගය මත බදු කාර්යසාධනය | 17 |
| වගුව 1.6 | නිෂ්පාදන බදු/සුරා බදු කාර්යසාධනය | 18 |
| වගුව 1.7 | මෝටර් රථ ආනයන සහ නව ලියාපදිංචි කිරීම් | 19 |
| වගුව 1.8 | නිදහස් වෙළඳ ගිවිසුම් අනුව ලබාදෙන ලද තීරු බදු සහන යටතේ ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම | 19 |
| වගුව 1.9 | ජාතිය ගොඩනැඟීමේ බදු, මුද්දර බදු සහ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු කාර්යසාධනය | 20 |
| වගුව 1.10 | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු කාර්යසාධනය | 21 |
| වගුව 1.11 | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2018 ජනවාරි සිට නොවැම්බර් | 21 |
| වගුව 1.12 | රාජ්‍ය වියදම් කාර්යසාධනය | 30 |
| වගුව 1.13 | රජයේ සුරැකුම්පත් සහ විනිමය අනුපාත මත ගෙවන පොළී අනුපාතයන්හි හැසිරීම - 2017 සිට 2018 | 31 |
| වගුව 1.14 | සුභසාධන වියදම් | 32 |
| වගුව 1.15 | රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 33 |
| වගුව 1.16 | දළ දේශීය ණය මූලාශ්‍ර අනුව | 34 |
| වගුව 1.17 | විදේශ මූල්‍යයන එකඟතා සහ අදාළ මූල්‍ය කොන්දේසි - 2018 ජනවාරි සිට නොවැම්බර් | 36 |
| වගුව 1.18 | සංවර්ධන පාර්ශවකරුවන් විසින් නිල සංවර්ධන සහයෝගිතා ලෙස සිදු කරන ලද ප්‍රතිලබ්ධි - 2018 ජනවාරි සිට නොවැම්බර් | 41 |
| වගුව 2.1 | ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි. ආංශික සංයුතිය | 47 |
| වගුව 2.2 | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් | 51 |
| වගුව 2.3 | සංචාරක අංශයේ කාර්යසාධනය | 52 |
| වගුව 2.4 | ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) | 52 |
| වගුව 2.5 | ශ්‍රී ලංකාවේ මතුපිට, මූලික සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය: 2013 = 100) | 55 |
| වගුව 2.6 | ප්‍රාග්ධන වෙළඳපල වෙනස්වීම් | 56 |
| වගුව 2.7 | විදේශ වෙළඳාම | 57 |
| වගුව 3.1 | විදුලි ජනන ධාරිතාවයේ සංයුතිය | 65 |
| වගුව 3.2 | රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ලාභදායීත්වය | 66 |
| වගුව 3.3 | රජය සතු වාණිජ ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම | 67 |

## රූපසටහන්

පිටු අංකය

### II කොටස


| | | |
|---|---|---|
| රූපසටහන 1.1 | මුළු ආදායම් සංයුතිය - 2018 ජනවාරි සිට නොවැම්බර් | 16 |
| රූපසටහන 1.2 | මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම - 2018 ජනවාරි සිට නොවැම්බර් | 16 |
| රූපසටහන 1.3 | නිෂ්පාදන බදු/සුරා බදු කාර්යසාධනය - 2018 ජනවාරි සිට නොවැම්බර් | 18 |
| රූපසටහන 1.4 | මූලාශ්‍ර අනුව දළ දේශීය ණය - 2018 ජනවාරි සිට නොවැම්බර් | 34 |
| රූපසටහන 1.5 | අංශ අනුව නිල සංවර්ධන පාර්ශවකරුවන් සමග ඇතිකරගත් එකඟතා (එ.ජ.ඩො. මිලියන) - 2018 ජනවාරි සිට නොවැම්බර් | 35 |
| රූපසටහන 1.6 | අංශ අනුව සිදුකරන ලද උපයෝජන (එ.ජ.ඩො. මිලියන) - 2018 ජනවාරි සිට නොවැම්බර් | 42 |
| රූපසටහන 1.7 | සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල එකඟ වූ උපයෝජනය නොවූ ශේෂය (එ.ජ.ඩො. මිලියන) - 2018 නොවැම්බර් දක්වා | 42 |
| රූපසටහන 2.1 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | 45 |
| රූපසටහන 2.2 | දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2018 පළමු කාර්තු තුන | 46 |
| රූපසටහන 2.3 | කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2018 පළමු කාර්තු තුන | 46 |
| රූපසටහන 2.4 | කර්මාන්ත අංශයේ සංයුතිය - 2018 පළමු කාර්තු තුන | 49 |
| රූපසටහන 2.5 | නිෂ්පාදන අංශයේ සංයුතිය - 2018 පළමු කාර්තු තුන | 49 |
| රූපසටහන 2.6 | සේවා අංශයේ සංයුතිය - 2018 පළමු කාර්තු තුන | 50 |
| රූපසටහන 2.7 | සේවා වියුක්තිය | 53 |
| රූපසටහන 2.8 | පොළී අනුපාත, මුදල් සමස්තයන් සහ පුද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | 54 |
| රූපසටහන 2.9 | මතුපිට, මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා (පදනම: 2013=100) | 55 |
| රූපසටහන 2.10 | වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම් | 57 |
| රූපසටහන 2.11 | අපනයන සංයුතිය | 58 |
| රූපසටහන 2.12 | ආනයන සංයුතිය | 59 |


## සටහන්


| | | |
|---|---|---|
| සටහන 1 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2018 ජනවාරි සිට නොවැම්බර් | 23 |


## ඇමුණුම්


| | | |
|---|---|---|
| ඇමුණුම I | අයවැය සහාය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති ප්‍රතිපාදන - 2018 ජනවාරි සිට නොවැම්බර් | 75 |
| ඇමුණුම II | 2018 නොවැම්බර් 30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව | 97 |
| ඇමුණුම III | සාර්ව ආර්ථික දර්ශක | 99 |
| ඇමුණුම IV | 2019 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන | 107 |

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකක | වටිනාකම 2017 | වටිනාකම 2018 |
|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තු 3 | % | 3.2 | 3.3 |
| කෘෂිකර්මාන්ත | පළමු කාර්තු 3 | % | (3.5) | 4.3 |
| කර්මාන්ත | පළමු කාර්තු 3 | % | 4.8 | 1.8 |
| සේවා | පළමු කාර්තු 3 | % | 3.2 | 4.4 |
| උද්ධමනය (ලක්ෂමය) | නොවැ. අවසන | % | 7.6 | 3.3 |
| උද්ධමනය (සාමාන්‍ය) | නොවැ. අවසන | % | 6.4 | 4.6 |
| සේවා වියුක්ති අනුපාතය | පළමු කාර්තු 3 | % | 4.2 | 4.1 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | පළමු කාර්තු 3 | % | 53.6 | 51.8 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන. - නොවැ. | රු.බිලි. | (634) | (722) |
| මුළු ආදායම | ජන. - නොවැ. | රු.බිලි. | 1,657 | 1,770 |
| බදු ආදායම | ජන. - නොවැ. | රු.බිලි. | 1,527 | 1,587 |
| බදු නොවන ආදායම | ජන. - නොවැ. | රු.බිලි. | 130 | 183 |
| මුළු වියදම | ජන. - නොවැ. | රු.බිලි. | 2,293 | 2,500 |
| වර්තන වියදම් | ජන. - නොවැ. | රු.බිලි. | 1,742 | 1,951 |
| රාජ්‍ය ආයෝජන | ජන. - නොවැ. | රු.බිලි. | 561 | 569 |
| රාජ්‍ය ණය | ඔක්. අවසන | රු.බිලි. | 10,304 | 11,667 |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 10,341 | 10,856 |
| කෘෂි අපනයන | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 2,548 | 2,363 |
| කාර්මික අපනයන | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 7,746 | 8,445 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 4,562 | 4,824 |
| අනෙකුත් | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 3,184 | 3,621 |
| ආනයන | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 18,931 | 20,498 |
| පාරිභෝගික භාණ්ඩ | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 4,069 | 4,623 |
| අන්තර් භාණ්ඩ | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 10,242 | 11,505 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 2,776 | 3,637 |
| ආයෝජන භාණ්ඩ | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 4,476 | 4,296 |
| වෙළඳ ශේෂය | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | (8,590) | (9,642) |
| සංචාරක පැමිණීම් | ජන. - නොවැ. | සංඛ්‍යාව | 1,871,871 | 2,080,627 |
| සංචාරක ඉපයීම් | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 3,471 | 3,905 |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 6,493 | 6,431 |
| කොටස් වෙළඳපල විවිධ ආයෝජනය (ශුද්ධ) | ජන. - සැප්. | ඇ.ඩො.මිලි. | (1,552) | (880) |
| සමස්ත ගෙවුම් ශේෂය (BOP) | ජන. - නොවැ. | ඇ.ඩො.මිලි. | 2,068 | (807) |
| දළ නිල සංචිත | නොවැ. අවසන | ඇ.ඩො.මිලි. | 7,959 | 7,005 |
| විනිමය අනුපාතය (මාසය අග) | නොවැ. අවසන | ඇ.ඩො./රු. | 153.77 | 179.67 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය) | ජන. - නොවැ. | ඇ.ඩො./රු. | 153.66 | 176.85 |
| **මූල්‍ය අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | නොවැ. අවසන | % | 7.25 | 8.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | නොවැ. අවසන | % | 8.75 | 9.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය (SRR) | නොවැ. අවසන | % | 7.50 | 6.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා) | නොවැ. අවසන | % | 11.40 | 12.12 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු ප්‍රදාන අනුපාතය (SLIBOR) (මාස 01) | නොවැ. අවසන | % | 8.15 | 9.00 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91) | නොවැ. අවසන | % | 8.20 | 10.01 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364) | නොවැ. අවසන | % | 9.44 | 11.20 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_{2b}$) | නොවැ. 2017/නොවැ. 2018 | % | 17.9 | 13.9 |
| පුද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | නොවැ. 2017/නොවැ. 2018 | % | 15.3 | 16.2 |

## 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා

| වගන්තිය | වගන්තිය | අවශ්‍ය අන්තර්ගතය | අනුකූලතාවය |
|---|---|---|---|
| 4, 5 සහ 6 වගන්ති | රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායේ භාවිතය ඇගයීම සඳහා සම්මතයක් ඇති කර ගැනීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 7, 8 සහ 9 වගන්ති | අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ඇගයීම සඳහා අවශ්‍ය අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 10, 11 සහ 12 වගන්ති | වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | වසරේ පළමු මාස හතරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | අදාල වර්ෂයේ ජුනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාලපරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, මහජනතාවට නිකුත් කළ යුතුය. එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 13, 14 සහ 15 වගන්ති | අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව)* | පවත්නා වසරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැන ගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව (වාර්ෂික වාර්තාව) | මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට පෙර මහජනතාවට නිකුත් කර එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 16, 17, 18 සහ 19 වගන්ති | පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම** | රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සඳහා වන පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව | පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කිරීමේ ප්‍රකාශයෙන් සති තුනක් ඇතුළත රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් මැතිවරණ පූර්ව තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතුය. නව පාර්ලිමේන්තුව රැස් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

* මුදල් ඇමතිවරයා විසින්

** මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින්

# අනුකූලතාවය - 2018

- **අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව -** මුදල් අමාත්‍යාංශයේ 2017 වාර්ෂික වාර්තාව, එම වසරේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2018 මැයි මස අවසන් වන විට මහජනතාවට නිකුත් කර, ඉන් අනතුරුව එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව -** 2018 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2018 ජූනි මස අවසන් වන විට මහජනතාව වෙත ඉදිරිපත් කර ඉන්පසු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**මෙම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2019 හි පහත සඳහන් වාර්තා අන්තර්ගත වේ.**

- **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2019,** මුදල් අමාත්‍යාංශය ඉදිරිපත් කරන මෙම වාර්තාවේ, සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී වැදගත් ලෙස සළකනු ලබන පුළුල් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන් දක්වමින් රජයේ ප්‍රධාන ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් ඇතුළත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

- **අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2019,** මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන මෙම වාර්තාවේ රජයේ ආදායම, වියදම සහ රජයේ ණය ගැනීම් යනාදියේ ඇස්තමේන්තු ඇතුළත් වන අතර, රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ඇගයීමට පදනම් වන කරුණු ඇතුළත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

# 1 කොටස

## රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2019

### 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවනවර කියවන දිනයේ දී මුදල් අමාත්‍යවරයා විසින් රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වන අතර ඒ අනුව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

අයවැය සඳහා පදනම් වූ පුළුල් ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් විය හැකි යැයි රජය විසින් සලකනු ලබන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මෙම වාර්තාව මඟින් පැහැදිලි කරනු ලබයි.

# මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

# 01

## 1.1 මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

වගකීම් සහිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ මූලධර්මයන්ට අනුකූලව රජයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ මූලික ප්‍රමුඛතාවය වනුයේ මැදිකාලීන වශයෙන් රාජ්‍ය ආදායම් ඉහළ නැංවීම තුළින් රාජ්‍ය අයවැය පරතරය සහ රාජ්‍ය ණය මට්ටම තිරසර අයුරින් අවම මට්ටමක පවත්වාගෙන යාම වේ. දශක ගණනාවක් පුරා අඛණ්ඩව පවතින රාජ්‍ය අයවැය පරතරය සඳහා මූලික වශයෙන්ම හේතු පාදක වූ සාධක ලෙස බදු පදනම අඩු වීමත්, ඊට සාපේක්ෂව රාජ්‍ය වියදම පහළ මට්ටමකින් පවත්වා නොගැනීමත්ය. 2015 වසරේ දී ක්‍රියාත්මක කළ රාජ්‍ය ආදායම පදනම් වූ රාජ්‍ය මූල්‍ය ස්ථාවරභාවය වඩාත් ශක්තිමත් ක්‍රියාමාර්ගය තුළින්, රාජ්‍ය ආදායම තිරසරව ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්වා ඇත. නිදසුනක් ලෙස, ද.දේ. නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ දී සියයට 11.5 ක්ව පැවති රාජ්‍ය ආදායම, 2017 වසරේ දී සියයට 13.8 ක් දක්වා ඉහළ ගිය අතර, එම ආදායම 2018 වසරේ දී සියයට 13.4 ක් ද 2019 වසරේ දී සියයට 14.8 ක් ද වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඉනික්බිති වර්ෂයන්හි දී රාජ්‍ය ආදායම අඛණ්ඩව ඉහළ ගොස් 2022 වසර වන විට එම අගය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 17.0 ක මට්ටමක් දක්වා වර්ධනය වේ යැයි පුරෝකථනය කර ඇත.

**1.1 වගුව | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අරමුණු - මැදිකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව**

ද.දේ. නි. % ලෙස

| දර්ශකය | 2017 | 2018 තාවකාලික | 2019 ඇස්තමේන්තුගත | පුරෝකථන 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| **මුළු ආදායම හා ප්‍රදාන** | **13.8** | **13.5** | **14.8** | **15.5** | **16.8** | **17.0** |
| **මුළු ආදායම** | **13.8** | **13.4** | **14.8** | **15.5** | **16.8** | **17.0** |
| **බදු ආදායම** | **12.6** | **11.9** | **13.1** | **13.7** | **14.8** | **15.0** |
| ආදායම් බදු | 2.1 | 2.2 | 2.4 | 2.6 | 3.2 | 3.3 |
| භාණ්ඩ හා සේවා මත බදු | 7.7 | 7.4 | 8.1 | 8.5 | 9.1 | 9.1 |
| විදේශීය වෙළඳාම මත බදු | 2.8 | 2.4 | 2.6 | 2.6 | 2.6 | 2.6 |
| **බදු නොවන ආදායම** | **1.2** | **1.4** | **1.7** | **1.8** | **1.9** | **2.0** |
| **ප්‍රදාන** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** |
| **මුළු වියදම** | **19.4** | **18.8** | **19.7** | **19.7** | **20.3** | **20.5** |
| **වර්තන වියදම** | **14.5** | **14.6** | **14.5** | **14.6** | **15.1** | **15.2** |
| වැටුප් හා වේතන | 4.4 | 4.4 | 4.2 | 4.3 | 4.4 | 4.4 |
| භාණ්ඩ හා සේවා | 1.1 | 1.0 | 1.2 | 1.2 | 1.2 | 1.2 |
| පොළී ගෙවීම් | 5.5 | 5.9 | 5.8 | 5.9 | 6.0 | 6.0 |
| සහනාධාර සහ පැවරුම් | 3.4 | 3.3 | 3.3 | 3.3 | 3.6 | 3.6 |
| **ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම්** | **4.9** | **4.2** | **5.2** | **5.2** | **5.2** | **5.3** |
| රාජ්‍ය ආයෝජන | 4.9 | 4.4 | 5.3 | 5.3 | 5.3 | 5.3 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **(0.7)** | **(1.2)** | **0.3** | **0.9** | **1.7** | **1.8** |
| **ප්‍රාථමික ශේෂය** | **0.02** | **0.6** | **0.9** | **1.7** | **2.5** | **2.5** |
| **අයවැය හිඟය** | **(5.5)** | **(5.3)** | **(4.8)** | **(4.2)** | **(3.5)** | **(3.5)** |
| **අයවැය හිඟය මූල්‍යායනය** | **5.5** | **5.3** | **4.8** | **4.2** | **3.5** | **3.5** |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | 2.9 | 3.1 | 0.6 | 0.9 | 1.0 | 1.0 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 2.6 | 2.2 | 4.2 | 3.3 | 2.5 | 2.5 |
| **මධ්‍යම රජයේ ණය (ද.දේ.නි. % ලෙස)** | **77.6** | **83.6** | **79.0** | **77.0** | **75.0** | **72.0** |

මූලාශ්‍ර: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ඉහත ඇස්තමේන්තු සහ පුරෝකථනයන් 2018 වසරේ සැප්තැම්බර් මස අවසාන තොරතුරු මත පදනම් වේ

ඒ අනුව, මැදිකාලීන වශයෙන් අයවැය පරතරය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා අවකාශය හිමි වී ඇත. නිදසුනක් ලෙස, ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් අයවැය පරතරය 2014 වසරේ දී සියයට 5.7 ක් වූ ඉහළ අගයක සිට 2017 වසරේ දී සියයට 5.5 ක මට්ටමකට පහළ ගිය අතර, එය 2018 වසරේ දී සියයට 5.3 ක මට්ටමකට පහළ යනු ඇතැයි අපේක්ෂිත අතර, 2019 වසරේ දී සියයට 4.8 ක මට්ටමක් දක්වා තවදුරටත් පහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

මැදිකාලීන වශයෙන් අයවැය පරතරය ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.5 ක මට්ටමකට පත්වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර එමඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ ඉලක්කයන් සම්පූර්ණ කරනු ඇත. එලෙස අයවැය පරතරය පහළ යෑම තුළින් රාජ්‍ය ණයබරතාවය ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 2016 වසර අවසානයේ දී පැවති සියයට 78.8 මට්ටමේ සිට 2017 වසර අවසානයේ දී සියයට 77.6 ක මට්ටමකට පහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මැදිකාලීන වශයෙන් සැලසුම් කර ඇති දූරදර්ශී අයවැය හිඟය පාලනය කර ගැනීමේ ක්‍රියාමාර්ග තුළින්, 2022 වසරේ දී රාජ්‍ය ණයබරතාවය ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 72.0 ක මට්ටමකට අඩුවනු ඇතැයි පුරෝකථනය කර ඇත. රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය තුළ ඉතා වැදගත් අංගයක් ලෙස මැදිකාලීන වශයෙන් රාජ්‍ය ණයබරතාවය පහළ හෙළීම පහසු කරනු වස් ඉතා සුපරික්ෂාකාරීව සැලසුම් කර ඇති ප්‍රාථමික ගිණුමේ අතිරික්ත ශේෂයක් පවත්වා ගැනීම පෙන්වා දිය හැකිය. රාජ්‍ය ආදායමේ අඛණ්ඩ වර්ධනයත්, රාජ්‍ය වියදම ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කිරීමත් තුළින් ප්‍රාථමික ගිණුමේ අතිරික්තය ප්‍රමාණාත්මකව සහ තිරසාර ලෙස පවත්වාගෙන යෑමට රජයට අවස්ථාව හිමිවනු ඇත. දශක කිහිපයකට පසුව ප්‍රාථමික ගිණුමේ ශේෂය 2017 වසරේ දී අතිරික්තයක් වාර්තා කළ අතර, එනම්, ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එය සියයට 0.02 ක් වූ අතර, එය 2018 වසර සහ 2019 වසර වල දී පිළිවෙළින් සියයට 0.6 ක් හා සියයට 0.9 ක් මට්ටමකට ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

එලෙස සැලකිය යුතු ප්‍රාථමික ශේෂයක් පවත්වා ගැනීම සඳහා ඉතා සුපරික්ෂාකාරීව සිදුකරන වර්තන වියදම් කළමනාකරණ ඉවහල් වන අතර එහිදී ආර්ථිකයේ දිගුකාලීන වශයෙන් වර්ධනය තහවුරු කරන ප්‍රාග්ධන සහ සමාජයීය අංශයන් හි වියදම් කප්පාදුවක් සිදු නොවේ. එනම්, අධ්‍යාපනය සහ සෞඛ්‍යය යන අංශයන් වෙත රජය විසින් සිදුකරන ආයෝජනයන් අඛණ්ඩව පවත්වාගෙන යන අතර, සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය තහවුරු කෙරෙනු ඇත. ඒ අනුව, වර්තන වියදම් 2022 වසරේ දී ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 15.2 ක මට්ටමක පවත්වා ගනු ලබන අතර, රාජ්‍ය ආයෝජන ද.දේ. නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් දනට පවත්නා සියයට 4.4 මට්ටමක සිට 2022 වසරේ දී සියයට 5.3 ක මට්ටමක් දක්වා ඉහළ යනු ඇත.

## 1.2 2019 අයවැය සඳහා පාදක වන පුළුල් ප්‍රමුඛතාවන්

2018 වසරේ අයවැය වාර්තාව මගින් හඳුන්වා දුන් 'නීල - හරිත ආර්ථික' දැක්ම පදනම්ව 2019 වසරේ අයවැය සහ මැදිකාලීන රාජ්‍ය මූල්‍ය දැක්ම සම්පාදනය කර ඇත. ආර්ථිකයේ ගාමක බලවේගය වශයෙන් සලකන පුද්ගලික අංශය සඳහා පහසුකම් සලසනු වස් හඳුනාගත් අංශයන් හි ආර්ථික ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම රජය විසින් අඛණ්ඩව සිදු කරනු ඇත. ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා මූලික වශයෙන් යොමුවන ක්ෂේත්‍රයක් ලෙස විදේශීය වශයෙන් ප්‍රාග්ධනය සම්පාදනය තුළින් අපනයන වර්ධනය කිරීම සහ දේශීය ව්‍යවසායකයින් යළි නඟාසිටුවීමට ගනු ලබන ක්‍රියාමාර්ග පෙන්වා දිය හැකිය. එලෙස, ආර්ථික ලිහිල්කරණ කටයුතු ක්‍රියාත්මක වන අතරම, ගෝලීයකරණ සංදර්භය තුළ ඉතා වැදගත් අංගයක් බවට පත්වෙමින් පවතින පාරිභෝගික අයිතීන් තහවුරු කිරීම සඳහා ද රජය විසින් මනා අවධානයක් යොමු කරනු ඇත. තවද, ආර්ථික සමෘද්ධිය ඇති කිරීම සඳහා අදාළ වන තවත් වැදගත් අංශයක් ලෙස සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා ද රජය කටයුතු කරනු ඇත.

එවැනි පුළුල් පසුබිමක් තුළ 2019 වසරේ අයවැය ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි ප්‍රමුඛතාවක් දක්වනු ඇත. එනම්, (අ) 'ගම්පෙරළිය' වැඩසටහන ඔස්සේ ග්‍රාමීය සහ නාගරික අංශයන්හි සීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීම; (ආ) 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' වැඩසටහන තුළින් දේශීය ව්‍යවසායකයින්ට අවශ්‍ය ප්‍රාග්ධන අරමුදල් සම්පාදනයට පහසුකම් සැලසීම; (ඇ) පුද්ගලික අංශය සඳහා අවශ්‍ය උත්තේජනයන් සපයනු වස් අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස සහ ප්‍රවාහන වැනි අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම; (ඈ) මනා ලෙස සැලසුම් කළ සහ කාර්යක්ෂම සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් තුළින් එනම් සමෘද්ධි සහ අනෙකුත් සුභසාධක වැඩසටහන් රාශියක් ඔස්සේ 'දිළිඳු' ලෙස ගැනෙන සහ වැඩි අවධානයක් යොමුවිය යුතු සමාජ ස්ථරයන් තවදුරටත් සවිබල ගැන්වීම සහ (ඉ) ශ්‍රී ලංකාවේ සංවර්ධනය දිගුකාලීන වශයෙන් සාධාරණව සහ තිරසර අයුරින් පැවතීම තහවුරු කිරීම.

2019 වසරේ අයවැය සඳහා පාදක වන ඉහතින් දක්වූ ප්‍රමුඛතාවන් තුළින් සමාජයේ විවිධ ස්ථරයන් හි පවත්නා ගැටළු සහ අවශ්‍යතාවයන් සමනය කිරීම සඳහා අරමුදල් සම්පාදනය ප්‍රමාණාත්මකව සහ කාර්යක්ෂමව සිදුවීම තහවුරු කරනු ඇත. විශේෂයෙන්ම, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී රාජ්‍ය අංශයේ විශ්‍රාමිකයින් හා

සේවාදායකයින්, විදෙස් ගත වෘත්තිකයින් හා ශ්‍රමිකයින්, වතු අංශයේ ජනතාව, ශිෂ්‍යයින් හා පාසැල් අධ්‍යාපනය නිම කළ තරුණ තරුණියන් ඇතුළු විවිධ සමාජ කණ්ඩායම් සඳහා මනා අවධානයක් යොමුවනු ඇත. මීට අමතරව, රජයේ බොහෝ අවධානයක් හිමිවන සමාජ - ආර්ථික අංශයන් අතර, කෘෂිකර්මාන්තය (ගොවිතැන, වතු වගාව, ධීවර අංශය වැනි), උසස් අධ්‍යාපනය, ශ්‍රම වෙළඳපල වැනි අංශ විශේෂත්වයෙහිලා සැලකෙනු ඇත.

## 1.3 මතුවිය හැකි අවධානම් තත්ත්වයන්, අභියෝගයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන්

මැතකාලීනව, ගෝලීය මූල්‍ය වෙළඳපල සහ භාණ්ඩ වෙළඳපල මෙන්ම දේශීය ආර්ථිකය තුළ දක්නට ලැබෙන විචල්‍ය තත්ත්වයන් හමුවේ රජයේ මූල්‍ය ස්ථාවරභාවය වඩාත් ශක්තිමත් කිරීමේ ප්‍රයත්නයන් සඳහා යම් අභියෝගයන් උද්ගත විය හැකිය. එහිදී මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය තුළ පහත සඳහන් ක්‍රියාමාර්ගයන් ඉතා වැදගත් වනු ඇත.

### (i) රාජ්‍ය ආදායම තවදුරටත් වර්ධනය කිරීම

මේ දක්වා ක්‍රියාත්මක කර ඇති රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග මත පදනම්ව රජය විසින් තවදුරටත් ආදායම වර්ධනය කිරීම සිදු කරනු ඇත. එවැනි ප්‍රධාන ක්‍රියාමාර්ගයන් වශයෙන් 2018 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක කෙරුණු නව දේශීය ආදායම් පනත, ව්‍යාපාර සඳහා ලබාදුන් බදු නිදහස් කිරීම් අවම කිරීම, 2016 වසරේ සිට ක්‍රියාත්මක වූ එකතු කළ අගය මත බදු අනුපාතය ඉහළ දැමීම, එකතු කළ අගය මත බදු පදනම පුළුල් කිරීම සහ බදු පරිපාලනයේ ඇති කළ වැඩිදියුණු කිරීම් ආදිය හැඳින්විය හැකිය. එමඟින් රටෙහි බදු පද්ධතිය වඩාත් ස්ථාවර, පූර්වයෙන් නිශ්චය කළ හැකි, සාධාරණ සහ විනිවිදභාවයකින් යුතු වීම යනා දී ලක්ෂණයන්ගෙන් සමන්විත බවට රජය විසින් තහවුරු කරනු ඇත.

#### සෘජු බදුකරණය

නව දේශීය ආදායම් පනතේ අපේක්ෂිත ප්‍රතිලාභ 2019 වසරේ සිට ළඟා වීමත් සමග ශ්‍රී ලංකාවේ සෘජු බදුකරණ අංශයේ සැලකියයුතු වර්ධනයක් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට පෙර පැවැති සෘජු බදුකරණ පද්ධතියේ දක්නට ලැබුණු පිරිවැය අධික බදු නිදහස් කිරීම් සහ බදු සහනයන් අවම කරමින් නව දේශීය ආදායම් පනත මඟින් ඉතා සරල සහ සැමට සාධාරණ සහ කාර්යක්ෂම බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කර ඇත. එබැවින්, නව දේශීය ආදායම් පනත මඟින් බදු පදනම පුළුල් කර ඇති අතර, එහිදී පූර්ණ සහ අර්ධ බදු නිදහස් කිරීම් සහ බදු සහනයන් ඉවත් කිරීම මෙන්ම, සංස්ථාපිත ආදායම් බදු ස්ථර තුනක් යටතේ සරල කිරීම, ප්‍රාග්ධන ලාභ සඳහා බදු හඳුන්වා දීම, රඳවා ගැනීමේ බදු සඳහා අවකාශය පුළුල් කිරීම ආදිය ද ඇතුළත් වේ.

ඉදිරියේ දී බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමුකර ඇති අතර, ඒ සඳහා සේවා දායකයින්ගේ සහ වෘත්තිකයින් සඳහා කළ ගෙවීම් වලට අදාළව සේවා යෝජකයින් විසින් රඳවා ගැනීමේ බදු මත වන වගකීමට අදාළ විගණනයන් වඩා ව්‍යාප්තව සිදු කිරීම ආදී ක්‍රියාමාර්ග ගනු ලබයි. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත අවදානම් කළමනාකරණ අංශය (Risk Management Unit) සහ විශේෂ විගණන අංශය (Dedicated Audit Unit) මඟින් තොරතුරු විශ්ලේෂණය කරමින් බදු අනුකූලතාවයට අදාළ මූලික අවදානම් ක්ෂේත්‍රයන් හඳුනාගැනීම සහ එවැනි ඉහළ අවදානම් ක්ෂේත්‍රයන් ආශ්‍රිතව අනුකූලතා විගණනයන් සිදුකිරීම ඉදිරියේ දී වඩා පුළුල් අයුරින් සිදුවේ. මෙවැනි කාර්යයන් සඳහා ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ඉතා සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් සැලකියයුතු සහායක් ලැබෙනු ඇත. එසේ නව ආදායම් බදු ක්‍රමවේදය මඟින් මැදිකාලීන වශයෙන් සැලකියයුතු ආදායම් මට්ටමක් ළඟාකර ගනු ඇතැයි රජය විසින් අපේක්ෂා කරන අතර, එමඟින් සමාජ සහ සංවර්ධන අවශ්‍යතාවන් සඳහා තවදුරටත් ඉහළ සම්පත් සම්පාදනයක් සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

#### වක්‍ර බදුකරණය

එකතු කළ අගය මත බදු අනුපාතය 2016 වසරේ සිට ක්‍රියාත්මක වූ පරිදි සියයට 11.0 සිට සියයට 15.0 දක්වා ඉහළ යෑම සහ එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම මඟින් වක්‍ර බදු ආදායමේ සැලකියයුතු වර්ධනයක් දක්නට ලැබේ. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන එකතු කළ අගය මත බදු අනුකූලතා ක්‍රමෝපාය හා සම්බන්ධිත අවදානම් මත පදනම් වූ විගණනයන් තුළින් ද බදු අනුකූලතාවය ඉහළ ගොස් වක්‍ර බදු ආදායම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම ක්‍රමෝපාය ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා දැනටමත් හඳුන්වා දී ඇති අතර බැංකු, නිවාස සහ හෝටල් ඇතුළත් මහා පරිමාණ බදු ගෙවන්නන් සඳහා ද ඉදිරියේ දී අනුගත කෙරෙනු ඇත. එමෙන්ම, ශ්‍රී

ලංකා රේගුවට අදාළ ආදායම් පරිපාලනය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වා දෙමින් සිටින අතර, ඉන් ප්‍රධාන වශයෙන්ම පරික්ෂා කිරීම් හා පාලනයන් වැඩිදියුණු කිරීම, බුද්ධි තොරතුරු සම්පාදනය ශක්තිමත් කිරීම සහ අවදානම් තක්සේරුකරණය සඳහා අවශ්‍ය මානව සහ භෞතික හැකියා මට්ටම ඉහළ නැංවීම ආදිය ප්‍රධාන වේ. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව විසින් පෙර පැවති භෞතික පරික්ෂා කිරීම් ක්‍රමවේදය වෙනුවට අවදානම මත පාදක වූ විගණනයන් ක්‍රියාත්මක කරනු ලබන අතර, ඒ සඳහා අවදානම් කළමනාකරණය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම මෙන්ම සංවිධානාත්මක ව්‍යුහයේ වැඩිදියුණු වීම් ද උපකාරී වේ.

### (ii) රාජ්‍ය වියදම් හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

රජය විසින් වියදම් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව ක්‍රියා කරන අතර එමඟින් රජයේ ආදායම් ඉහළ නැංවීමේ ප්‍රයත්නයන් සමඟ ද මනාව සැසඳෙනු ඇත. සමස්ත මූල්‍ය ප්‍රතිපාදන රාමුව තුළ සමාජ සහ රාජ්‍ය ආයෝජන අංශයන් සඳහා ප්‍රමාණවත් අරමුදල් සම්පාදනයක් තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන අතර, එමඟින් මැදිකාලීන ආර්ථික වර්ධන හැකියාව ඉතා ශක්තිමත්ව සහ පුළුල්ව ව්‍යාප්ත වන අයුරින් පවත්වාගෙන යැමට හැකියාව ලැබෙනු ඇත. මෑතක දී ස්ථාපිත කළ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය (Welfare Benefit Board) මඟින් වඩා ඉලක්කගත අයුරින් සමාජ ආරක්ෂණ වැඩසටහන් ඉදිරියටත් ක්‍රියාත්මක වන බවට රජය විසින් සහතික කරනු ලබයි. අවිනිශ්චිත අයවැයකරණය (Contingent Budgeting) වැනි අංගයන් ක්‍රියාත්මක කිරීමෙන් සහ ස්වභාවික විපත් සඳහා වන රක්ෂණ ආවරණය තවදුරටත් පුළුල් කිරීම ආදිය තුළින් ස්වාභාවික විපත් හා අදාළ වන රාජ්‍ය මූල්‍ය පිරිවැය මනාව අයවැයගත කිරීම සඳහා වැඩි අවධානයක් යොමුව ඇත. වර්තන වියදම් යථාර්ථකරණය සහ සමස්ත රාජ්‍ය වියදමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම තුළින් මැදිකාලීන වශයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා සහායක් සැලසෙනු ඇත. තවද, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමත් සමඟම රාජ්‍ය ආයතන විසින් සිදු කරන වියදම් සඳහා වන බැදීම් මනාව පාලනය කිරීමත්, අයවැය පිළියෙල කිරීම සහ භාණ්ඩාගාර මූල්‍ය පාලන හා මෙහෙයුම් කටයුතු යන අංශයන් හි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ශක්‍යතාවයන් වඩා වර්ධනය කිරීමටත් හැකියාව ලැබෙනු ඇත.

### (iii) රාජ්‍ය අංශය සතු ව්‍යාපාර ශක්තිමත් කිරීම

ගෝලීය සහ දේශීය වශයෙන් සිදුවන ආර්ථික විචලනයන් හමුවේ ඉස්මතු වන අභියෝගයන් සඳහා මුහුණ දීමට රාජ්‍ය අංශ සතු ව්‍යාපාර ආයතනයන් හි හැකියාව පිළිබිඹු කරමින්, එම ආයතනයන් හි මූල්‍ය තත්ත්වයට අදාල තොරතුරු මනාව අනාවරණය කිරීම සඳහා රජය විසින් ඉදිරියේ දී කටයුතු කරනු ඇත. විශේෂයෙන්ම, සාමූහික අභිලාෂ ප්‍රකාශයේ (Statement of Corporate Intent - SCI) දක්වා ඇති ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් ඇති කරනු ලබන අතර, මේ දක්වා ප්‍රධාන ආයතන පහක් එසේ සාමූහික අභිලාෂ ප්‍රකාශයන් අත්සන් කර ක්‍රියාත්මක කරමින් පවතින අතර තවත් එවැනි ආයතන දහයක් සමඟ ඉදිරියේ දී එසේ කටයුතු කිරීමට නියමිතව ඇත.

මේ අතර, ඛණිජ තෙල් නිෂ්පාදනය කරන රටවල් සහ ඊට අදාල කලාපීය හු දේශපාලනික තත්ත්වයන් හේතුවෙන් ජාත්‍යන්තර ඛණිජ තෙල් මිල ඉහළ යාමේ ප්‍රවණතාවක් මෑතක දී දක්නට ලැබිණි. ගෝලීය ඛණිජ තෙල් මිලට අදාල පුරෝකථනයන් සලකා බැලීමේ දී, ශ්‍රී ලංකාව දැනට භාවිතා කරන ඛණිජ තෙල් මිල තීරණය කිරීමේ යාන්ත්‍රණය අනුව දේශීය ඛනිජ තෙල් මිලෙහි යම් සංශෝධනයන් සිදුවිය හැකිය. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ නිෂ්පාදන පිරිවැය ආවරණය කර ගැනීම සඳහා එවැනි මිල සංශෝධනයන් අවශ්‍යවන අතර, ජනතාවට වන පීඩනය අවම කිරීම සඳහා ඛණිජ තෙල් මිල නිෂ්පාදන පිරිවැය ආවරණය නොවන මට්ටමක පැවතියහොත්, රජය විසින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභ පිරිමසා ගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමට සිදු වනු ඇත. එසේම, විදුලිබල නිෂ්පාදන පිරිවැය හා අනුරූපීව ඒ සඳහා අයකරන ගාස්තු සංශෝධනය නොවන්නේ නම් ඒ සඳහා ද රජය විසින් මූල්‍ය පහසුකම් සැපයීමට සිදුවනු ඇත.

### (iv) මැදිකාලීන රාජ්‍ය ණය කළමනාකරණ ක්‍රමෝපාය ශක්තිමත් කිරීම

ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථිකය ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වන පසුබිමක් තුළ එරටෙහි ප්‍රතිපත්ති පොළී අනුපාතික ඉහළ යැමේ ප්‍රවණතාව 2019 සහ 2020 වසර වල දී ද

දක්නට ලැබෙනු ඇත. එවැනි පසුබිමක දී ගෝලීය මූල්‍ය වෙළඳපල පොළී අනුපාතික නිතැතින්ම ඉහළ යැමක් සිදුවනු ඇත. 2019 වසරේ සහ ඉක්බිති තෙවර්ෂයට අදාළ ශ්‍රී ලංකාවේ ණය සේවාකරණ අවශ්‍යතාවයන් සලකා බැලීමේ දී ගෝලීය මූල්‍ය වෙළඳපලේ පොළී අනුපාතික ඉහළ යෑම රාජ්‍ය ණය කළමනාකරණය කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත. මෙම තත්ත්වය තුළ රාජ්‍ය ණය ආපසු ගෙවීම් හා ඊට අදාළ වන මූල්‍යයනය කටයුතු සාර්ථකව සිදු කිරීම පහසුකරලීම සඳහා මැදිකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව වඩාත් ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග රාශියක් ගනිමින් පවතී. මෑතකදී නීතිගත කෙරුණු සක්‍රීය වගකීම් කළමනාකරණ පනත මඟින් රාජ්‍ය ණය සේවාකරණ අවශ්‍යතාවයන්ගෙන් යම් ප්‍රමාණයක් සම්පූර්ණ කිරීමට අවස්ථාවක් සැලසෙන අතර, එහිදී රාජ්‍ය ණය වගකීම් වල ප්‍රතිමූල්‍යයනය අවදානම් අවම කිරීම මෙන්ම රාජ්‍ය ණය කල්පිරෙන සීමාව දීර්ඝ කිරීම සඳහා ද අවස්ථාව හිමිවනු ඇත. මෙලෙස රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන් පහසුකරවීම සඳහා රජය විසින් මැදිකාලීන රාජ්‍ය ණය කළමනාකරණ ක්‍රමෝපාය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් සිටී. එහි මූලික පරමාර්ථයක් ලෙස රාජ්‍ය අංශයේ විදේශ ණය ප්‍රමාණය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනිමට කටයුතු කිරීම දැක්විය හැකිය. මෙම ණය කළමනාකරණ ක්‍රමෝපාය මඟින් රාජ්‍ය ණයබරතාවයට අදාලව ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් කල්තියා හඳුනා ගැනීම සහ ඒ අනුව ඉදිරියේ දී රාජ්‍ය ණය නිකුතුවන්ට අදාළ ව්‍යවහාර මුදල් ඒකක සහ කල්පිරීම් සංයුතිය යනාදිය නිර්ණය කිරීම පහසු කෙරෙනු ඇත. ඒ අනුව, ඉදිරියේ දී රජය විසින් ණය ලබාගැනීම් වාර්ෂික රාජ්‍ය ණය ගැනීම් සැලැස්මකට අනුව සිදු කෙරෙනු ලබන අතර එමඟින් රාජ්‍ය ණයබරතාවය විචක්ෂණ මට්ටමකට ගෙන ඒමට රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට මනා සහායක් ලැබෙනු ඇත.

රාජ්‍ය ණය කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ස්වාධීන රාජ්‍ය ණය කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු රජය විසින් අරඹනු ලැබ ඇත. එම ඒකකය ස්ථාපිත කිරීමෙන් පසුව, මැදිකාලීන රාජ්‍ය ණය කළමනාකරණ ක්‍රමෝපායට අනුරූප වන පරිදි රාජ්‍ය ණය නිකුත් කිරීම සහ ඊට අදාල ද්විතීය වෙළඳපල කටයුතු ආදී සියලු දේ එමඟින් ක්‍රියාත්මක කෙරෙනු ඇත. තවද, රජය විසින් ලබාදෙන ඇපවීම් වල මුළු එකතුව නියමිත මට්ටම නොඉක්මවන සේ පවත්වා ගනිමින් ඊට අදාළ අවිනිශ්චිත වගකීම් පාලනය කිරීමට රජය විසින් කටයුතු කරනු ලබයි.

## 1.4 මැදිකාලීන රාජ්‍ය මූල්‍ය අරමුණු

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ දක්වා ඇති පරිදි මැදිකාලීන රාජ්‍ය මූල්‍ය අරමුණු සහ සමස්ත රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන්, වගකීම් සහිත මූල්‍ය කළමනාකරණ මූලධර්මයන්ට අනුකූල වේ. මැදිකාලීන රාජ්‍ය මූල්‍ය අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය විසින් මනා කැපවීමකින් යුතුව රාජ්‍ය මූල්‍ය රීතීන් තවදුරටත් ශක්තිමත් කිරීමට ඉදිරියේ දී ක්‍රියාකරනු ලබයි. විශේෂයෙන්ම අයවැය පරතරය ද.දේ. නිෂ්පාදිතයෙන් සියයට පහට වඩා අවම මට්ටමක පවත්වා ගැනීම මෙන්ම රාජ්‍ය ණය මට්ටම මනා පාලනයකින් යුතුව පවත්වාගෙන යාම ඉන් තහවුරු කෙරෙනු ඇත. එම අරමුණු ළඟාකර ගැනීම පහසුකරවීම සඳහා 2019 වසර සහ ඉන් ඉදිරි වසර වලට අදාළ ඉලක්කගත ප්‍රාථමික ගිණුමේ අතිරික්තය තහවුරු කිරීමට අවශ්‍ය පියවරයන් රජය විසින් ගනු ලබයි. එනම් 2019 වසර සඳහා ප්‍රාථමික ශේෂයේ අතිරික්තය රුපියල් බිලියන 147 ක් (ද.දේ. නිෂ්පාදිතයෙන් සියයට 0.9 ක්) වන අතර, ඒ සඳහා රාජ්‍ය ආදායමේ ඇස්තමේන්තුගත ද.දේ. නිෂ්පාදිතයෙන් ප්‍රතිශතාංක 1.3 ක වර්ධනය මෙන්ම, පොළී නොවන වර්තන වියදම් ද.දේ. නිෂ්පාදිතයෙන් සියයට 8.7 ක මට්ටමක පවත්වා ගැනීම සහ සමාජයීය හා ඵලදායී රාජ්‍ය ආයෝජන සඳහා වියදම් අවශ්‍ය ආකාරයෙන් පවත්වා ගෙන යෑම සඳහා උපකාරී වනු ඇත. ඒ අනුව, 2021 වසර සහ ඉන් ඔබ්බට සමස්ත අයවැය පරතරය ද.දේ. නිෂ්පාදිතයෙන් සියයට 3.5 ක මට්ටමකින් පවත්වා ගැනීමට හැකියාව ලැබෙන අතර, එමඟින් රාජ්‍ය ණයබරතාවය අධික ලෙස ඉහළ යෑම වැලකෙනු ඇත.

2018 වසරේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ දැක්වූ රාජ්‍ය මූල්‍ය ස්ථාවරභාවය ශක්තිමත් කිරීමේ ඉලක්කයන් සමඟ මෙම වත්මන් ප්‍රකාශයේ ඉලක්කයන් බොහෝ සෙයින් සැසඳෙන අතර, යම් ඇස්තමේන්තුගත අගයන්ගේ සුළු අපගමණයන් දක්නට ලැබේ. එම අපගමණයන් සඳහා මූලික වශයෙන් හේතු වූයේ නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීම ප්‍රමාද වීමත් හා දේශීය ආර්ථික කටයුතු තරමක මන්දගාමී වීමත් නිසා ඇස්තමේන්තුගත රාජ්‍ය ආදායම් මට්ටම කරා ළඟාවීමට නොහැකි වීමයි. තවද, ස්වභාවික උවදුරු නිසා රාජ්‍ය වියදම් කෙරෙහි ඇති කළ අඛණ්ඩ බලපෑම ද යම්තාක් දුරට ඊට හේතු විය.

## 1.5 මැදිකාලීන සාර්ව ආර්ථික උපකල්පන

මෑත වසර වල ආර්ථිකයේ දිස් වූ යම් මන්දගාමී ස්වභාවය ක්‍රමයෙන් තුරන් වී ඉහළ ආර්ථික විභවතාවක් කෙරෙහි මැදිකාලීන වශයෙන් යොමුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2019 වසරේ දී ආර්ථික වර්ධනය සියයට 3.5 - 4.5 ත් අතර අගයක් ගනු ඇතැයි අපේක්ෂා කරන අතර එම අගය 2022 වසරේ දී සියයට 5.0 ක මට්ටමක් දක්වා ඉහළ යනු ඇත. එවැනි ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා රජයේ ග්‍රාමීය සහ නාගරික අංශයේ සංවර්ධන වැඩපිළිවෙළ සහ ආර්ථිකමය වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන් හි සිදු කෙරෙන යටිතල පහසුකම් සංවර්ධනය බෙහෙවින් ඉවහල් වන අතර එහිදී පුද්ගලික අංශයේ සහභාගීත්වය ද අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, සේවා වියුක්ති අනුපාතය සියයට 4.0 වැනි මට්ටමක ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කරන අතර ඒ සඳහා අපනයන ක්ෂේත්‍රයට උපකාරී වන කර්මාන්ත හා සේවා අංශයන්ගේ වර්ධනය බෙහෙවින් දායක වනු ඇත. තවද, කාන්තා අංශයේ ශ්‍රම වෙළඳපල සහභාගීත්වය ඉහළ නැංවීමට රජය විසින් ක්‍රියාත්මක කරන විවිධ වැඩසටහන් ඔස්සේ ද ආර්ථිකයේ නිෂ්පාදන කටයුතු පුළුල් වනු ඇත.

විදේශීය අංශයේ වෙළඳ හිඟය ක්‍රමිකව අවම වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ සඳහා වර්ධනය වෙමින් පවතින අපනයන අංශය උපකාරී වන අතර, ජාත්‍යන්තර වශයෙන් ඉහළ යමින් පවතින භාණ්ඩ මිල ගණන් සහ තීරු බදු ලිහිල්කරණයන් නිසා ඉහළ යා හැකි ආනයන වියදම යම් අහිතකර තත්ත්වයන් ඇතිකරනු ලැබිය හැකිය. කෙසේ වුවද, සංචාරක සහ තොරතුරු තාක්ෂණය වැනි සේවා අපනයන අංශයන්ගේ සහ විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණයන් තුළින් විදේශ විනිමය ප්‍රවාහයන් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් විදේශීය ජංගම ගිණුමේ හිඟය 2022 වසරේ දී ද.දේ. නිෂ්පාදිතයෙන් සියයට 1.5 ක මට්ටමකට පමණ පහළ හෙළීමට හැකිවනු ඇත. මේ අතර රජය විසින් යෝජිත ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (වරාය නගර ව්‍යාපෘතිය ආශ්‍රිතව) වැනි වැඩසටහන් සඳහා විශාල වශයෙන් ඍජු විදේශ ආයෝජන ලැබීමත් සමග විදේශ මූල්‍ය ප්‍රවාහ ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, රජය විසින් ක්‍රියාත්මක කරන ආයෝජන ව්‍යාපෘති සහ වාණිජමය ණය ගැනීම් හා අදාලව විදේශ විනිමය ලැබීම් ශක්තිමත් වන අතර ඉන් කොටසක් රජයේ විදේශ ණය සේවාකරණය සඳහා යොදා ගැනිමට හැකියාව ලැබෙනු ඇත. මූල්‍ය ගිණුම වෙත ලැබෙන එවැනි විදේශ විනිමය ප්‍රවාහයන් තුළින් විදේශ සංචිත ප්‍රමාණය තවදුරටත් ශක්තිමත් වන අතර එමගින් රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රවණතාව අවම වනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන උද්ධමනය පාලනය කිරීමේ ක්‍රමවේදය තුළින් උද්ධමන අපේක්ෂාවන් අවම වීම හේතුවෙන් පාරිභෝගික මිල උද්ධමනය මැදිකාලීන වශයෙන් මධ්‍ය තනි අගයක ස්ථාපිත වන බවට අපේක්ෂා කෙරේ. මූල්‍යමය වෙළඳපල තත්ත්වයන් මගින් ආර්ථිකයට අවශ්‍ය ණය අරමුදල් සම්පාදනයේ ප්‍රමාණවත්භාවය තහවුරු කෙරෙන අතර එමගින් මැදිකාලීන වශයෙන් ආර්ථික වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපකාරී වනු ඇත.

# 11 කොටස

## අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2019

### 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9 වගන්ති යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9 වගන්ති අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය කටයුතු ඇගයීම සඳහා අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කළ යුතු අතර එය විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවනවර කියවන දිනයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වන අතර ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන් සහ ගෙවුම් ශේෂය සඳහා අදාළ වන ඇස්තමේන්තු සහ ආදායම් සහ වියදම් ඇස්තමේන්තු කිරීම සඳහා පදනම් වූ උපකල්පන ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

ඒ අනුව, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ රජයේ ආදායම, වියදම සහ ණය ගැනීම පිළිබඳ තාවකාලික දත්ත මෙම වාර්තාවේ ඇතුළත් වේ. මෙම රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් සිදු කරනු ලැබ ඇති සමස්ත ආර්ථික තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකි වන පරිදි මෙම කාලපරිච්ඡේදයට අදාළ ප්‍රධාන සාර්ව ආර්ථික උපනතීන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2019 වසර සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී පදනම් කරගත් ආර්ථික සහ අනෙකුත් උපකල්පන පිළිබඳ තොරතුරු, මෙම උපකල්පන වලට අදාළ විය හැකි අවදානම් සාධක සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අනෙකුත් තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# 01

# රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

## 1.1 සමාලෝචනය

2018 වසරේ රජයේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම සමඟින් රාජ්‍ය වියදම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම දෙසට යොමු වී ඇත. ඒ අනුව, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 1,657 ක් ලෙස පැවති සමස්ත රජයේ ආදායම 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 1,770 ක් දක්වා සියයට 6.8 කින් වර්ධනය වී ඇත. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී සමස්ත බදු ආදායම රු. බිලියන 1,587 ක් දක්වා සියයට 3.9 කින් ද බදු නොවන ආදායම රු. බිලියන 183 ක් දක්වා සියයට 40.9 කින් ද, සුවිශේෂී ලෙස ඉහළ ගොස් ඇති අතර මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකු ලාභ පැවරීම සහ විකුණුම් හා ගාස්තු ආදායම වැඩිවීම හේතු විය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය ණය සේවාකරණ වියදම් රු. බිලියන 1,195 ක් දක්වා ඉහළ යාම, පොළී ගෙවීම් රු. බිලියන 809 ක් සහ රාජ්‍ය සේවකයින්ගේ වැටුප් ගෙවීම් රු. බිලියන 578 ක් දක්වා වැඩිවීම පිළිබිඹු කරමින් රජයේ සමස්ත වියදම සහ ශුද්ධ ණයදීම් රු. බිලියන 2,500 ක් දක්වා සියයට 9.0 කින් වැඩි වී ඇත. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී පුනරාවර්තන වියදම රු. බිලියන 1,951 ක් දක්වා සියයට 12.0 කින් වැඩි වී ඇති අතර ප්‍රාග්ධන වියදමෙහි සුළු අඩුවීමක් දක්නට ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 634 ක් ව පැවති සමස්ත අයවැය හිඟය 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 722 ක් විය.

**1.1 වගුව | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය**

*රු. මිලි.*

| අයිතමය | ජන. - නොවැ. 2017 | ජන. - නොවැ. 2018(අ) |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **1,659,532** | **1,777,895** |
| **ආදායම** | **1,656,845** | **1,770,232** |
| බදු | 1,527,154 | 1,587,458 |
| බදු නොවන | 129,691 | 182,774 |
| ප්‍රදාන | 2,687 | 7,664 |
| **වියදම** | **2,293,192** | **2,499,550** |
| **වර්තන වියදම** | **1,741,956** | **1,951,044** |
| වැටුප් | 541,499 | 577,946 |
| පොළී ගෙවීම් | 672,459 | 809,258 |
| අනෙකුත් | 527,998 | 563,841 |
| රාජ්‍ය ආයෝජන | 561,419 | 568,789 |
| අනෙකුත් | (10,183) | (20,283) |
| **ආදායම් හිඟය(-)/අතිරික්තය(+)** | **(85,111)** | **180,812** |
| **සමස්ත අයවැය හිඟය(-)/අතිරික්තය(+)** | **(633,660)** | **(721,655)** |
| **මූල්‍යයනය** | **633,660** | **721,655** |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | 346,089 | 416,200 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 287,571 | 305,455 |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රජය විසින් ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලද අතර බදු සංශෝධනය කිරීම, බදු නිදහස් කිරීම හා බදු සහන තාර්කීකරණය කිරීම, බදු පදනම පුළුල් කිරීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රේගුව යනා දී බදු රැස් කරන ආයතනයන් හි බදු පරිපාලනය ශක්තිමත් කිරීම ඒ අතර ප්‍රධාන විය. ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත 2018 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වීමත් සමග සෘජු බදු ආදායම ඉහළ නංවා ගැනීම තවදුරටත් පුළුල් විය. සංස්ථාපිත ආදායම් බදු සඳහා බදු අනුපාත තුනකින් යුතු බදු ව්‍යුහයක් (14%, 28% සහ 40%) හඳුන්වා දෙන ලදී. පුද්ගල ආදායම් බදු ස්ථරයන් රු. 500,000 සිට රු. 600,000 දක්වා පුළුල් කළ අතර සියයට 16.0 ක් ව පැවති ඉහළම ආන්තික බදු අනුපාතය සියයට 24.0 ක් දක්වා ඉහළ දමන ලදී.

රෝහල් කාමර ගාස්තු හැර පෞද්ගලික වෛද්‍ය සේවා සැපයුම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කර ඇති අතර සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම තුළින් භාණ්ඩ වෙළඳාමෙ හි ආදායම වර්ධනය කර ගැනීමට එකතු කළ අගය මත බදු ප්‍රතිපූරණය කිරීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෝටර් රථ ආනයනය කිරීමේ දී ආර්ථික සේවා ගාස්තු අයකිරීමේ පදනම ලෙස ගෙවිය යුතු නිෂ්පාදන බද්ද ලෙස සැලකීම ස්ථාපිත කිරීම සහ උපලබ්ධි නොවූ මහ බැංකු විනිමය ඉපැයුම්, ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කිරීම සඳහා ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධන කරන ලදී. තවද, 2017 වසරේ අගෝස්තු මස 01 වන දිනට පෙර කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් සේවා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කර ඇත. මේ අතර, ඉඩම් පනත යටතේ විදේශිකයන් සඳහා පනවා තිබූ සීමාවන් ඉවත් කරන ලදී. නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ මි.මී. 72 සහ මි.මී. 84 ට වඩා දිග ප්‍රමාණයකින් යුතු දුම්වැටි සඳහා පනවා තිබූ නිෂ්පාදන බදු, දුම්වැටි පරිභෝජනය අධෛර්යමත් කිරීමේ අරමුණින් 2018 වසරේ අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ නංවන ලදී. එසේම, එන්ජින් ධාරිතාවය 1,000 ට අඩු මෝටර් රථ මත පනවා ඇති නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු 2018 වසරේ අගෝස්තු මස සිට ඉහළ නංවා ඇත. අධිතාක්ෂණික යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මත පනවා තිබූ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු අනුපාතය සියයට 7.5 සිට සියයට 2.5 ක් වූ අනුග්‍රාහක මට්ටම දක්වා අඩු කරන ලදී. රත්‍රන් ආනයනය මත පනවා තිබූ ශුන්‍ය තීරු බද්ද සියයට 15.0 දක්වා වැඩි කරන ලදී. දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පිරිවැය පිළිබිඹු වන මිලක් හඳුන්වා දීමට රජය විසින් ඉන්ධන මිල සූත්‍රයක් හඳුන්වා දෙන ලදී.

දේශීය පරිභෝජන මත පදනම් වී ඇති එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ නිෂ්පාදන බද්ද ඇතුළත් වූ බදු ආදායමේ වර්ධනයක් පෙන්නුම් කරමින් 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ රු. බිලියන 475 ක් වූ බදු ආදායම 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 497 ක් දක්වා සියයට 4.6 කින් වර්ධනය විය. මේ අතර, ආනයන මත පදනම් වූ බදු ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ රු. බිලියන 751 කට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 753 ක් දක්වා සියයට 0.2 කින් වැඩි වුවද, රේගු ආනයන බදු ආදායම සහ සෙස් බදු ආදායම පිළිවෙලින් සියයට 28.6 කින් සහ සියයට 10.6 කින් අඩු වී ඇත.

සංස්ථාපිත බදු, පුද්ගල ආදායම් බදු, උපයන විට ගෙවීම් බදු සහ ආර්ථික සේවා ගාස්තු ආදායම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 260 ක් ව පැවති සෘජු බදු ආදායම 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 298 ක් දක්වා සියයට 14.5 කින් ඉහළ ගොස් ඇත.

දේශීය මෙන්ම විදේශීය ව පවත්නා අභියෝගාත්මක වාතාවරණය හමුවේ රජය විසින් රාජ්‍ය මූල්‍ය හිඟය විචක්ෂණශීලී මට්ටමකට පවත්වා ගෙන ගොස් ඇත. මෙම සන්දර්භය තුළ, රජය විසින් වියදම් කළමනාකරණයේ දී රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කරගනිමින් විවිධ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් අනුගමනය කිරීම මගින් රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා රජයේ වූ කැපවීම මනාව පිළිඹිබු කර ඇත.

**1.2 වගුව | ඇස්තමේන්තුගත තත්‍ය ආදායම සහ වියදම - 2018**

*රු. බිලි.*

| අයිතමය | ජන. - නොවැ. | | වෙනස |
|---|---|---|---|
| | ඇස්තමේන්තු | තත්‍ය[අ] | |
| **මුළු ආදායම** | **2,015** | **1,771** | **(244)** |
| **බදු ආදායම** | **1,859** | **1,588** | **(271)** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | | |
| ආදායම් සහ ලාභ මත බදු | 344 | 287 | (57) |
| එකතු කළ අගය මත බදු - දේශීය (ශුද්ධ) | 307 | 262 | (45) |
| ජාතිය ගොඩනැඟීමේ බදු (දේශීය) | 56 | 46 | (10) |
| අනෙකුත් | 17 | 8 | (9) |
| **උප එකතුව** | **724** | **603** | **(121)** |
| **ශ්‍රී ලංකා රේගුව** | | | |
| ආනයන බදු | 158 | 89 | (69) |
| එකතු කළ අග මත බදු - ආනයන (ශුද්ධ) | 188 | 161 | (27) |
| ජාතිය ගොඩනැඟීමේ බදු - (ආනයන) | 22 | 18 | (4) |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 105 | 104 | (1) |
| සෙස් බදු | 45 | 49 | 4 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහ අනෙකුත් | 72 | 69 | (3) |
| ආර්ථික සේවා ගාස්තු | 1 | 3 | 2 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 373 | 348 | (25) |
| දුම්වැටි | 83 | 85 | 2 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 72 | 62 | (10) |
| මෝටර් රථ සහ අනෙකුත් | 218 | 201 | (17) |
| **උප එකතුව** | **964** | **841** | **(123)** |
| **ශ්‍රී ලංකා සුරා බදු දෙපාර්තමේන්තුව** | | | |
| මත්පැන්/දුම්කොළ | 115 | 104 | (11) |
| **උප එකතුව** | **115** | **104** | **(11)** |
| **අනෙකුත්** | | | |
| විදුලි සංදේශ බද්ද | 28 | 27 | (1) |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 19 | 13 | (6) |
| **උප එකතුව** | **47** | **40** | **(7)** |
| **බදු නොවන ආදායම** | **156** | **183** | **27** |
| **මුළු වියදම** | **2,661** | **2,500** | **161** |
| **වර්තන වියදම්** | **1,973** | **1,951** | **22** |
| වැටුප් සහ වේතන | 579 | 578 | 1 |
| පොළී ගෙවීම් | 812 | 809 | 3 |
| විශ්‍රාම වැටුප් ගෙවීම් | 183 | 178 | 5 |
| රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම් | 89 | 85 | 4 |
| අනෙකුත් | 310 | 301 | 9 |
| **ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය** | **688** | **549** | **139** |

*මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

## 1.2 රජයේ ආදායම

රජයේ' 2025 දැක්ම' ප්‍රතිපත්ති රාමුවට අනුගත වෙමින් වක්‍ර බදු වෙනුවට සෘජු බදු මගින් රජයේ බදු ආදායම ඉහළ නැංවීම සඳහා විවිධ ආදායම් උපාය මාර්ග ස්ථාපිත කර ඇති අතර සෘජු බදු සහ වක්‍ර බදු කාර්යසාධනය පහත දක්වා ඇත.

**රූප සටහන 1.1 | මුළු ආදායම් සංයුතිය 2018 ජන. - නොවැ.**




**රූප සටහන 1.2 | මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම 2018 ජන. - නොවැ.**




**1.3 වගුව | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සංක්ෂිප්තය**

*රු. මිලි.*

| අයිතමය | ජන. - නොවැ. 2017 | ජන. - නොවැ. 2018(අ) | වෙනස (%) |
|---|---|---|---|
| **බදු ආදායම** | **1,527,154** | **1,587,458** | **3.9** |
| **ආදායම් බදු** | **260,173** | **297,843** | **14.5** |
| **දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු** | **475,409** | **497,114** | **4.6** |
| එකතු කළ අගය මත බදු | 248,494 | 261,788 | 5.3 |
| නිෂ්පාදන බදු | 182,415 | 189,216 | 3.7 |
| ජාතිය ගොඩනැඟීමේ බදු | 44,500 | 46,110 | 3.6 |
| **ආනයන මත පදනම් වූ බදු** | **751,358** | **752,827** | **0.2** |
| රේගු ආනයන බදු | 125,122 | 89,392 | (28.6) |
| එකතු කළ අගය මත බදු | 150,554 | 161,157 | 7.0 |
| ජාතිය ගොඩනැඟීමේ බදු | 17,322 | 18,201 | 5.1 |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 92,574 | 103,848 | 12.2 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 65,988 | 68,851 | 4.3 |
| නිෂ්පාදන බදු | 245,442 | 262,851 | 10.7 |
| සෙස් බදු | 54,356 | 48,527 | (10.6) |
| **බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්** | **40,214** | **39,673** | **(1.3)** |
| **බදු නොවන ආදායම** | **129,691** | **182,774** | **40.9** |
| **මුළු ආදායම** | **1,656,844** | **1,770,232** | **6.8** |

*මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### ආදායම් බදු

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ආදායම් බදු මගින් උපයන ලද බදු ආදායම සමස්ත බදු ආදායමින් සියයට 14.5 කි. එහිදී, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී පිළිවෙළින් සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු, ආර්ථික සේවා ගාස්තු සහ උපයන විට ගෙවීම් බදු ආදායම් පිළිවෙළින් සියයට 20.4 ක්, සියයට 19.0 ක් සහ සියයට 26.6 ක් ලෙසට වර්ධනය වී ඇත.

**1.4 වගුව | ආදායම් බදු කාර්යසාධනය**

*රු. මිලි.*

| බදු පදනම | ජන. - නොවැ. 2017 | ජන. - නොවැ. 2018(අ) | වර්ධනය (%) |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 138,043 | 166,212 | 20.4 |
| උපයනවිට ගෙවීම් | 29,348 | 37,149 | 26.6 |
| පොළිය මත රඳවා ගැනීමේ බදු | 49,197 | 42,605 | (13.4) |
| ආර්ථික සේවා ගාස්තු | 43,585 | 51,877 | 19.0 |
| **එකතුව** | **260,173** | **297,843** | **14.5** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

2017 වසරේ පළමු මාස එකොළහ තුළ දී වාර්තා කළ රු. බිලියන 138 ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස එකොළහ තුළ සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු ආදායම රු. බිලියන 166.2 ක් දක්වා වර්ධනය වී ඇත. උපරිම කාර්යසාධන අනුපාතය සියයට 16.0 සිට සියයට 24.0 දක්වා ඉහළ නැංවීමටත් බදු ආදායම් ක්‍රියාත්මක කරන ස්ථර ප්‍රමාණය පුළුල් කිරීමත් මේ සඳහා හේතු සාධක විය. 2017 අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 29.3 ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස එකොළහ තුළ උපයන විට ගෙවීමේ බදු ආදායම රු. බිලියන 37.1 දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වුවද, පොළිය මත රඳවා ගැනීමේ බදු ආදායම අදාල අනුරූප කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 42.6 දක්වා පහත වැටී ඇත.

### එකතු කළ අගය මත බද්ද

2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැලකීමේ දී 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී එකතු කළ ආදායම මත බදු ආදායම සියයට 6.0 කින් වර්ධනය වෙමින් රු. බිලියන 424 ක් වාර්තා කර ඇත. 2018 වසරේ ඇස්තමේන්තු ගත එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 550 කි. අදාල අනුරූප කාලපරිච්ඡේදය තුළ දී දේශීය ක්‍රියාකාරකම් මත වූ එකතු කළ අගය මත බදු ආදායම සියයට 5.3 ක වර්ධනයක් සමග රු. බිලියන 262 ක් වූ අතර ආනයන මත වූ එකතු කළ අගය මත බදු ආදායම සියයට 7.0 ක වර්ධනයක් සමග රු. බිලියන 161 ක් විය. රෙදි, දැව, ගුවන්යානා හා අමතර කොටස්, කැමරා සහ ප්‍රක්ෂේපණ යන්ත්‍ර වැනි තෝරාගත් භාණ්ඩ මත වූ එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම සහ සෞඛ්‍ය සත්කාර සේවා අදාල බද්දෙන් නිදහස් කිරීම මෙම කාර්යසාධනයට ඉවහල් විය.

**1.5 වගුව | එකතු කළ අගය මත බදු කාරයසාධනය**

*රු. මිලි.*

| බදු පදනම | ජන. - නොවැ. 2017 | ජන. - නොවැ. 2018(අ) | වර්ධනය (% ) |
|---|---|---|---|
| දේශීය | 248,618 | 261,939 | 5.4 |
| ආනයන | 151,044 | 161,765 | 7.1 |
| **දළ ආදායම** | **399,662** | **423,704** | **6.0** |
| ආපසු ගෙවුම් | 613 | 759 | 23.8 |
| **ශුද්ධ ආදායම** | **399,048** | **422,945** | **6.0** |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | 0.15 | 0.18 | - |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### නිෂ්පාදන/සුරා බද්ද

2018 වසරේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය සඳහා නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද රු. බිලියන 428 ක ආදායමට සාපේක්ෂව රු. බිලියන 452 ක් දක්වා සියයට 5.7 කින් වර්ධනය වූ අතර ඛණිජ තෙල් නිෂ්පාදන හැරුණු කොට අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් අයිතම වලින් ලද ආදායම මෙම වර්ධනය සඳහා හේතු විය.

**1.6 වගුව | නිෂ්පාදන බදු/සුරා බදු කාර්යසාධනය**

*රු. මිලි.*

| බදු පදනම | ජන. - නොවැ. 2017 | ජන. - නොවැ. 2018(අ) | වර්ධනය (%) |
|---|---|---|---|
| මත්පැන් | 103,507 | 103,959 | 0.4 |
| දුම්වැටි හා දුම්කොළ | 78,908 | 85,257 | 8.0 |
| මෝටර් රථ | 171,815 | 193,376 | 12.5 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 67,714 | 61,862 | (8.6) |
| අනෙකුත් | 5,913 | 7,613 | 28.8 |
| **එකතුව** | **427,857** | **452,067** | **5.7** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

**රූප සටහන 1.3 | නිෂ්පාදන බදු /සුරා බදු කාර්යසාධනය 2018 ජන. - නොවැ.**




සුරා බදු තුළින් ලද බදු ආදායම 2018 වසරේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය සඳහා 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයක දී වාර්තා කරන ලද රු. බිලියන 103.5 ට සාපේක්ෂව රු. බිලියන 104 ක් දක්වා සියයට 0.4 කින් ආන්තිකව වර්ධනය වී ඇත. 2018 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී දුම්වැටි නිෂ්පාදනය සියයට 2.6 කින් වර්ධනය වීම හේතුවෙන් දුම්වැටි හා දුම්කොළ තුළින් 2018 වසරේ පළමු මාස එකොළහ සඳහා ලද ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයක් සඳහා වාර්තා වූ රු. බිලියන 79 ට සාපේක්ෂව රු. බිලියන 85 ක් දක්වා සියයට 8.0 කින් වර්ධනය විය. කෙසේ වුවද, දුම්වැටි පරිභෝජනය අධෛර්යමත් කිරීමේ අරමුණෙන් මි.මී. 72 හා මි.මී. 84 ට වැඩි දුම්වැටි මත නිෂ්පාදන බද්ද දුම්වැටි 1,000 ක් සඳහා රු. 33,550 සිට රු. 37,675 දක්වා 2018 වසරේ අගෝස්තු මාසයේ දී වැඩි කරන ලදි.

මෝටර් රථ තුළින් ලද නිෂ්පාදන බදු ආදායම 2018 වසරේ පළමු මාස එකොළහ සඳහා පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයකට සාපේක්ෂව රු. බිලියන 193 ක් දක්වා සියයට 12.5 කින් වර්ධනය වූ අතර 2018 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ විශේෂයෙන් එන්ජින් ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1,000 ට අඩු මෝටර් රථ ආනයනය සියයට 88.0 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදන බදු ආදායම වර්ධනය වීම සඳහා ප්ලාස්ටික් රෙසින සහ නිෂ්පාදනයේ අඩංගු සීනි ප්‍රමාණය අනුව පාන වර්ග මත පනවන ලද නිෂ්පාදන බදු ද ධනාත්මකව දායක විය. කෙසේ වුවද, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ගෑස් ඔයිල්/ඩීසල් ආනයනය අඩු වීමක් පෙන්නුම් කරමින් 2018 වසරේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් ලද නිෂ්පාදන බදු ආදායම 2017 සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 68 කට සාපේක්ෂව රු. බිලියන 62 ක් දක්වා සියයට 8.6 කින් අඩු වී ඇත

.

**1.7 වගුව** | **මෝටර් රථ ආනයන සහ නව ලියාපදිංචි කිරීම්**

ඒකකය: සංඛ්‍යාව

| අයිතමය | ආනයන ජන. - නොවැ. | | | | නව ලියාපදිංචි කිරීම ජන. - නොවැ. | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | වෙනස | % | 2017 | 2018 | වෙනස | % |
| බස් රථ | 3,365 | 2,508 | (857) | (25) | 3,009 | 2,810 | (199) | (7) |
| මෝටර් රථ | 48,058 | 90,183 | 42,125 | 88 | 35,230 | 76,816 | 41,586 | 118 |
| ත්‍රීරෝද රථ | 16,848 | 20,755 | 3,907 | 23 | 22,172 | 18,646 | (3,526) | (16) |
| යතුරු පැදි | 335,238 | 330,415 | (4,823) | (1) | 319,446 | 316,728 | (2,718) | (1) |
| භාණ්ඩ ප්‍රවාහන රථ(අ) | 103,736 | 46,874 | (56,862) | (55) | 10,548 | 8,782 | (1,766) | (17) |
| ඉඩම් වාහන(ආ) | 143,388 | 193,447 | 50,059 | 35 | 11,991 | 9,454 | (2,537) | (21) |
| අනෙකුත්(ඇ) | 107,430 | 33,207 | (74,223) | (69) | 15,256 | 16,593 | 1,337 | 9 |
| **එකතුව** | **758,063** | **717,389** | **(40,674)** | **(5)** | **417,652** | **449,829** | **32,177** | 8 |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

(අ) භාණ්ඩ ප්‍රවාහන වාහන, සින්ගල් කැබ් රථ සහ ද්විත්ව කාර්යය වාහන ඇතුළත් වේ

*(ආ) ඉඩම් වාහන, අත් ට්‍රැක්ටර් සහ අනෙකුත් ඉඩම් වාහන ඇතුළත් වේ*

*(ඇ) ද්විත්ව කාර්ය වාහන, ගිලන් රථ හා අවමංගල රථ ඇතුළත් වේ*

## රේගු ආනයන බද්ද

2018 වසරේ පළමු මාස එකොළහ තුළ රැස් කරන ලද රු. බිලියන 89.4 ක ආනයන බදු ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රැස් කරන ලද රු. බිලියන 125.1 හා සැසඳීමේ දී සියයට 28.6 ක අඩු වීමක් පෙන්නුම් කරයි. මෙම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පෙට්‍රල්, ඩීසල්, තිරිඟු පිටි සහ කිරි පිටි ආනයනය සඳහා බදු නිදහස් කිරීම් ලබාදීම, ව්‍යාපෘති සම්බන්ධ අයිතම සඳහා බදු සහන ලබාදීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම් යනාදියයි.

**1.8 වගුව** | **නිදහස් වෙළඳ ගිවිසුම් අනුව ලබා දෙන ලද තීරු බදු සහන යටතේ ආනයනය කරන ලද භාණ්ඩ වල වටිනාකම**

| නිදහස් වෙළඳ ගිවිසුම | 2018 ජන. - දෙසැ. | |
|---|---|---|
| | තීරුබදු සහන සඳහා යටත්වන නිෂ්පාදන සංඛ්‍යාව | ආනයන රු. මිලි. |
| ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 807 | 41,273 |
| පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 45 | 12,062 |
| දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම | 96 | 1,215 |
| ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම | 79 | 3,076 |
| **එකතුව** | **1,027** | **57,626** |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

2017 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 66.0 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු 2018 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 68.8 ක් ලෙස සියයට 4.3 ක වර්ධනයක් දක්නට ලැබිණි. මෙම මධ්‍යස්ත කාර්යසාධනය සඳහා මූලික වශයෙන් සහල් වර්ග, බඩ ඉරිඟු, හාල්මැස්සන්, කරවල, අර්තාපල්, බී ලූණු, ගාන ලද හෝ කුඩු කරන ලද කේජු, කව්පි, සීනි, පරිප්පු, මැකරල් මාළු, කඩල සහ කුරක්කන් යනාදිය සඳහා පනවන ලද බදු දීර්ඝ කිරීම් ඉවහල් විය.

## ජාතිය ගොඩනැගීමේ බද්ද

2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ රු. බිලියන 61.8 ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ලෙස රු. බිලියන 64.3 ක් වාර්තා කරන ලදී. දේශීය ක්‍රියාකාරකම් මත වූ ජාතිය

ගොඩනැඟීමේ බදු ආදායම රු. බිලියන 46.1 ක් දක්වා සියයට 3.6 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ආනයන මත වූ ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම රු. බිලියන 18.2 දක්වා සියයට 5.1 කින් වර්ධනයවී ඇත. මෙම ආදායම් කාර්යසාධනය සඳහා ජාතිය ගොඩනැඟීමේ බදු නිදහස් කිරීම් සහ අනුග්‍රහ කිරීම් වල වූ සංශෝධන හේතු වී ඇත.

**1.9 වගුව | ජාතිය ගොඩනැඟීමේ බදු, මුද්දර බදු සහ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු කාර්යසාධනය**

*රු. මිලි.*

| අයිතමය | 2017 | | | 2018 | | | % වෙනස 2017/2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන. - නොවැ. | | | ජන. - නොවැ. | | | ජන. - නොවැ. | | |
| | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව |
| **ජාතිය ගොඩනැඟීමේ බදු*** | **61,822** | **30,911** | **92,733** | **64,311** | **32,155** | **96,467** | **4.0** | **4.0** | **4.0** |
| දේශීය | 44,500 | 22,250 | 66,750 | 46,110 | 23,055 | 69,165 | 3.6 | 3.6 | 3.6 |
| ආනයන | 17,322 | 8,661 | 25,983 | 18,201 | 9,100 | 27,301 | 5.1 | 5.1 | 5.1 |
| මුද්දර බදු** | - | 7,540 | 7,540 | - | 8,432 | 8,432 | - | 11.8 | 11.8 |
| මෝටර් රථවාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු*** | 763 | 1,781 | 2,544 | 952 | 2,221 | 3,172 | 24.8 | 24.7 | 24.7 |
| **එකතුව** | **62,585** | **40,232** | **102,817** | **65,263** | **42,808** | **108,071** | **4.3** | **6.4** | **5.1** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*
** 2011 වසරේ සිට ජාතිය ගොඩනැඟීමේ බදු ආදායමෙන් සියයට 33 1/3 ක් මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත මාරු කරනු ලැබේ*
*** 2011 වසරේ සිට මුද්දර බදු ආදායම මඟින් ඉපයූ සම්පූර්ණ ආදායම මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත මාරු කරනු ලැබේ*
**** මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු වලින් මධ්‍යම රජය විසින් ඉපයූ ආදායමෙන් පළාත් සභා වලට මාරු කරන ලද සියයට 70 ට අදාළ සංඛ්‍යා දක්වේ*

## අනෙකුත් බදු

2017 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 31.0 ක් වූ විදුලි සංදේශ බදු ආදායමට සාපේක්ෂව 2018 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 26.6 ක් දක්වා සියයට 14.3 කින් පහත වැටී ඇති අතර අන්තර්ජාල සේවා සඳහා බදු ඉවත් කිරීම සහ ඇමතුම් සඳහා ගත වන කාලපරිච්ඡේදය අඩු වීම මේ සඳහා බලපා ඇත. මේ අතර, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ජාත්‍යන්තර වෙළඳාම මත සෙස් බද්දෙන් ලැබූ ආදායම රු. බිලියන 54.4 ක් ලෙස වාර්තා වූ අතර එම අගය 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 48.5 ක් දක්වා සියයට 10.7 කින් අඩු වී ඇත. මස්, කිරි නිෂ්පාදන, රට ඉඳි, මීදි, පෙයාස්, බීර, වයින් ආදී හඳුනාගන්නා ලද අයිතමයන් 253 ක් සඳහා පනවා තිබූ සෙස් බදු ඉවත් කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. තේ අපනයනයෙන් ලද සෙස් බදු ආදායම රු. මිලියන 542 දක්වා සියයට 7.1 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් අපනයනයෙන් ලද සෙස් බදු ආදායම පහත වැටිණි. ආනයන මත වන සෙස් බදු මඟින් වන ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 51.6 හා සැසඳීමේ දී එම අගය 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 46.1 ක දක්වා සියයට 10.6 කින් පහත වැටී ඇත. වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු මඟින් එකතු කළ ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ලද රු. බිලියන 92.6 සිට රු. බිලියන 103.8 දක්වා සියයට 12.2 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2018 වසරේ දී ඉන්ධන, වාහන සහ තිරිඟු ඇට යනාදී අන්තර් භාණ්ඩ ආනයන ඉහළ යාම ඉහත වර්ධනය සඳහා දායකත්වය ලබා දී ඇත.

**1.10 වගුව | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු කාර්යසාධනය**

*රු. මිලි.*

| අයිතමය | ජන. - නොවැ.[අ] 2017 | 2018 |
|---|---|---|
| **අපනයන සෙස් බද්ද** | **2,742** | **2,409** |
| තේ - (බදු සහ අපනයන පාලන) පනත, ශ්‍රී ලංකා තේ මණ්ඩල නීති යටතේ | 506 | 542 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 89 | 9 |
| පොල් - පොල් සංවර්ධන පනත යටතේ | 99 | 97 |
| අ.සං.ම. සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ | 2,048 | 1,761 |
| **ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ** | 51,614 | 46,118 |
| **එකතුව** | 54,356 | 48,527 |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### බදු නොවන ආදායම

2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මුළු බදු නොවන ආදායම රු. බිලියන 129.7 ක් ලෙස වාර්තා වූ අතර එම අගය 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රු. බිලියන 182.8 ක් ලෙස සියයට 40.9 කින් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ රු. බිලියන 15.0 ක් වූ මහ බැංකු ලාභ මාරු කිරීම සහ විකුණුම් හා ගාස්තු ආදායම සියයට 50.2 කින් වර්ධනය වීම වේ. එසේම, කුළී ආදායම රු. බිලියන 4.5 ක් දක්වා සියයට 42.4 කින් ද පොළී ආදායම රු. බිලියන 7.2 ක් දක්වා සියයට 29.7 කින් ද, සමාජ ආරක්ෂණ දායකත්වය රු. බිලියන 23.0 ක් දක්වා සියයට 10.4 කින් ද සහ අනෙකුත් ආදායම් රු. බිලියන 5.4 දක්වා සියයට 154.5 කින් ද මෙම කාර්යසාධනය සඳහා දායක වී ඇත. කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ලාභය සහ ලාභාංශ මගින් එකතු වූ ආදායම රු. බිලියන 35.2 දක්වා සියයට 3.4 කින් පහත වැටී ඇත.

**1.11 වගුව | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2018 ජනවාරි සිට නොවැම්බර්**

*රු. බිලි.*

| අයිතමය | 2017 | 2018 ඇස්තමේන්තුව | 2018 තාවකාලික | හේතු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 260.2 | 354.5 | 297.8 | රඳවා ගැනීමේ බදු ආදායම පහත වැටී තිබුණ ද, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් බදු පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් වීම සහ 2018 වසරේ අප්‍රේල් මස පළමු දින සිට නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීම ආදායම් බදු ආදායම ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත. සේවා නියුක්ති ආදායම මත සියයට 24.0 ක් දක්වා අනුක්‍රමිකව වැඩිවන අගයන් මත බදු අයකිරීම සහ බදු ස්ථර පුළුල් කිරීම උපයන විට ගෙවනු ලබන බදු ආදායම ඉහළ යාම කෙරෙහි තව දුරටත් සහය දක්වන ලදී. කෙසේ වුවද, දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමත් සහ ද.දේ. නිෂ්පාදනයේ මන්දගාමී වර්ධනයත් තත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් අපගමනය වීමට හේතු විය. |
| එකතු කළ අගය මත බදු | 399.0 | 494.6 | 422.9 | එකතු කළ අගය මත බදු ආදායම ඉහළ යාම කෙරෙහි දේශීය ක්‍රියාකාරකම් පුළුල්වීම සහ ආනයන වියදම් ඉහළ යාම බලපා ඇත. ගල්අඟුරු, කිරිපිටි, සිමෙන්ති සහ ලිහිසි තෙල් ආදී ආනයන සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය වීම ආනයන මත අයකරනු ලබන එකතු කළ අගය මත බදු ආදායම වර්ධනය වීම සඳහා මූලික වශයෙන් හේතු විය. තවද, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ලැබීම් හා ගෙවීම් අධීක්ෂණය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සහ බදු විගණනය වර්ධනය වීම මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලන ක්‍රියාවලිය පුළුල් වීම ද මෙම ආදායම ඉහළ යාම කෙරෙහි ධනාත්මකව බලපා ඇත. කෙසේ වුවද, තත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් අපගමනය වීමට සෞඛ්‍ය සේවා සඳහා ලබා දී ඇති එකතු කළ අගය මත බදු සහන ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| නිෂ්පාදන බදු | 427.9 | 487.3 | 452.1 | ඛනිජ තෙල් නිෂ්පාදන හැර මෝටර් රථ, මත්පැන්, දුම්වැටි සහ දුම්කොළ මත පැන වූ නිෂ්පාදන බදු ආදායම වැඩිවීම එම ආදායම ඉහළ යාම කෙරෙහි බලපා ඇත. විශේෂයෙන්ම, එන්ජින් ධාරිතාව 1,000 ට අඩු මෝටර් රථ ආනයනය ඉහළ යාම සහ මත්පැන් පරිභෝජන රටාව වෙනස් වෙමින් සැර අඩු මත්පැන් නිෂ්පාදනය ඉහළ යාම මෙම ආදායම වැඩි වීමට හේතු වුවද, තත්‍ය අදායම ඇස්තමේන්තුගත ආදායමෙන් අපගමනය වී ඇත. |
| රේගු ආනයන බදු | 125.1 | 158.2 | 89.4 | පෙට්‍රල්, ඩීසල්, තිරිඟු ඇට සහ කිරි පිටි සඳහා ප්‍රදානය කළ බදු අත්හැරීම් සහ ව්‍යාපෘති ආශ්‍රිත තීරු බදු සහන මෙන්ම නිදහස් වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක වීම තුළින් තීරු බදු ආදායම ප්‍රධාන වශයෙන් පහත වැටීමට හේතු වී ඇත. |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 92.6 | 104.5 | 103.8 | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම ඉහළ යාම සඳහා ඛණිජ තෙල්, පොහොර ආදී අතරමැදි භාණ්ඩ ආනයනය ඉහළ යාම හේතු වී ඇත. කෙසේ වුව ද, අධිතාක්ෂණික යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සඳහා සියයට 7.5 ක් වන ස්ථාවර බදු අනුපාතිකය වෙනුවට සියයට 2.5 ක අනුග්‍රාහක බදු අනුපාතිකය ප්‍රදානය කිරීම වරාය හා ගුවන් තොටපළ සංවර්ධන බදු ආදායම කෙරෙහි සෘණාත්මකව බලපා ඇත. |
| ජාතිය ගොඩනැගීමේ බදු | 61.8 | 78.6 | 64.3 | ඉදිකිරීම් සේවා සපයනු ලබන කොන්ත්‍රාත්කරුවන්, නිවාස සංකීර්ණ විකිණීම සහ විදේශ ව්‍යවහාර මුදල් ලබන සංචාරක නියෝජිත සේවාවන් යනාදිය මත බදු සහන ලබා දීම සහ එම පනත හා අදාල සංශෝධන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම ඇස්තමේන්තුගත ආදායමෙන් තත්‍ය ආදායම මධ්‍යස්ථව අපගමනය වීම කෙරෙහි බලපා ඇත. |
| වෙනත් බදු | 160.5 | 181.7 | 157.1 | ආනයන මත අය කරනු ලබන සෙස් බදු ආදායම සියයට 10.6 කින් පහත වැටී ඇති අතර මේ සඳහා තිරිඟු පිටි මත අයකළ සෙස් බද්ද පහත හෙලීම සහ හඳුනාගත් අයිතම 253 ක් මත අයකළ සෙස් බදු ඉවත් කිරීම හේතු වී ඇත. අන්තර්ජාල සඳහා පනවා තිබූ විදුලි සංදේශ බද්ද පහළ යාම එම ආදායම සියයට 14.3 කින් පහළ යාමට හේතු වී ඇත. තවද, ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් දුරකථන මඟින් ලබාගත් ඇමතුම් කාලය පහත වැටීම විදුලි සංදේශන බද්ද පහළ යාම කෙරෙහි හේතු වී ඇත. |
| බදු නොවන ආදායම | 129.7 | 156.0 | 182.8 | ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරීම බදු නොවන ආදායම ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ මූලික වැටුප ඉහළ යාම හේතුවෙන් සමාජ සංරක්ෂණ දායක මුදල් ඉහළ යාම සහ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් කටයුතු මඟින් ලත් ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කිරීම ආදිය ද බදු නොවන ආදායම වර්ධනය වීම කෙරෙහි ධනාත්මකව බලපාන ලදී. |
| **එකතුව** | **1,656.8** | **2,015.4** | **1,770.2** | |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලදී*

**සටහන 1 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2018 ජනවාරි සිට නොවැම්බර්**

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද** | |
| 2017.02.16 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.02.15 දිනැති අංක 2058/33 දරන ගැසට් නිවේදනය).<br>- අංක 22/99 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ කාණ්ඩ I, II සහ III ලෙස වර්ග කරන ලද හිමිකම් ලබන්නන් සඳහා නිෂ්පාදන බදු උපරිම නිදහස් සීමාව රු. මිලියන 22, රු. මිලියන 16 සහ රු. මිලියන 12 වශයෙන් ඉහළ නැංවීමට. |
| 2017.02.16 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.02.15 දිනැති අංක 2058/34 දරන ගැසට් නිවේදනය).<br>- වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2018 යටතේ වාහන ආනයනය කිරීමට හිමිකම් ලබන්නන් සඳහා වූ උපරිම නිෂ්පාදන බදු නිදහස් සීමාව රු. මිලියන 5 දක්වා ඉහළ දැමීමට. |
| 2018.04.12 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.04.12 දිනැති අංක 2066/40 දරන ගැසට් නිවේදනය).<br>- පළාත් පාලන සහ පළාත් සභා චක්‍රලේඛ අංක 01/2017 යටතේ වාහන ආනයනය සඳහා සුදුසුකම් ලබන 2017.11.09 දිනට පෙර ණයවර ලිපි විවෘත කරන ලද හිමිකම් ලබන්නන් සඳහා බදු සහන ලබා දීමට. |
| 2018.04.24 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.04.24 දිනැති අංක 2068/9 දරන ගැසට් නිවේදනය).<br>- විශ්‍රාමික ජෙනරාල් හැමිල්ටන් වනසිංහ මහතාට වාහන ආනයනය සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීමට. |
| 2018.05.15 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.05.15 දිනැති අංක 2071/16 දරන ගැසට් නිවේදනය).<br>- රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ රාජ්‍ය තාන්ත්‍රික සංවිධාන විසින් 100% ක බදු නිදහසක් යටතේ ආනයනය සහ ලියාපදිංචි කර ඇති වාහන විකිණීම සහ ක්ෂය කිරීම සඳහා වාර්ෂික පදනමින් නිෂ්පාදන බදු අඩු කිරීම් ප්‍රතිශත හඳුන්වා දීමට. |
| 2018.05.31 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.05.31 දිනැති අංක 2073/41 දරන ගැසට් නිවේදනය).<br>- භූමිතෙල් මත ලීටරයකට රු. 7.00 ක නිෂ්පාදන බද්දක් හඳුන්වා දීමට. |
| 2018.06.09 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.06.08 දිනැති අංක 2074/39 දරන ගැසට් නිවේදනය).<br>- වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍ර ලේඛ අංක 1/2018 යටතේ වාහන ආනයනය සඳහා හිමිකම් ලබන්නන් සඳහා නිෂ්පාදන බදු උපරිම නිදහස් සීමාව රු. මිලියන 5 සිට රු. මිලියන 3.6 දක්වා සංශෝධනය කිරීමට. |
| 2018.06.14 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.06.14 දිනැති අංක 2075/51 දරන ගැසට් නිවේදනය).<br>- භූමිතෙල් මත පනවන ලද නිෂ්පාදන බදු ඉවත් කිරීමට. |
| 2018.07.25 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.12 දිනැති අංක 2079/58 දරන ගැසට් නිවේදනය).<br>- සීනි අඩංගු පානයන් හි එම සීනි ප්‍රමාණය පදනම්ව නිෂ්පාදන බදු සංශෝධනය කිරීමට. |
| 2018.07.17 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.17 දිනැති අංක 2080/31 දරන ගැසට් නිවේදනය).<br>- අදාල ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් නීති හා කොන්දේසි වෙනස් නොකරමින් වාහන ශ්‍රී ලංකා රේගුවේ ලියාපදිංචි කිරීමට ලබා දී තිබූ සහන කාලයට අදාල කොන්දේසිය ඉවත් කිරීමට. |
| 2018.08.01 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.31 දිනැති අංක 2082/10 දරන ගැසට් නිවේදනය).<br>- එන්ජින් ධාරිතාවය 1,000 ට අඩු මෝටර් රථ මත නිෂ්පාදන බදු ඉහළ දැමීමට. |
| 2018.08.01 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.31 දිනැති අංක 2082/11 දරන ගැසට් නිවේදනය).<br>- මි.මී. 72 ට වඩා දිගින් යුක්ත දුම්වැටි මත නිෂ්පාදන බදු ප්‍රමාණය ඉහළ දැමීමට. |
| 2018.08.06 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.08.06 දිනැති අංක 2083/02 දරන ගැසට් නිවේදනය).<br>- 2018 වසරේ අගෝස්තු මස 01 වන දිනට හෝ ඊට පෙර ණයවර ලිපි විවෘත කර තිබීම පදනම්ව මෝටර් රථ ආනයනය සඳහා බදු සහන ලබා දීම විධිමත් කිරීමට. |
| 2018.09.18 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.09.17 දිනැති අංක 2089/18 දරන ගැසට් නිවේදනය).<br>- සීනි මත නිෂ්පාදන බදු පැනවීමට. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2018.10.09 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.10.08 දිනැති අංක 2092/5 දරන ගැසට් නිවේදනය).<br>- මේද අම්ල මත නිෂ්පාදන බදු පැනවීමට. |
| 2018.11.02 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.11.01 දිනැති අංක 2095/18 දරන ගැසට් නිවේදනය).<br>- ඩීසල් මත නිෂ්පාදන බදු සංශෝධනය කිරීමට. |
| 2018.11.12 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.11.12 දිනැති අංක 2097/3 දරන ගැසට් නිවේදනය).<br>- සීනි අඩංගු පාන වර්ග මත නිෂ්පාදන බදු පැනවීම නැවත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට. |
| 2018.12.04 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.12.03 දිනැති අංක 2100/3 දරන ගැසට් නිවේදනය).<br>- සීනි අඩංගු පානයන් හි එම සීනි ප්‍රමාණය පදනම්ව නිෂ්පාදන බදු සංශෝධනය කිරීමට. |
| **සුරා බද්ද** | |
| 2018.01.11 | අංක 01/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.10 දිනැති අංක 2053/21 දරන ගැසට් නිවේදනය).<br>- මත්පැන් බලපත්‍ර ලාභී ආයතන ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කර තබනු ලබන වේලාව හා වසා තබන වේලාව සංශෝධනය කිරීමට. |
| 2018.01.10 | 02/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.10 දිනැති අංක 2053/26 දරන ගැසට් නිවේදනය).<br>- සුරා බදු නිවේදන අංක 666 කින් සඳහන් නියමයන් සංශෝධනය කිරීමට. |
| 2018.01.18 | 03/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.18 දිනැති අංක 2054/41 දරන ගැසට් නිවේදන).<br>2018.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සුරා බදු නිවේදන අංක 01/2018 හි සඳහන්<br>- "මත්පැන් බලපත්‍ර ලාභී ආයතන වල ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව තබන වේලාවන් හා වසා තබනු ලබන වේලාවන්" සංශෝධනය කිරීමට. |
| 2018.01.18 | අංක 04/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.18 දිනැති අංක 2054/42 දරන ගැසට් නිවේදනය).<br>- 2018.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සුරා බදු නිවේදන අංක 666 සඳහන් නියමයන් සංශෝධනය කරමින් නිකුත් කළ 02/2018 දරන සුරා බදු නිවේදනය සංශෝධනය කිරීමට. |
| 2018.01.22 | අංක 05/2018 හා අංක 06/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.23 දිනැති අංක 2055/09 දරන ගැසට් නිවේදනය).<br>ගැසට් නිවේදන අංක 1001 සහ 1002 සඳහන් "පල්පය" යන වචනය ඉවත් කිරීමට. |
| 2018.02.21 | අංක 07/2018 දරන සුරාබදු නිවේදනය, (2018.02.21 දිනැති අංක 2059/32 දරන ගැසට් නිවේදනය).<br>- පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කිරීමේ දී තොග කිලෝ ග්‍රෑමයක් සඳහා අයකරන ලද සුරා බද්ද රු. 9.00 කින් අඩු කිරීමට. |
| 2018.04.16 | අංක 08/2018 දරන සුරා බදු නිවේදනය, (2018.04.09 දිනැති අංක 2066/2 දරන ගැසට් නිවේදනය).<br>- සුරා බදු ආඥා පනතේ සිදු කරන ලද සංශෝධනයට අනුව රා මැදීම හා බෑම සඳහා බලපත්‍ර ගාස්තුව සංශෝධනය කිරීමට. |
| 2018.04.01 | අංක 09/2018 දරන සුරා බදු නිවේදනය, (2018.04.06 දිනැති අංක 2065/57 දරන ගැසට් නිවේදනය).<br>- රා බෝතල් කිරීමේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. 500,000 කින් අඩු කිරීමට. |
| 2018.06.13 | අංක 10 /2018 දරන සුරා බදු නිවේදනය, (2018.06.13 දිනැති අංක 2075/23 දරන ගැසට් නිවේදනය).<br>- අංක 07/2018 දරන සුරා බදු නිවේදනය සංශෝධනය කිරීමට. |
| 2018.06.13 | අංක 11/2018 දරන සුරා බදු නිවේදනය, (2018.06.13 දිනැති අංක 2075/24 දරන ගැසට් නිවේදනය).<br>- රා තැබෑරුම් විවෘතව තබන වේලාවන් හා වසා තබනු ලබන වේලාවන් සංශෝධනය කිරීමට. |
| 2018.10.04 | අංක 12/2018 දරන සුරා බදු නිවේදනය, (2018.10.03 දිනැති අංක 2091/50 දරන ගැසට් නිවේදනය).<br>- පානීය නොවන ස්ප්‍රීතු ආනයනයේ දී සුරා බදු පැනවීමෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අනුමත සමාගම් නිදහස් කිරීමට. |
| **වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද** | |
| 2018.04.05 | - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත, (2018.04.06 දිනැති අංක 2065/42 දරන ගැසට් නිවේදනය).<br>- අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මත 2.5% ක අනුග්‍රාහක වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දක් ප්‍රදානය කිරීමට. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2018.07.11 | - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත, (2018.11.07 දිනැති අංක 2079/34 දරන ගැසට් නිවේදනය).<br>- අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මත 2.5% ක අනුග්‍රාහක වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දක් ප්‍රදානය කිරීමට. |
| **සෙස් බද්ද** | |
| 2018.07.25 | - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, (2018.07.24 දිනැති අංක 2081/10 දරන ගැසට් නිවේදනය).<br>- තේ තොග අපනයන සම්බන්ධව කිලෝ ග්‍රෑමයට රු. 10.00 සෙස් බද්දක් හඳුන්වා දීමට. |
| 2018.09.26 | - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, (2018.09.25 දිනැති අංක 2090/05 දරන ගැසට් නිවේදනය).<br>- සනීපාරක්ෂක තුවා සඳහා කිලෝ ග්‍රෑමයට 30% ක් හෝ රු. 300.00 ක් ලෙස පැවති සෙස් බද්ද ඉවත් කිරීමට. |
| 2018.10.17 | - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, (2018.10.17 දිනැති අංක 2093/19 දරන ගැසට් නිවේදනය).<br>- රෙදි පිළි මත සෙස් බදු සංශෝධනය කිරීමට. |
| **මුද්දර බද්ද** | |
| 2018.10.01 | - 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.10.01 දිනැති අංක 2091/3 දරන ගැසට් නිවේදනය).<br>- AFL 1, AFL 2, AFL 3 සහ AFL 4 යටතේ වන මත් පැන් බලපත්‍ර සහ බෝතල් කළ රා අලෙවිය මත මුද්දර බදු පැනවීමට. |
| **ආදායම් බද්ද** | |
| **සංස්ථාපිත ආදායම් බද්ද** | |
| 2018.04.01 | - ස්ථර තුනක ආදායම් බදු ප්‍රතිශතයන් හඳුන්වා දීමට.<br>- ***සියයට 28 සම්මත අනුපාතය*** - මූල්‍ය සේවා, රක්ෂණ, වෙළඳාම, නිෂ්පාදන සහ ඉහළ/සහනදායී බදු අනුපාතය යටතට නොගැනෙන ආදායම්<br>- ***සියයට 14 සහනදායී අනුපාතය*** - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, කෘෂිකාර්මික, අධ්‍යාපන සේවා, සංචාරක ප්‍රවර්ධන, තොරතුරු තාක්ෂණ සේවා, පුණ්‍ය ආයතන, සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සහ විශ්‍රාම අරමුදල්<br>- ***සියයට 40 ඉහළ අනුපාතය*** - ඔට්ටු හා සූදු, දුම්කොළ සහ මධ්‍යසාර |
| **පුද්ගලික ආදායම් බද්ද** | |
| 2018.04.01 | **පුද්ගලික ආදායම් බදු**<br>**බදු අයකළ හැකි ආදායම** — **බදු අනුපාතය**<br>පළමු 600,000 — 4%<br>600,000 - 1,200,000 — 8%<br>1,200,000 - 1,800,000 — 12%<br>1,800,000 - 2,400,000 — 16%<br>2,400,000 - 3,000,000 — 20%<br>3,000,000 ඉහළ — 24% |
| **සේවා නියුක්ති ආදායම් බද්ද** | |
| 2018.04.01 | - සේවා නියුක්ති ආදායම මත සියයට 24.0 ක් දක්වා අනුක්‍රමිකව වැඩිවන අනුපාතයකට බදු අය කරන අතර බදු ස්ථර පුළුල් කර ඇත.<br>- සුදුසුකම් ලබන ගෙවීම් දීමනාව රු. 250,000 සිට රු. 700,000 දක්වා වැඩි කරන ලදී.<br>- සේවාන්ත ලැබීම් සඳහා බදු කරණයේ කිසිදු වෙනසක් ඇති නොකරන ලදී.<br>ද්විතීක සේවා නියුක්තිය:<br>පළමු රු. 50,000 මාසිකව: 10%<br>ඉතිරිය : 20% |
| **රඳවා ගැනීමේ බද්ද** | |
| 2018.04.01 | **කාණ්ඩය** — **ප්‍රතිශතය**<br>බැංකු තැන්පතු මත පොලිය - ජ්‍යෙෂ්ඨ පුරවැසි — 5% (වාර්ෂික රු. මිලි. 1.5 ඉක්මවන මුදල)<br>අනිකුත් — 5% |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | සංස්ථාපිත ණය සුරැකුම්පත් මත පොළිය 5%<br>රාජ්‍ය සුරකුම්පත් මත පොළිය නැත<br>බදු කුළිය 10%<br>විශේෂ ගාස්තු - රු. 50,000 ට වැඩි 5%<br>හවුල් ව්‍යාපාර - එක් හවුල්කරුවන්ගේ කොටස 8%<br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වෙන්දේසි මත මැණික් විකුණුම් 2.5%<br>අනිකුත් (ලාභාංශ, රාජ්‍යභාග ආදිය) 14% |
| **ප්‍රාග්ධන දීමනා ව්‍යුහය** | |
| 2018.04.01 | **විස්තරය** / **ප්‍රතිශතය**<br>පරිගණක සහ දත්ත හැසුරුම උපකරණ 20%<br>වාහන 20%<br>යන්ත්‍ර සූත්‍ර 20%<br>ගොඩනැගිල්ල 5%<br>කීර්තිනාමය ඇතුලුව අස්පෘශ්‍ය වත්කම් සත්‍ය ප්‍රයෝජනවත් ආයුකාලය හෝ 5% |
| **ප්‍රාග්ධන ලාභ මත බද්ද** | |
| 2018.04.01 | ලැයිස්තුගත කොටස් හැර ඉඩම් හා ගොඩනැගිලි සහ අනෙකුත් ආයෝජන උපලබ්ධිවීමේ ලාභය මත 10% කිරීමට. |
| **ආයෝජන දිරිගැන්වීම් ක්‍රමය** | |
| 2018.04.01 | යම් තක්සේරු වසරක් තුළ අස්පෘශ්‍ය වත්කම් හැර ක්ෂය වන වත්කම් සඳහා වියදම් දරන යම් තැනැත්තෙකුට වැඩි කළ ක්ෂය දිමනා පදනම් කරගත් නව ආයෝජන දිරිගැන්වීම් ක්‍රමයක් හදුන්වා දීමට. |
| 2018.07.30 | 2018 අංක 21 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධිත) පනත<br>-ඉඩම් පනත යටතේ විදේශිකයන් විසින් ඉඩම් මිළ දී ගැනීමේ දී පැවති සීමා කිරීම් කොළඹ කොටස් වෙළෙඳපල ලැයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් ඉවත් කිරිමට.<br>- 4 වන මහලෙන් පහළ සහාධිපත්‍ය නිවාස ඒකක මිළ දී ගැනීම සම්බන්ධයෙන් විදේශිකයින්ට පැවති තහනම ඉවත් කිරිමට. |
| **ජාතිය ගොඩනැඟීමේ බද්ද** | |
| 2018.07.30 | 2018 අංක 20 දරන ජාතිය ගොඩනැඟීමේ (සංශෝධිත) පනත<br>- මත්පැන් සම්බන්ධයෙන් පැවති ජාතිය ගොඩනැඟීමේ බදු නිදහස් කිරීම ඉවත් කිරිමට.<br>- ජල ක්‍රීඩා සඳහා භාවිතා කරන මෝටරයකින් ක්‍රියාත්මක නොවන උපකරණ සහ උපාංග සහ කපා ඔප දමා අපනයනය උදෙසා මැණික් ගල් ආනයනය කිරීම ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් නිදහස් කිරිමට.<br>- 2017.08.01 වන දිනට පෙර එළඹි ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ සපයන ඉදිකිරීම් සේවා ජාතිය ගොඩනැඟීමේ බදු නිදහස් කිරීමට. |
| **එකතු කළ අගය මත බද්ද** | |
| 2018.08.16 | 2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත<br>- කාමර ගාස්තු හැර පුද්ගලික වෛද්‍ය සේවා සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට.<br>- ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මූල්‍යමය සේවා සැපයුම මත එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට.<br>- අපනයන අභිමුඛ සමාගම් දේශීය වෙළෙඳපල තුළ අලෙවි කරන ඇතැම් ඇඟළුම් ඒකකයක් මත පදනම් වූ එකතු කළ අගය මත බද්ද නිදහස් කිරීමට.<br>- ළදරු කිරි පිටි, පොත්, සඟරා හා වාර ප්‍රකාශන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට.<br>- පැළ හා මල්, රෙදි පිළි, දැව හා ආශ්‍රිත උපාංග සහ යන්ත්‍රෝපකරණ යනාදිය ඇතුළත් වූ භාණ්ඩ ආනයනය හෝ ආනයනය කර සැපයුම සඳහා පැවති එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කිරීමට.<br>- 2019.04.01 දින සිට සහාධිපත්‍යය නිවාස ඒකක විකුණුම් මත වූ එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කිරීමට.<br>- සංචාරකයන් සඳහා එකතු කළ අගය මත බදු ප්‍රතිපූරණය කිරීමේ ක්‍රමවේදය හඳුන්වාදිමට. |
| 2018.02.18 | - සීනි ආනයනය හෝ ආනයනය කර සැපයුම මත එකතු කළ අගය මත බදු අනුපාතය 15% සිට 0% දක්වා අඩු කිරිමට. |
| 2018.11.01 | - රෙදි පිළි ආනයනයේ දී අය වන එකතු කළ අගය මත බදු අනුපාතය 0% කිරීමට. |
| 2018.11.01 | - ඉරන ලද දැව ආනයනයේ දී අය වන එකතු කළ අගය මත බදු අනුපාතය 5% දක්වා අඩු කිරීමට. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **වෙනත් බදු - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2018.01.01 | **වාහන හිමිකම් අය බද්ද** - 2018.12.31 වන දිනට පෙර වාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේ දී වාහන ආනයන කරුවන් විසින් බැංකුවට මෙම අය බද්ද ගෙවීමට. |
| 2018.10.01 | **වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද - 2018 වසර සඳහා පමණක් අදාල වේ.**<br><br>**සමාගම් කාණ්ඩය** — **අනුප්‍රමාණය (වසරකට රු.)**<br>ලැයිස්තුගත පොදු සමාගම් — 1,500,000<br>පුද්ගලික සමාගම් — 30,000<br>වෙනත් යම් සමාගම් — 250,000 |
| 2018.10.01 | - **ණය ආපසු ගෙවීමේ අය බද්ද** - මූල්‍ය ආයතන විසින් සපයන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය මත 7% ක ණය ආපසු ගෙවීමේ බද්දක් අය කිරීමට. |
| 2019.01.01 | - **කාබන් බද්ද** - වාහන වල එන්ජින් ධාරිතාවය, ප්‍රථම ලියාපදිංචියේ සිට වසර සහ ඉන්ධන වර්ගය පදනම් කර ගනිමින් මෝටර් රථ මත කාබන් බද්දක් පැනවීමට. |
| 2019.01.01 | - **දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද** - දුරකථන කුළුණු හිමි ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගෙන් එක් දුරකථන සන්නිවේදන කුළුණක් සඳහා වසරකට රුපියල් 200,000 ක බද්දක් අය කිරීමට. |
| 2019.01.01 | - **ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද** - ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මඟින් වාණිජ අරමුණකින් ග්‍රාහකයින් කණ්ඩායමකට/සමූහයකට යවනු ලබන කෙටි පණිවුඩ මත දැන්වීම්කරු හෝ පණිවිඩය යවන්නා විසින් මෙම බද්ද ගෙවීමට. |
| 2019.01.01 | - **සංචාරක සංවර්ධන බද්ද** - වාර්ෂික පිරිවැටුම රු. මිලි. 12 නොඉක්මවන හෝ කාර්තුවකට රු. මිලි. 03 ක් නොඉක්මවන පිරිවැටුමක් සහිත ආයතන වල අදාල පිරිවැටුම මත සියයට 0.5 ක සංචාරක සංවර්ධන බද්දක් පැනවීමට. |
| 2018.11.01 | - **වාණිජ කේන්ද්‍රස්ථාන වලට අදාල ප්‍රතිපාදන සංශෝධනය කිරීම** - වාණිජ කේන්ද්‍රස්ථාන ක්‍රියාකාරකම්වල නිරත ආයතන වලට සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට ඉඩ ප්‍රස්ථාව සැලසීමට. |
| **ආර්ථික සේවා ගාස්තු** | |
| 2018.09.20 | 2018 අංක 33 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත<br>- මෝටර් රථ ආනයනයේ දී ආර්ථික සේවා ගාස්තු අයකිරීම සඳහා පදනම ලෙස ගෙවිය යුතු නිෂ්පාදන බද්ද සැලකීමට.<br>- ඉන්ධන තොග සැපයුම සම්බන්ධව ආර්ථික සේවා ගාස්තු අයකිරීමේ දී ගෙවිය යුතු නිෂ්පාදන බද්ද පිරිවැටුම ලෙස පිරිවැටුමෙන් 1/10 ක් අදාල පිරිවැටුම ලෙස සැලකීමට.<br>- ශ්‍රී ලංකා මහ බැංකුවේ උපලබ්ධි නොවූ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසි, ආර්ථික සේවා ගාස්තු වලින් නිදහස් කිරීමට. |
| **රේගු ආනයන බද්ද** | |
| 2018.03.17 | - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.03.16 දිනැති අංක 2062/5 දරන ගැසට් නිවේදනය).<br>- තෝරාගත් අයිතම 154 සඳහා ආනයන තීරු බදු සංශෝධනය කිරීමට.<br>- සුරතල් මත්ස්‍ය කර්මාන්තය සඳහා භාවිත කරන පැනල, මත්ස්‍ය ආහාර සඳහා භාවිතා කරන කුඩා මසුන් සහ ක්ෂුද්‍ර ජීවීන් මඟින් බිඳලිය හැකි හා කොම්පෝස්ට් පොහොර ලෙස ඉවත් කළ හැකි ප්ලාස්ටික් ද්‍රව්‍යය සඳහා නව සංයෝජිත වර්ගීකරණයන් හඳුන්වා දීමට.<br>- කිරි ගවයින් සඳහා ආහාර ලෙස භාවිතා කරන තෘණ සඳහා 15% වූ ආනයන රේගු බදු ඉවත් කිරීමට.<br>- ආනයනික ලොතරැයි සහ දුරකථන කාඩ් පත් සඳහා 30% ලෙස වෙනුවට, කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 350.00 ක් හෝ 30% යන අනුපාතය ලෙස සංශෝධනය කිරීමට. |
| 2018.04.18 | - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.04.17 දිනැති අංක 2067/2 දරන ගැසට් නිවේදනය).<br>- රත්‍රන් ආනයනය කිරීමේ දී අය කරනු ලබන රේගු ආනයන බදු ප්‍රතිශතය 15% දක්වා ඉහළ දැමීමට. |
| 2018.05.01 | - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.05.01 දිනැති අංක 2069/2 දරන ගැසට් නිවේදනය).<br>- සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තෝරාගත් අයිතම 3,719 ක ආනයන රේගු බදු නිදහස් කිරීමට. |
| 2018.05.03 | - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.05.02 දිනැති අංක 2069/19 දරන ගැසට් නිවේදනය).<br>- බීඩි කොළ සඳහා ආනයන රේගු බදු අය කිරීම 2018 වසරේ මැයි මස 03 වන දින සිට බර මත පනම්ව අය කිරීමට. |
| 2018.05.16 | - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.05.15 දිනැති අංක 2071/15 දරන ගැසට් නිවේදනය). |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | -දේශීය වෙළෙඳපල සඳහා තෙල් මිල සූත්‍රයක් හඳුන්වා දීමට. |
| 2018.07.11 | -1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.07.10 දිනැති අංක 2079/32 දරන ගැසට් නිවේදනය).<br>-මිලි ලීටර් 100 ක අඩංගු සීනි ප්‍රමාණය මිලි ග්‍රෑම් 06 කට නොවැඩි පළතුරු යුෂ සඳහා නිෂ්පාදන බදු පැනවීම සඳහා නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන් හඳුන්වාදීමට.<br>-ආනයනික බීඩි කොළ සම්බන්ධයෙන් පෙර පැවති කිලෝ ග්‍රෑමයට රු. 250 ක් හෝ 30% ක්වූ බදු අනුපාතයන් සංශෝධනය කිරීමට. |
| 2018.07.20 | -1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.07.19 දිනැති අංක 2080/42 දරන ගැසට් නිවේදනය).<br>-සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තෝරාගත් අයිතම 182 සඳහා ආනයන රේගු බදු නිදහස් කිරීමට. |
| 2018.10.09 | -1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.10.08 දිනැති අංක 2092/8 දරන ගැසට් නිවේදනය).<br>-පාම් තෙල් සහ සත්ත්ව මේද අම්ල සඳහා නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන් හඳුන්වාදීමට.<br>-වැසිකිළි පෝච්චි ආනයනයේ දී සිදුවිය හැකි ඌන මිල තක්සේරු කිරීම් වලින් දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කරගැනීම සඳහා නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන් හඳුන්වාදීමට. |
| 2018.11.16 | -1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත, (2018.11.15 දිනැති අංක 2097/36 දරන ගැසට් නිවේදනය).<br>-පෙට්‍රල් ලීටරයක් සඳහා රේගු ආනයන බදු රු. 35.00 කින් සංශෝධනය කිරීමට. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද** | |
| 2018.01.19 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.01.18 දිනැති අංක 2054/40 දරන ගැසට් නිවේදනය).<br>-සියලුම වර්ග වල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පැනවීමට.<br>-පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු, උම්බලකඩ, උඳු පිටි ඇතුළත්ව අයිතම 07 ක් සම්බන්ධව පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.02.01 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.01.31 දිනැති අංක 2056/33 දරන ගැසට් නිවේදනය).<br>-බඩඉරිඟු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වූ කිලෝ ග්‍රෑමයට රු. 10.00 ක් වූ බද්ද මාස 06 ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.02.16 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.02.15 දිනැති අංක 2058/30 දරන ගැසට් නිවේදනය).<br>-සීනි සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.02.24 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.02.23 දිනැති අංක 2059/52 දරන ගැසට් නිවේදනය).<br>-අර්තාපල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රු. 30.00 ක් දක්වා ඉහළ නැංවීමට. |
| 2018.03.08 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.03.07 දිනැති අංක 2061/22 දරන ගැසට් නිවේදනය).<br>-මැකරල් මාළු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩා කඩල, කච්පි සහ කුරක්කන් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.03.20 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.03.19 දිනැති අංක 2063/13 දරන ගැසට් නිවේදනය).<br>-උඳු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රු. 100.00 දක්වා ඉවත් කිරීමට. |
| 2018.04.01 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.04.01 දිනැති අංක 2064/49 දරන ගැසට් නිවේදනය).<br>-අර්තාපල්, සහල්, බටර්, සුදු ලූණු, දොඩම්, මිදි, ඇපල්, සුදුරු, කුරහන්, රටකජු, අඹ සහ ලූණු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කිරීමට. |
| 2018.05.02 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.05.01 දිනැති අංක 2069/18 දරන ගැසට් නිවේදනය).<br>-අර්තාපල් කිලෝ ග්‍රෑමයක් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 40.00 දක්වා ද, බීජ ළූණු සඳහා සහ රු. 40.00 දක්වා ද ඉහළ නැංවීමට. |
| 2018.05.08 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.05.08 දිනැති අංක 2070/2 දරන ගැසට් නිවේදනය). |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | -අයිතම 11 ක් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් මාස 06 ක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.05.09 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.05.09 දිනැති අංක 2070/6 දරන ගැසට් නිවේදනය).<br>-පියළි නොකළ පරිප්පු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රු. 7.00 දක්වා ඉහළ නැංවීමට.<br>-පියළි කළ පරිප්පු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රු. 12.00 දක්වා ඉහළ නැංවීමට. |
| 2018.05.21 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.05.20 දිනැති අංක 2071/85 දරන ගැසට් නිවේදනය).<br>-අයිතම 6 මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් මාස 06 ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.06.01 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.05.31 දිනැති අංක 2073/37 දරන ගැසට් නිවේදනය).<br>-පොල් හා ආශ්‍රිත නිෂ්පාදන වල පවතින වෙළඳපල මිල ස්ථායිකරණය කිරීමේ අරමුණින් රු. 20.00 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වා දීමට. |
| 2018.06.14 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.06.14 දිනැති අංක 2075/31 දරන ගැසට් නිවේදනය).<br>-පොල් සහ මාළු වර්ගයන් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කිරීමට.<br>-කොණ්ඩ කඩල මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රු. 150.00 දක්වා ඉහළ නැංවීමට. |
| 2018.07.19 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.07.18 දිනැති අංක 2080/36 දරන ගැසට් නිවේදනය).<br>-අයිතම 07 ක් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කිරීමට. |
| 2018.08.01 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.08.01 දිනැති අංක 2082/31 දරන ගැසට් නිවේදනය).<br>-ආනයනය කරනු ලබන සියළු මත්ස්‍ය වර්ගයන් මත පනවන ලද කිලෝ ග්‍රෑමයට 10% හෝ රු. 100.00 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දෙකක කාලපරිච්ඡේදයක් සඳහා රු. 25.00 දක්වා අඩු කිරීමට. |
| 2018.08.09 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.08.08 දිනැති අංක 2083/09 දරන ගැසට් නිවේදනය).<br>-බඩඉරිඟු මත පනවන ලද කිලෝ ග්‍රෑමයට රු. 10.00 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මාස 06 ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.08.16 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.08.16 දිනැති අංක 2084/30 දරන ගැසට් නිවේදනය).<br>-සීනි මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.08.25 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.08.25 දිනැති අංක 2085/36 දරන ගැසට් නිවේදනය).<br>-ආහාරයට ගනු ලබන තෙල් වර්ග මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් රු. 20.00 කින් ඉහළ නැංවීමට. |
| 2018.09.07 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.09.07 දිනැති අංක 2087/76 දරන ගැසට් නිවේදනය).<br>- කඩල, මැකරල් මාළු, කොණ්ඩ කඩල, කව්පි සහ කුරක්කන් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |
| 2018.09.18 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.09.17 දිනැති අංක 2089/19 දරන ගැසට් නිවේදනය).<br>-සීනි මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීමට. |
| 2018.10.01 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.09.29 දිනැති අංක 2090/47 දරන ගැසට් නිවේදනය).<br>-මාළු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ දමන අතර යෝගට්, සුදු ළූණු, දොඩම්, මිදි, ඇපල් ඇතුළුව අයිතම 11 ක් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කිරීමට. |
| 2018.11.02 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.11.01 දිනැති අංක 2095/16 දරන ගැසට් නිවේදනය).<br>-අර්තාපල් සහ බී ළූණු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් මාසයක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කිරීමට. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2018.11.02 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.11.01 දිනැති අංක 2095/21 දරන ගැසට් නිවේදනය).<br>-කොණ්ඩ කඩල සහ පරිප්පු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 5.00 කින් ද කඩල මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 25.00 කින් ද වන ලෙස අඩු කිරීමට.<br>-සුදු සීනි මත පනවන ලද රු. 32.00 ක් සහ දුඹුරු සීනි මත පනවන ලද රු. 35.00 ක් ලෙස විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද නැවත පැනවීමට. |
| 2018.11.08 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.11.07 දිනැති අංක 2096/21 දරන ගැසට් නිවේදනය).<br>-මුං ඇට, මැංගුස්, වියළි දොඩම්, කච්පි ඇතුළුව අයිතම 10 ක් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කිරීමට. |
| 2018.11.24 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.11.23 දිනැති අංක 2098/27 දරන ගැසට් නිවේදනය).<br>-වටානා මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 10.00 ක් දක්වා අඩු කිරීමට. |
| 2018.12.03 | -2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (2018.11.23 දිනැති අංක 2100/2 දරන ගැසට් නිවේදනය).<br>-අර්තාපල් සහ බී ළූණු මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 20.00 ක් දක්වා අඩු කිරීමට. |
| **පරිපාලනමය ගාස්තු** | |
| 2018.04.28 | -කිලෝ ග්‍රෑම් 12.5 ක ගෘහස්ත ගෑස් සිලින්ඩරයක මිල රු. 245.00 කින් ඉහළ දැමීමට. |
| 2018.05.05 | -කිරිපිටි සඳහා වූ සිල්ලර මිල රු. 50.00 කින් ඉහළ දැමීමට. |
| 2018.06.30 | -කිලෝ ග්‍රෑම් 12.5 ක ගෘහස්ත ගෑස් සිලින්ඩරයක මිල රු. 138.00 කින් පහළ දැමීමට. |
| 2018.09.27 | -කිලෝ ග්‍රෑම් 12.5 ක ගෘහස්ත ගෑස් සිලින්ඩරයක මිල රු. 195.00 කින් ඉහළ දැමීමට. |

## 1.3 රජයේ වියදම

2018 වසරේ පළමු මාස එකොළහ තුළ රාජ්‍ය වියදම රු. බිලියන 2,500 ක් ලෙස වාර්තා විය. එයින් රු. බිලියන 1,951 ක් පුනරාවර්තන වියදම් වූ අතර රු. බිලියන 549 ක් මූලධන වියදම් විය.

### 1.12 වගුව | රාජ්‍ය වියදම් කාර්යසාධනය

*රු. මිලි.*

| අයිතමය | ජන. - නොවැ. | |
|---|---|---|
| | 2017 | 2018(අ) |
| **පුනරාවර්තන වියදම** | **1,684,876** | **1,951,042** |
| වැටුප් | 545,302 | 572,700 |
| විශ්‍රාම වැටුප් | 166,745 | 177,710 |
| පොළී ගෙවීම් | 605,271 | 809,258 |
| අනෙකුත් | 367,558 | 391,374 |
| **ප්‍රාග්ධන වියදම** | **478,353** | **495,954** |
| **රාජ්‍ය ණය ආපසු ගෙවීම්** | **831,831** | **1,195,242** |
| **මුළු වියදම** | **2,995,060** | **3,642,238** |

*මූලාශ්‍ර: ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

### පුද්ගල පඩිනඩි සහ විශ්‍රාම වැටුප්

පළාත් සභා සේවකයින් ද ඇතුළත්ව රජයේ සේවකයින්ගේ පුද්ගල පඩිනඩි සඳහා 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දරන ලද සමස්ත වියදම රු. බිලියන 750 ක් ලෙස සියයට 5.3 කින් වැඩි වූ අතර, 2017 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එම අගය රු. බිලියන 712 ක් විය. 2016 වසරේ සිට සිදුවන රජයේ සේවකයින්ගේ මූලික වැටුප වැඩි වීම, මේ සඳහා බලපා ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී රු. බිලියන 167 ක් වූ විශ්‍රාම වැටුප් ගෙවීම 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 178 ක් දක්වා සියයට 6.5 කින් වැඩි වූ අතර, රජයේ සේවකයින්ගේ මූලික වැටුප් වැඩිවීම්, විශ්‍රාම වැටුප්සඳහා වූ වියදම් වැඩිවීම කෙරෙහි අඛණ්ඩව බලපෑමක් ඇති කිරීමට හේතු විය.

## පොළී ගෙවීම්

දේශීය සහ විදේශීය ණය සඳහා පොළී ගෙවීමට 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 605 ක් වැයවූ අතර, 2018 වසරේ මුල් මාස එකොළහ තුළ දී එම වියදම රු. බිලියන 809 ක් දක්වා සියයට 33.7 කින් වැඩි විය. මෙයින් රු. බිලියන 634 ක් දේශීය ණය පොළී දැරීමට සිදුවූ අතර විදේශීය ණය පොළිය සඳහා දරන ලද මුදල රු. බිලියන 176 කි. පොළී ගෙවීම් වැඩිවීමට මූලිකම හේතුව වී ඇත්තේ විනිමය අනුපාත සහ පොළී අනුපාත උච්චාවචනය වීම වේ.

**වගුව 1.13 | රජයේ සුරැකුම්පත් සහ විනිමය අනුපාත මත ගෙවන පොළී අනුපාතයන්හි හැසිරීම - 2017 සිට 2018**

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | සාමාන්‍ය විනිමය අනුපාතය රු./ඇ.ඩො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 91 දින | 182 දින | 364 දින | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | |
| 2017 | ජන. | 9.03 | 10.07 | 10.37 | 11.41 | - | - | 12.19 | 150.09 |
| | පෙබ. | 9.32 | 10.19 | 10.58 | 12.10 | - | - | 12.89 | 150.82 |
| | මාර්තු | 9.63 | 10.62 | 10.98 | 12.30 | - | - | - | 151.43 |
| | අප්‍රේල් | 9.73 | 10.70 | 11.02 | 11.12 | - | - | 11.55 | 151.76 |
| | මැයි | 9.61 | 10.35 | 10.71 | 11.07 | - | - | 11.42 | 152.33 |
| | ජූනි | 9.60 | 10.29 | 10.47 | - | - | 11.37 | - | 152.83 |
| | ජූලි | 9.44 | 9.71 | 9.99 | - | - | 11.14 | 10.43 | 153.67 |
| | අගෝ. | 8.87 | 9.30 | 9.67 | 9.83 | - | - | - | 153.19 |
| | සැප්. | 8.71 | 9.01 | 9.10 | - | - | - | 10.09 | 152.90 |
| | ඔක්. | 8.75 | 9.10 | 9.48 | - | - | - | - | 153.53 |
| | නොවැ. | 8.20 | 8.88 | 9.44 | - | 9.92 | - | 10.20 | 153.66 |
| | දෙසැ. | 7.69 | 8.30 | 8.90 | - | 9.55 | - | - | 153.15 |
| 2018 | ජන. | - | 7.95 | 8.90 | - | - | - | - | 153.80 |
| | පෙබ. | 8.24 | 8.52 | 9.59 | - | 9.85 | - | 9.44 | 154.86 |
| | මාර්තු | 8.17 | - | 9.69 | - | - | - | 10.68 | 155.73 |
| | අප්‍රේල් | 8.10 | - | 9.59 | - | 9.79 | - | - | 153.14 |
| | මැයි | 8.34 | 8.93 | 9.62 | - | - | - | - | 157.90 |
| | ජූනි | 8.32 | 8.85 | 9.39 | - | - | - | 10.51 | 159.07 |
| | ජූලි | 8.24 | 8.74 | 9.27 | - | - | - | - | 159.34 |
| | අගෝ. | 8.03 | 8.60 | 8.99 | - | - | - | 9.91 | 160.35 |
| | සැප්. | 8.56 | - | 9.51 | - | 10.03 | - | - | 164.42 |
| | ඔක්. | 9.48 | 9.75 | 10.39 | - | - | - | 11.69 | 171.22 |
| | නොවැ. | 10.01 | 9.99 | 11.20 | - | - | - | - | 176.85 |

*මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව*

## සුභසාධන වියදම්

2018 වසරේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය සඳහා සුභසාධන වැඩසටහන් සඳහා වන වියදම රු. බිලියන 175 ක් වූ අතර 2017 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එය රු. බිලියන 162 ක් විය. 2018 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී සෞඛ්‍ය අංශය සඳහා වන වියදම වැඩි වූ අතර සැමට නොමිලේ ඖෂධ, ත්‍රිපෝෂ වැඩසටහන සහ 'පෝෂණ මල්ල' වැඩසටහන සඳහා වන වියදම් වැඩිවීම ද මෙයට හේතු විය. සැමට නොමිලේ ඖෂධ වැඩසටහන යනු, වැඩිම වියදමක් දරන ලද සුභසාධන වැඩසටහන වූ අතර අධ්‍යාපන අංශය සඳහා වන වියදම ද මෙම කාලපරිච්ඡේදය තුළ දී වැඩි වී තිබේ.

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ජීවනෝපාය ආධාර වැඩසටහන සඳහා රු. බිලියන 61.0 ක වියදමක් දරන ලදී. 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී, 'සමෘද්ධි' සහ පොහොර සහනාධාර වැඩසටහන් ප්‍රධාන රාජ්‍ය වියදම් අතර විය. මේ අතර ආබාධිත රණවිරු වැඩසටහන සඳහා වන වියදම වූ රු. බිලියන 28.0 ක් ඇතුළත්ව සමාජ සුභසාධන හා ආරක්ෂක ජාල කටයුතු යටතේ රු. බිලියන 50.0 ක වියදමක් දරා ඇති අතර පසුගිය වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එම අගය සියයට 12.0 කින් ඉහළ යාමක් පෙන්නුම් කර ඇත.

**1.14 වගුව | සුභසාධන වියදම්**

*රු. මිලි.*

| අයිතමය | ජන. - නොවැ. 2017 | ජන. - නොවැ. 2018(අ) |
|---|---|---|
| **සෞඛ්‍ය සහ පෝෂණය** | **38,349** | **46,834** |
| සැමට නොමිලේ ඖෂධ | 32,077 | 40,147 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 1,542 | 1,728 |
| පෙර පාසැල් දරුවන් වෙනුවෙන් උදේ ආහාරය | 131 | 205 |
| පෝෂණ මල්ල | 4,599 | 4,754 |
| **අධ්‍යාපනය** | **15,402** | **16,799** |
| නොමිලේ පෙළපොත් | 3,288 | 3,877 |
| නොමිලේ පාසැල් නිල ඇඳුම් | 1,184 | 920 |
| පාසැල් වාර ප්‍රවේශ පත්‍ර | 4,923 | 4,009 |
| පාසැල් පෝෂ්‍යදායී ආහාර | 3,721 | 4,751 |
| පාසැල් ළමුන් සඳහා කිරි වීදුරුවක් | 212 | 374 |
| දුෂ්කර හා අති දුෂ්කර ප්‍රදේශවල පාසැල් සිසුන් සඳහා පාවහන් | 220 | 208 |
| පහ වසර ශිෂ්‍යාධාර | 310 | 217 |
| මහපොළ ශිෂ්‍යාධාර | 528 | 1,292 |
| ශිෂ්‍යාධාර | 358 | 605 |
| දහම් පාසල් සිසුන් සඳහා පෙළපොත් | 191 | 57 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | 34 | 93 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා ආධාර කිරීම | 433 | 397 |
| **ජීවනෝපාය ආධාර** | **61,034** | **60,927** |
| පොහොර සහනාධාරය | 22,445 | 23,881 |
| පොහොර සහනාධාරය (වැව්ලි) | 1,115 | 69 |
| සමෘද්ධි සහනාධාරය | 36,440 | 36,008 |
| නැවත වගා කිරීම සඳහා ණය සහනාධාර (තේ - රබර්) | 954 | 770 |
| අපනයන භෝග සංවර්ධනය සඳහා ගොවීන්ට ආධාර කිරීම | 80 | 199 |
| **සමාජ සුභසාධන සහ ආරක්ෂක ජාලය** | **46,744** | **50,252** |
| ආබාධිත පුද්ගලයින්ට සහ වකුගඩු රෝගීන්ට ආධාර කිරීම | 1,754 | 2,236 |
| වැඩිහිටි පුද්ගලයින්ට ආධාර කිරීම | 8,262 | 8,773 |
| ආබාධිත රණවිරුවන්ට ආධාර කිරීම | 25,459 | 27,734 |
| රණවිරු දෙමාපියන්ට සමාජ රැකවරණය | 2,197 | 2,187 |
| ගංවතුර සහ නියං සහනාධාර ලෙස ආහාර සහනාධාර | 4,072 | 4,393 |
| පාඩු ලබන මාර්ගයන් හි බස් රථ සේවාවන් | 5,000 | 4,929 |
| **එකතුව** | **161,529** | **174,812** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

## රාජ්‍ය ආයෝජනය

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී මහාමාර්ග, ජල සැපයුම, වාරිමාර්ග, ප්‍රවාහනය, කෘෂිකර්මය, සෞඛ්‍ය සහ අධ්‍යාපන අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළත්ව රාජ්‍ය ආයෝජනය සඳහා වන වියදම රු. බිලියන 496 ක් වූ අතර, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එය රු. බිලියන 478 ක් විය.

**ණය ආපසු ගෙවීම**

රාජ්‍ය සම්පත් වලින් ප්‍රධාන කොටස ණය ආපසු ගෙවීම සඳහා අඛණ්ඩව භාවිතා විය. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී එම අගය රු. බිලියන 1,195 ක් වූ අතර 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එය රු. බිලියන 832 ක් වූ අතර එය සියයට 43.6 ක වැඩි වීමකි. මෙයින්, රු. බිලියන 929 ක් දේශීය ණය සඳහා වැය වූ අතර, විදේශීය ණය සඳහා වැයවූ මුදල රු. බිලියන 266 කි.

## 1.4 භාණ්ඩාගාර මෙහෙයුම්

### මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහයේ කාර්ය සාධනය

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී මහා භාණ්ඩාගාරයේ ආදායම් සහ අනෙකුත් ප්‍රභවයන්ගෙන් මුදල් ලැබීම් රු. බිලියන 1,766 ක් විය. එම ලැබීම් 2017 වසරේ අනුරූපී කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 1,600 ට වඩා සියයට 10.0 ක වැඩිවීමකි. මෙම කාලපරිච්ඡේදය තුළ පුනරාවර්තන සහ රාජ්‍ය ආයෝජන සඳහා ප්‍රාග්ධන වියදම් ද ඇතුළුව වූ සමස්ත මුදල් ගලායාම් පසුගිය වසරට සාපේක්ෂව රු. බිලියන 2,165 සිට රු. බිලියන 2,394 දක්වා සියයට 10.6 කින් ඉහළ ගොස් තිබිණි. 2018 වසරේ නොවැම්බර් මස 30 වන දිනට මුළු මුදල් හිඟය රු. බිලියන 628 ක් ලෙස වාර්තා වූ අතර එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති හිඟය වූ රු. බිලියන 559 ට සාපේක්ෂව සියයට 12.4 ක වැඩිවීමකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ භාණ්ඩාගාරයට මුදල් ගලා ඒම් සියයට 10.0 කින් ඉහළ ගියද, මූලධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් පිටතට ගලායාම් සියයට 16.8 කින් ඉහළ යාමයි. ප්‍රධාන වශයෙන් මෙහෙයුම් වියදම් වැඩිවීම හේතුවෙන් 2017 වසරේ නොවැම්බර් මස 30 වන දිනට පැවති මුදල් සහ බැංකු ශේෂයට සාපේක්ෂව 2018 වසරේ නොවැම්බර් මස 30 වන දිනට රු. බිලියන 225.3 ක් දක්වා වැඩි වී ඇත.

**1.15 වගුව | රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

*රු. බිලි.*

| අයිතමය | 2017<br>ජන. - නොවැ.<br>තත්‍ය | 2018<br>ජන. - නොවැ.<br>ඇස්තමේන්තු | 2018<br>ජන. - නොවැ.<br>තත්‍ය |
|---|---|---|---|
| ආරම්භක මුදල් ශේෂය (ජනවාරි මස 01 වන දිනට) | (160.3) | (186.2) | (186.2) |
| ආදායම් හා වෙනත් ලැබීම් මඟින් සමස්ත මුදල් ගලා ඒම | 1,606.2 | 1,952.8 | 1,766.1 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ත මුදල් ගලා යාම | (1,695.7) | (1,954.7) | (1,845.8) |
| ආයෝජන කටයුතු සඳහා සමස්ත මුදල් ගලා යාම | (469.5) | (760.1) | (548.5) |
| ශුද්ධ මුදල් අතිරික්තය/ (හිඟය) | (559.0) | (762.0) | (628.2) |
| දළ ණය ගැනීම්* | 1,363.8 | 1,822.4 | 1,782.2 |
| ණය ආපසු ගෙවීම් | (834.4) | (1,116.2) | (1,191.1) |
| ශුද්ධ ණය ගැනීම් | 529.4 | 706.2 | 591.1 |
| (තාවකාලික ශේෂ ගැලපීම් ගිණුමේ ශේෂය (TEB) ශුද්ධ තැන්පතු යනාදිය.) | 9.7 | - | (2.0) |
| අවසාන මුදල් ශේෂය නොවැම්බර් මස 30 වන දිනට | (180.2) | (242.0) | (225.3) |

*මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

**CS-DRMS හි වාර්තා කර ඇති 2018.11.30 දින දක්වා රජයට ලැබුන වැඩසටහන් සහ ව්‍යාපෘති ණය ඇතුළත් වේ*

**රාජ්‍ය ණය කළමනාකරණය**

2018 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත මුළු ණය සීමාව රු. බිලියන 1,893.8 ක් වන අතර මෙම වසරේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ රජයේ ණය ගැනීම් රු. බිලියන 1,782.2 ක් විය. සමස්ත ණය සීමාව තුළ දේශීය ණය වශයෙන් රු. බිලියන 1,078.1 ක් ද විදේශීය ණය වශයෙන් රු. බිලියන 704.1 ක් ද ලබාගන්නා ලද අතර, මෙම ණය මුදල් මෙහෙයුම් සහ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් උපයෝජනය කර ඇත. 2018 වසරේ රජයේ දේශීය ණය ගැනීම් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මූලාශ්‍රයන්ගෙන් ලබාගෙන ඇත. ඒ අනුව, මුළු දේශීය ණය වලින් සියයට 65.0 ක් පමණ භාණ්ඩාගාර බැඳුම්කර මඟින් රැස්කර ගන්නා ලද අතර, සමස්ත දේශීය ණය වලින් සියයට 22.0 ක් ශ්‍රී ලංකා සංවර්ධන

බැඳුම්කර මගින් ලබාගන්නා ලදී. තවද, 2018 වසර ආරම්භයේ දී විදේශ විනිමය මගින් වූ ණය සේවාකරණ සඳහා දේශීය ණය ගැනීම් ද භාවිතා කරන ලද අතර දෙවන කාර්තුවේ දී නිකුත්කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර විදේශ ණය පියවීම සඳහා උපයෝගී කරගන්නා ලදී. 2018 වසරේ නොවැම්බර් මස 30 දිනට ශුද්ධ ණය ගැනීම් රු. බිලියන 591.1 ක් ලෙස පෙන්නුම් කරයි.

**1.16 වගුව | දළ දේශීය ණය මූලාශ්‍ර අනුව**

*රු. බිලි.*

| මූලාශ්‍ර | 2018 ජන. - නොවැ. |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 705.6 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 234.1 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය | 62.4 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 51.0 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 25.0 |
| **එකතුව** | **1,078.1** |

*මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

**රූපසටහන 1.4 | මූලාශ්‍ර අනුව දළ දේශීය ණය 2018 ජන. - නොවැ.**




### භාණ්ඩාගාර ඇපකර මත වන වගකීම් හෙළිදරව් කිරීම

2018 වසරේ නොවැම්බර් මස 30 වන දිනට නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර වල වටිනාකම 2016 අංක 13 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරන (වගකීම) පනතේ (සංශෝධිත) දෙවන වගන්තිය අනුව 2018 වසර වන විට රු. බිලියන 1,076.9 ක් වශයෙන් අදාල සීමාව තුළ නිකුත් කර ඇත.

## 1.5 විදේශ මූල්‍යයනය

### විදේශ මූල්‍යයන එකඟතා

රාජ්‍ය ආයෝජන වැඩසටහන සහ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව මගින් ළඟා කරගත යුතු ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය විදේශ මූල්‍යයනයන් සම්පාදනය කිරීම සඳහා රජය විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණය දෙන ආයතන සමග 2018 වසරේ ජනවාරි මස 1 වන දින සිට නොවැම්බර් මස 30 වන දින දක්වා එකඟතා ගිවිසුම් තිස් පහක් මඟින් ඇ.ඩො. මිලියන 1,131.2 ක එකඟතා ඇතිකරගෙන ඇත. මෙයින් ඇ.ඩො. මිලියන 1,058.7 ක් ව්‍යාපෘති ණය එකඟතා ගිවිසුම් අනුව මූල්‍යයනය වන අතර, ඉතිරි ඇ.ඩො. මිලියන 72.5 ක ප්‍රමාණය ප්‍රදාන එකඟතා ගිවිසුම් අනුව මූල්‍යයනය වේ.

2018 වසරේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ඇතිකරගත් එකඟතා වලින් ආසියානු සංවර්ධන බැංකුව ඉහළම එකඟතා ප්‍රමාණයක් පළකරන ලද සංවර්ධන පාර්ශ්වකරු වන අතර, එම ප්‍රමාණය ඇ.ඩො. මිලියන 438.0 කි. අනතුරුව, ඉහළ එකඟතා ප්‍රමාණයක් අත්සන් කර ඇති ප්‍රධාන සංවර්ධන පාර්ශ්වකරුවන් අතර පිළිවෙළින් ලෝක බැංකුව ඇ.ඩො. මිලියන 104.0 ක් ද, ජපානය ඇ.ඩො. මිලියන 98.2 ක් ද සහ චීනය ඇ.ඩො. මිලියන 85.0 ක් ද වන ලෙස එකඟතා පළ කර ඇත. සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ලබාගත් මෙම තිල සංවර්ධන සහයෝගීතාවන්ට අමතරව, රජය විසින් මෙම කාලපරිච්ඡේදයේ දී ඇ.ඩො. මිලියන 1,250.0 බැගින් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කරන ලදී. එය පිළිවෙළින් සියයට 5.75 ක් හා සියයට 6.75 ක වාර්ෂික පොළී අනුපාතිකයන්ගෙන් ද වසර 5 සහ

10 බැගින් වූ පරිණත කාලපරිච්ඡේදයකින් ද සමන්විත වේ. එසේම, රජය විසින් ඇ.ඩො. මිලියන 1,000 ක විදේශ විනිමය කාලීන ණයක් ද ලබාගෙන ඇත.

එක් එක් අංශ අනුව සැළකීමේ දී, 2018 වසරේ තෙවන කාර්තුව වන විට විවිධ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා ඇතිකරගත් එකඟතාවන්ගෙන් ඉහළම ප්‍රමාණය පිළිවෙළින් අධ්‍යාපනය හා පුහුණු අංශය සඳහා ඇ.ඩො. මිලියන 269.0 ක් ද, පරිසර අංශය සඳහා ඇ.ඩො. මිලියන 210.0 ක් ද, සෞඛ්‍ය හා සමාජ සුභසාධන අංශය සඳහා ඇ.ඩො. මිලියන 157.1 ක් ද, මාර්ග හා පාලම් අංශය සඳහා ඇ.ඩො. මිලියන 144.1 ක් ද, දුම්රිය අංශය සඳහා ඇ.ඩො. මිලියන 79.8 ක් ද, සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය අංශය සඳහා ඇ.ඩො. මිලියන 75.0 ක් ද ලෙස එකඟතා ඇතිකර ගෙන ඇත.

**රූපසටහන 1.5 | අංශ අනුව නිල සංවර්ධන පාර්ශවකරුවන් සමග ඇතිකරගත් එකඟතා 2018 ජන. - නොවැ. (ඇ.ඩො. මිලියන)**



**වගුව 1.17 | විදේශ මූල්‍යයන එකඟතා සහ අදාළ මූල්‍ය කොන්දේසි - 2018 ජනවාරි සිට නොවැම්බර්**

| සංවර්ධන පාර්ශ්වකරු/ ණයහිමි ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය (වර්ෂය, මාසය, දිනය) | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය විස්තරය | විනිමය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | ණය කොන්දේසි | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | මූල්‍ය කොන්දේසි | | | | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ශ්‍රේණිගත කාලයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | පොළිය | | | වෙනත් ගාස්තු | | |
| | | | | | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | එ.ජ. ඩොලර් | වර්ගය | පාදක අනුපාතය (ප්‍රතිශතයට) | ආන්තිකය (ප්‍රතිශත අංක ප්‍රතිශතයට) | | | |
| **ද්විපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගීතා** | | | | | | | | | | | | | |
| ඔස්ට්‍රේලියාව | ප්‍රදාන | 2018.01.30 | උප ගිවිසුම (ඔස්ට්‍රේලියානු රජයේ මූල්‍යාධාර යටතේ, වර්ධනය සඳහා යහපාලනය වැඩසටහන ක්‍රියාත්මක කිරීම) | ඔස්ට්‍රේලියානු ඩොලර් | 31.0 | 3,850.90 | 25.0 | අදාළ නොවේ | | | | | 3 |
| ප්‍රංශය | ණය | 2018.10.17 | හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ප්‍රායෝගික වැඩසටහන (දෙවන අදියර) | යූරෝ | 30.0 | 5,930.90 | 34.7 | විචල්‍ය | EURIBOR | 1.2 | පොරොන්දු ගාස්තු 0.5%, තක්සේරු ගාස්තු 0.5% | 5 | 20 |
| | ණය | 2018.09.28 | කුඩා පරිමාණ කිරි නිෂ්පාදන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ ප්‍රංශ සහන ණය | යූරෝ | 13.9 | 2,739.60 | 16.2 | ස්ථාවර | 0.0016 | අදාල නොවේ | නැත | 10 | 34 |
| ජපානය | ප්‍රදාන | 2018.06.26 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය | යෙන් | 265.0 | 384.20 | 2.4 | අදාළ නොවේ | | | | | 3 |
| | ණය | 2018.07.11 | සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | යෙන් | 10,639.0 | 15,260.60 | 95.8 | ස්ථාවර | උපයෝජිත කාලසීමාව තුළ 0.1, ආපසු ගෙවන කාලසීමාව තුළ 0.01 | අදාළ නොවේ | අයකරන ගාස්තුව යෙන් මිලියන 10.6 | 12 | 40 |
| කොරියානු ජනරජය | ප්‍රදාන | 2018.05.15 | කිළිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් | 7.5 | 1,184.40 | 7.5 | අදාළ නොවේ | | | | | 3 |
| | ණය | 2018.06.28 | ශ්‍රී ලංකාවේ දකුණු පළාත සඳහා කසළ අපහරණ රථ සැපයීම | එ.ජ. ඩොලර් | 7.0 | 1,110.70 | 7.0 | පොළී රහිත | | | - | 10 | 30 |
| | ණය | 2018.06.28 | ශ්‍රී ලංකාවේ උතුරු හා මධ්‍යම පළාත් සඳහා කසළ අපහරණ රථ සැපයීම | එ.ජ. ඩොලර් | 7.0 | 1,110.70 | 7.0 | පොළී රහිත | | | - | 10 | 30 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| චීනය | ණය | 2018.06.07 | කිලෝමීටර් 64.3 ක මාර්ගය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සහ මධ්‍යම සහ ඌව පළාත්වල පාලම් 13 ක් ප්‍රතිසංස්කරණය කිරීම | එ.ජ. ඩොලර් | 85.0 | 13,482.30 | 85.0 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා හය මාසික LIBOR | 2.9 | පොරොන්දු ගාස්තු 0.5%, කළමනාකරණ ගාස්තු | 3 | 18 |
| හොංකොං සහ ෂැංහයි බැංකු ආයතනය (හොංකොං) | ණය | 2018.04.27 | ශ්‍රී ලංකා දුම්රිය සේවයේ උඩරට දුම්රිය මාර්ගය සඳහා ඩීසල් දුම්රිය කට්ටල 09ක් ප්‍රසම්පාදනය කිරීම | එ.ජ. ඩොලර් | 79.8 | 12,578.20 | 79.8 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා හය මාසික LIBOR | 2.0 | ණය රක්ෂණ වාරිකය එ.ජ.ඩොලර් මිලියන 2.2<br>සැකසීමේ ගාස්තුව එ.ජ.ඩොලර් 877,665.87, පොරොන්දු ගාස්තු 0.5% | 1 | 13.5 |
| ඇමරිකා එක්සත් ජනපදය | ප්‍රදාන | 2018.01.30 | සමාජ ඒකාබද්ධතාව හා ප්‍රජාතාන්ත්‍රික පාලනය සඳහා ශක්තිමත් සබඳතාවක් ගොඩනැගීම | එ.ජ. ඩොලර් | 9.7 | 1,487.10 | 9.7 | | අදාළ නොවේ | | | | 10 |
| | ප්‍රදාන | 2018.01.30 | තිරසාර හා සවිමත් ආර්ථික වර්ධනය | එ.ජ. ඩොලර් | 8.2 | 1,263.00 | 8.2 | | අදාළ නොවේ | | | | 9 |
| ඉන්දියාව | ණය | 2018.01.10 | කන්සකන්තුරෙයි වරාය සඳහා ඩොලර් ණය මාලාව | එ.ජ. ඩොලර් | 45.3 | 6,963.40 | 45.3 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා හය මාසික LIBOR | - | නැත | 1 | 15 |
| ඔස්ට්‍රියාව | ණය | 2018.03.08 | කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | යූරෝ | 10.5 | 2,019.40 | 13.0 | | පොළී රහිත | | පොරොන්දු ගාස්තු 0.4%, කළමනාකරණ ගාස්තු යූරෝ 47,185.25, මෙහෙයුම් ගාස්තු යූරෝ 1,440, මූලික ගෙවීම් යූරෝ 58,981.6 | 6.5 | 15 |
| | ණය | 2018.04.12 | ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශයේ රසායනාගාර හා වෛද්‍ය උපකරණ සැපයීම සහ ස්ථාපනය කිරීම | යූරෝ | 4.9 | 949.10 | 6.1 | | පොළී රහිත | | කළමනාකරණ ගාස්තු යූරෝ 22,176.0, මෙහෙයුම් ගාස්තු යූරෝ 1,440, මූලික ගෙවීම් යූරෝ 7,500.0 | 6 | 18 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සෞදි අරාබිය | ණය | 2018.07.18 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය (අමතර මූල්‍යය) | සෞදි රියාල් | 60 | 2,531.90 | 15.8 | විචල්‍ය | 2 | අදාළ නොවේ | නැත | 5 | 25 |
| හංගේරියාව | ණය | 2018.06.26 | ලබුගම ජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම | යුරෝ | 0.037 | 7.00 | 0.04 | ස්ථාවර | 1.03 | අදාළ නොවේ | නැත | 8 | 20 |
| නෙදර්ලන්තය | ණය | 2018.05.23 | ඔස්ට්‍රියානු සහන ණය යෝජනා ක්‍රමය යටතේ ශල්‍යාගාර සහ දැඩි සත්කාර ඒකකයේ උපකරණ වැඩි දියුණු කිරීම | යුරෝ | 9.6 | 1,780.50 | 11.3 | විචල්‍ය | හය මාසික EURIBOR | 1.0 | පොරොන්දු ගාස්තු 0.4%, කළමනාකරණ ගාස්තු යුරෝ 38,350.2, මූලික ගෙවීම් යුරෝ 17,976.7, මෙහෙයුම් ගාස්තු යුරෝ 1,440 | 5.6 | 18 |
| | ණය | 2018.11.26 | ග්‍රාමීය පාලම් ප්‍රතිසංස්කරණය කිරීම (යුරෝ මිලි. 44.6) | යුරෝ | 7.8 | 1590.00 | 8.7 | විචල්‍ය | හය මාසික EURIBOR | 4.0 | කළමනාකරණ ගාස්තු යුරෝ 39,089.5 | 3.5 | 4.4 |
| **බහුපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගීතා** | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 2018.02.16 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ණය මාලාව (අමතර මූල්‍යය) | එ.ජ. ඩොලර් | 75 | 11,649.30 | 75.0 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා හය මාසික LIBOR | 0.6 | පොරොන්දු ගාස්තු 0.15% | 11 | 11 |
| | ප්‍රදාන | 2018.05.11 | නිපුණතා අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන | එ.ජ. ඩොලර් | 3.0 | 473.60 | 3.0 | | | අදාළ නොවේ | | | 0 |
| | ප්‍රදාන | 2018.10.26 | සෞඛ්‍ය අංශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් | 12.5 | 2,160.30 | 12.5 | | | අදාළ නොවේ | | | 4.8 |
| | ණය | 2018.05.18 | මහවැලි ජල සුරැකුම් ආයෝජන වැඩසටහන - ණය කොටස 2 | එ.ජ. ඩොලර් | 179.0 | 28,293.90 | 179.0 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා හය මාසික LIBOR | 0.7 | පොරොන්දු ගාස්තු 0.15% | 5 | 19 |
| | ණය | 2018.05.18 | මහවැලි ජල සුරැකුම් ආයෝජන වැඩසටහන - ණය කොටස 2 | එ.ජ. ඩොලර් | 31.0 | 4,900.10 | 31.0 | ස්ථාවර | 2 | අදාළ නොවේ | නැත | 5 | 24 |
| | ණය | 2018.05.11 | නිපුණතා අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අමතර මූල්‍යකරණය | එ.ජ.ඩොලර් | 60.0 | 9,472.70 | 60.0 | ස්ථාවර | 2 | අදාළ නොවේ | නැත | 5 | 25 |
| | ණය | 2018.05.11 | නිපුණතා අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අමතර මූල්‍යකරණය | එ.ජ. ඩොලර් | 40.0 | 6,315.20 | 40.0 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා හය මාසික LIBOR | 0.7 | පොරොන්දු ගාස්තු 0.15% | 5 | 20 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ණය | 2018.05.23 | ඔස්ට්‍රියානු සහන ණය යෝජනා ක්‍රමය යටතේ ශල්‍යාගාර සහ දැඩි සත්කාර ඒකකයේ උපකරණ වැඩි දියුණු කිරීම | යුරෝ | 9.6 | 1780.50 | 11.3 | විචල්‍ය | හය මාසික EURIBOR | 1 | පොරොන්දු ගාස්තු 0.4%, කළමනාකරණ ගාස්තු යුරෝ 38,350.2, මූලික ගෙවීම් යුරෝ 17,976.7, මෙහෙයුම් ගාස්තු යුරෝ 1,440 | 5.6 | 18 |
| | ණය | 2018.10.26 | සෞඛ්‍ය අංශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් | 37.5 | 6,481.00 | 37.5 | ස්ථාවර | 2 | අදාළ නොවේ | නැත | 2.6 | 12.5 |
| අන්තර්ජාතික සංවර්ධන සමායතනය | ණය | 2018.07.25 | පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් | 100.0 | 15,947.50 | 100.0 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා හය මාසික LIBOR | 1.5 | පොරොන්දු ගාස්තු 0.25% | 6 | 22 |
| ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව | ණය | 2018.01.30 | PPF - වැඩසටහන සකස් කිරීමේ පිළිවෙළ අංක. P4940 | එ.ජ. ඩොලර් | 4.0 | 615.10 | 4.0 | | | අදාළ නොවේ | | | 2 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | ණය | 2018.01.26 | කුඩා තේ වතු කෘෂි ව්‍යාපාර හවුල්කරණ (SAP) වැඩසටහන ක්‍රියාත්මක කිරීම (අමුදල් ඉහළ නැංවීම) | එ.ජ. ඩොලර් | 6.2 | 950.10 | 6.2 | ස්ථාවර | 2 | අදාළ නොවේ | නැත | 5 | 24 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | ප්‍රදාන | 2018.08.15 | විද්‍යුත් කෘෂි පරිසරය ශක්තිමත් කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මත පදනම් වූ කෘෂි විසඳුම් සංවර්ධනය කිරීම | එ.ජ. ඩොලර් | 0.1 | 15.40 | 0.1 | | | අදාළ නොවේ | | | - |
| එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය | ප්‍රදාන | 2018.01.01 | කිලිනොච්චි, පුත්තලම සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වල නැවත පදිංචි කරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙත ප්‍රවේශ කරවීම | ශ්‍රී ලංකා රුපියල් | 1.9 | 1.90 | 0.01 | | | අදාළ නොවේ | | | 1 |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | ප්‍රදාන | 2018.01.26 | දේශීය වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්ම 2018 - 2022 | එ.ජ. ඩොලර් | 4.0 | 615.70 | 4.0 | | | අදාළ නොවේ | | | 5 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | ණය | 2018-07-03 | තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන වැඩසටහන | එ.ජ. ඩොලර් | 50 | 7,922.20 | 50.0 | ස්ථාවර | 2.5 | අදාළ නොවේ | නැත | 5 | 20 |
| **වෙළඳපල ණය** | | | | | | | | | | | | | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව | ණය | 2018-04-18 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව - 2018 | එ.ජ. ඩොලර් | 1,250.0 | 195,413.4 | 1,250.0 | ස්ථාවර | 5.75 | අදාළ නොවේ | නැත | 5 | 5 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව | ණය | 2018-04-18 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව - 2018 | එ.ජ. ඩොලර් | 1,250.0 | 195,413.4 | 1,250.0 | ස්ථාවර | 6.75 | අදාළ නොවේ | නැත | 10 | 10 |
| විදේශ විනිමය කාලීන ණය | ණය | 2018-10-12 | විදේශ විනිමය කාලීන ණය පහසුකම 2018 | එ.ජ. ඩොලර් | 1,250.0 | 171,346.6 | 1,250.0 | විචල්‍ය | එ.ජ. ඩොලර් සඳහා LIBOR | 2.56 | මූලික ගෙවීම් 1.25% | 3 | 8 |
| **එකතුව** | | | | | | **743,220.60** | **4,871.44** | | | | | | |

මූලාශ්‍රය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන්: 1. LIBOR - ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ EURIBOR - යුරෝපා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය
2. එක් එක් වලංගු මුදල් ඇමරිකානු ඩොලර් වලට පරිවර්තනය කිරීම සඳහා ගිවිසුම්ගත දිනයට පවත්නා විනිමය අනුපාතිකයන් යොදාගෙන තිබේ

## විදේශ මූල්‍යයන උපයෝජනයන්

2018 වසරේ ජනවාරි මස පළමුවන දින සිට නොවැම්බර් මස තිස්වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුවූ විදේශ මූල්‍යයන උපයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,353.5 කි. මෙයින් ඇ.ඩො. මිලියන 1,332.7 ක් ණය මගින් මූල්‍යයනය වූ ව්‍යාපෘති සහ වැඩසටහන් වල උපයෝජනය වී ඇති අතර, ඉතිරි ඇ.ඩො. මිලියන 20.8 ක් ප්‍රදාන මගින් මූල්‍යයනය වන ව්‍යාපෘති සහ වැඩසටහන් වල උපයෝජනය වී ඇත. මෙම උපයෝජන වලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදුන් මූල්‍ය පහසුකම් වන අතර, එය මුළු ප්‍රමාණයෙන් සියයට 29.6 ක් පමණ වේ. අනතුරුව, ඉහළ ප්‍රමාණයක් ලබා දී ඇත්තේ පිළිවෙළින් චීනය සියයට 26.4 ක් ද, ජපානය සියයට 11.4 ක් ද සහ ලෝක බැංකුව සියයට 11.3 ක් ද වශයෙනි.

**වගුව 1.18** | සංවර්ධන පාර්ශවකරුවන් විසින් නිල සංවර්ධන සහයෝගිතා ලෙස සිදු කරන ලද ප්‍රතිලබ්ධි 2018 ජනවාරි සිට නොවැම්බර්

| සංවර්ධන පාර්ශවකරු/ණය දෙන ආයතනය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (ඇ.ඩො. මිලියන)(අ) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශික** | **755.6** | **17.6** | **773.2** |
| චීන අපනයන ආනයන බැංකුව | 316.5 | - | 316.5 |
| ජපානය | 139.9 | 14.4 | 154.3 |
| ප්‍රංශයේ Calyon Credit Agricole CIB ආයතනය | 56.9 | - | 56.9 |
| ඉන්දියාව | 44.7 | - | 44.7 |
| සහයෝගීතාව සඳහා වූ චීන සංවර්ධන බැංකුව | 40.6 | - | 40.6 |
| නෙදර්ලන්තයේ Co-op Centrale Raiffeisen-Boerenleen Bank ආයතනය | 31.6 | - | 31.6 |
| අරාබි ආර්ථික සහයෝගීතාව සඳහා වූ සෞදි අරමුදල | 16.9 | - | 16.9 |
| ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 14.9 | - | 14.9 |
| එක්සත් රාජධානියේ ඩොයිෂ් බැංකුව AG ආයතනය | 14.4 | - | 14.4 |
| හොංකොං සහ ෂැංහයි බැංකු ආයතනය (හොංකොං) | 14.1 | - | 14.1 |
| කුවේටය | 14.0 | - | 14.0 |
| ඔස්ට්‍රියාවේ Raiffeisen Zentral Bank ආයතනය | 13.8 | - | 13.8 |
| කොරියානු ජනරජය | 10.2 | - | 10.2 |
| ඇ.එ.ජ. අපනයන ආනයන බැංකුව | 9.4 | - | 9.4 |
| හොංකොං සහ ෂැංහයි බැංකු ආයතනය (ඩෙන්මාර්කයේ EKF ඇපකරය සහිතව) | 7.9 | - | 7.9 |
| ස්පාඤ්ඤය | 3.9 | - | 3.9 |
| ඇමරිකා එක්සත් ජනපදය | - | 2.9 | 2.9 |
| ජර්මනිය | 2.5 | - | 2.5 |
| ඔස්ට්‍රියාවේ යුනික්‍රෙඩිට් බැංකුව AG ආයතනය | 1.2 | - | 1.2 |
| Export Finance & Insurance Corporation ආයතනය | 1.0 | - | 1.0 |
| Banco Bilbao Vizcaya Argentaria S.A. ආයතනය | 1.0 | - | 1.0 |
| ප්‍රංශය | - | 0.3 | 0.3 |
| බෙල්ජියමේ KBC බැංකු ආයතනය | 0.3 | - | 0.3 |
| හංගේරියානු අපනයන ආනයන බැංකුව | 0.04 | - | 0.04 |
| **බහුපාර්ශවීක** | **577.1** | **3.2** | **580.3** |
| ආසියානු සංවර්ධන බැංකුව | 400.8 | - | 400.8 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | 125.5 | - | 125.5 |
| ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව | 27.7 | - | 27.7 |
| අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 19.6 | - | 19.6 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල | 3.5 | - | 3.5 |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | - | 1.8 | 1.8 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | - | 0.6 | 0.6 |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | - | 0.6 | 0.6 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | - | 0.2 | 0.2 |
| එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය | - | 0.01 | 0.01 |
| **එකතුව** | **1,332.7** | **20.8** | **1,353.5** |

*මූලාශ්‍රය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන: එක් එක් විදේශ විනිමයන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ. ඩොලර් සහ රුපියල් බවට පරිවර්තනය කිරීමේ දී 2018 වසරේ නොවැම්බර් මස 30 වන දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත*

*(අ) තාවකාලික*

විමසුමට ලක්වන කාලපරිච්ඡේදයේ සිදු වූ උපයෝජන අතරින් මාර්ග හා පාළම් අංශය සඳහා ඉහළම උපයෝජනය සිදුවූ අතර, එය මුළු උපයෝජන ප්‍රමාණයෙන් සියයට 39.0 ක් පමණ වේ. ජල සම්පාදන හා සනීපාරක්ෂාව සඳහා සියයට 14.0 ක් ද සහ මූල්‍ය හා රාජ්‍ය පාලන සඳහා සියයට 9.0 ක් ද වශයෙන් සැලකියයුතු ලෙස එම අංශයන් හි උපයෝජනය වී ඇත.

**රූපසටහන 1.6 | අංශ අනුව සිදු කරන ලද උපයෝජන (එ.ජ. ඩොලර් මිලියන) 2018 ජන. - නොවැ.**




වෙනත්: ආරක්ෂක, ප්‍රවාහන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, සෞඛ්‍ය හා සමාජ සුබසාධන, කම්කරු හා වෘත්තීය පුහුණු, පශු සම්පත් සංවර්ධනය, ආපදා කළමනාකරණය, පරිසරය, කෘෂිකර්මය සහ මානුෂීය ආධාර

## එකඟ වූ උපයෝජනය නොවූ ශේෂය සහ විදේශ මූල්‍යන උපයෝගීතාව

දැනට එකඟතා පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වසර තුනත් පහත් අතර කාලපරිච්ඡේදය තුළ විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන වල ශේෂය 2018 වසරේ නොවැම්බර් මස 30 දිනට ඇ.ඩො. මිලියන 8,332.9 ක් විය.

**රූපසටහන 1.7 | සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල එකඟ වූ උපයෝජනය නොවූ ශේෂය 2018 නොවැම්බර් දක්වා**




සටහන: රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ඇතිකරගත් එකඟතා අනුව සිදුවීමට නියමිත ප්‍රතිලබ්ධි අඩංගු නොවේ. මෙම අගයන් ගණනය කර ඇත්තේ 2018 නොවැම්බර් 30 දින පැවති විනිමය අනුපාතිකයන් අනුව වේ.

## විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය

2018 වසරේ නොවැම්බර් මස 30 වන දිනට රජය ලබාගත් ණය සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 32.4[1] කි. තවද, 2018 වසරේ ජනවාරි මස 1 වන දින සිට නොවැම්බර් මස 30 වන දින දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 2,352.4 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 1,397.7 ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 954.7 ක් පොළී ගෙවීම සඳහා යොදවා ඇත.

---

[1] *රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් විදේශ ණය හා අනේවාසික භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර අන්තර්ගත නොවේ. හම්බන්තොට වරාය සංවර්ධනය වෙනුවෙන් පියවීමට ඇති විදේශ ණය අන්තර්ගත වේ*

[2] *මුළු ණය සේවාකරණය = පොළී ගෙවීම් + ණය වාරික ආපසු ගෙවීම්, තාවකාලික අගයයන්*

# ගෝලීය සන්දර්භය තුළ ආර්ථිකය

# 02

## 2.1 සමාලෝචනය

2018 වසරේ පළමු කාර්තු තුනේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 3.3 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා අංශ වල ක්‍රියාකාරිත්වය තවදුරටත් ව්‍යාප්ත වීම ඉන් පිළිඹිබු විය. 2018 වසරේ තෙවන කාර්තුවේ දී සේවා වියුක්ති අනුපාතය සියයට 4.1 ක් දක්වා ආන්තිකව අඩු වී ඇත. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන වාර්ෂික ලක්ෂමය පදනම මත උද්ධමනය, ඉන්ධන මිල පහතට ගැලපුමත් සහ තෝරාගත් භාණ්ඩ වල තීරණ මිලත් හේතුවෙන් 2018 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 3.3 ක් දක්වා පහත වැටී ඇත. මේ අතර, 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී පුද්ගලික අංශයේ ණය වර්ධනය සියයට 16.2 දක්වා වර්ධනය කරගැනීමට මහ බැංකුවේ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය උපකාර වී ඇත. 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී සමස්ත ගෙවුම් ශේෂය ඇ.ඩො. මිලියන 807 ක හිඟයක් වාර්තා වූ අතර, එමගින් රජයේ සුරැකුම්පත් සහ කොළඹ කොටස් හුවමාරු වෙළඳපලෙ හි සිදුවන විදේශ ආයෝජන ප්‍රවාහ ඉවතට ගලායාම වැඩි විය. මේ අතර, ලෝක ආර්ථික වර්ධනය අවදානම් තත්ත්වයකට ලක් වී එමගින් ශ්‍රී ලංකාව ඇතුළු නැගීඑන සහ දියුණු වෙමින් පවතින ආර්ථිකයන් කෙරෙහි බලපා ඇත.

## 2.2 ආර්ථික වර්ධනය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් මුහුණ දුන් අභියෝග මධ්‍යයේ ද 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී සියයට 3.3 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. අනුරූප කාලපරිච්ඡේදයේ දී දිවයිනේ සමහර ප්‍රදේශයන් හි පැවති යහපත් කාලගුණික තත්ත්වය හමුවේ වී, එළවළු සහ පළතුරු නිෂ්පාදන සමග ධීවර හා සත්ත්ව නිෂ්පාදන උප අංශයන්ගේ අගය එකතු කරන ලද නිෂ්පාදනයන්ගේ වර්ධනයත් සමග කෘෂිකාර්මික අංශය යථා තත්ත්වයට පත්විය. මේ අතර, තොග හා සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා, දේපල වෙළඳාම, ප්‍රවාහන, නවාතැන් සහ විදුලි සංදේශ යන අංශයන්ගේ වර්ධනය, සේවා අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් නිෂ්පාදන අංශයේ සිදු වූ මන්දගාමී වර්ධනය නිසා කර්මාන්ත අංශයේ වර්ධනයේ අඩුවීමක් දක්නට ලැබිණි. සේවා අංශය සියයට 59.0 ක් ද, කාර්මික අංශය සියයට 27.0 ක් ද, කෘෂිකාර්මික අංශය සියයට 7.0 ක් ද සහ සහනාධාර අඩු කළ පසු බදු ආදායම සියයට 7.0 ක් ද වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට දායක වී ඇත.

**රූපසටහන 2.1 | ද.දේ.නි. වර්ධනය**




### කෘෂිකර්මාන්තය

2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික අංශයේ සියයට 3.5 ක පසුබැම හා සසඳන කළ 2018 වසරේ එම කාලපරිච්ඡේදයේ දී පැවැති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සහල්, ධාන්‍ය, එළවළු, පළතුරු, කුළුබඩු නිෂ්පාදනය, සත්ව නිෂ්පාදනය සහ මිරිදිය ජලජීවී වගාව යන අංශයන් තුළින් කෘෂිකාර්මික අංශයේ සියයට 4.3 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී තේ, රබර්, සීනි හා අනෙකුත් බහුවාර්ෂික බෝග සහ මත්ස්‍ය නිෂ්පාදනය අඩු වී ඇත. සත්ත්ව නිෂ්පාදන අංශය 2017 වසරේ දී සමාන කාලපරිච්ඡේදය තුළ දී වූ සියයට 5.6 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී සියයට 4.4 ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, අගය එකතු කළ මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව යන උප අංශය සියයට 6.2 ක මධ්‍යස්ථ වර්ධනයක් ලඟා කරගෙන ඇත. කෙසේ වුවද, කරදිය මත්ස්‍ය කර්මාන්තය සහ ජලජීවී වගාව යන උප අංශයන් ගේ වර්ධනය සියයට 0.8 කින් අඩු වී ඇත.

රූප සටහන 2.2 | ද.දේ.නි. සංයුතිය
2018 පළමු කාර්තු තුන




## සහල්

2017/2018 වසර වල වී වගාව ආශ්‍රිත ප්‍රදේශ වල පැවති යහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් මහ කන්නයේ සහල් නිෂ්පාදනය, පසුගිය වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 2.4 ක් දක්වා සියයට 63.0 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. එමෙන්ම, 2019 වසරේ යල කන්නයේ සහල් නිෂ්පාදනය ද මෙට්‍රික් ටොන් මිලියන 1.4 දක්වා සියයට 57.0 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වපුරන ලද කුඹුරු ප්‍රමාණයෙන් සියයට 93.0 ක් හෙවත් හෙක්ටයාර 619,928 ක් මහ කන්නයේ දී අස්වනු නෙළීම සඳහා යොදා ගැනිණි. මහ කන්නයේ වී අස්වැන්න හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 4,302 ක් විය.

## තේ, පොල් සහ රබර් නිෂ්පාදනය

2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී තේ සහ රබර් උප අංශ පිළිවෙළින් සියයට 4.5 ක සහ 7.4 ක සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ, තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 222.1 ක දක්වා සියයට 4.7 කින් අඩු වී ඇති අතර, රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 58.9 දක්වා සියයට 9.0 කින් අඩු වී ඇත. කෙසේ වුවද, 2018 වසරේ පළමු කාර්තු තුනේ දී පොල් නිෂ්පාදනය පොල් ගෙඩි මිලියන 1,908 ලෙස නොවෙනස්ව පැවතුනි. තේ, රබර් සහ පොල් වලින් ලද අපනයන ආදායම පිළිවෙළින් ඇ.ඩො. මිලියන 1,093 දක්වා සියයට 4.1 කින් ද, ඇ.ඩො. මිලියන 25 දක්වා සියයට 20.3 කින් ද සහ ඇ.ඩො. මිලියන 238 දක්වා සියයට 12.8 කින් ද අඩු වී ඇත. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී මෙම නිෂ්පාදන වල අපනයන මිල ද පහත වැටී ඇත.

## ධාන්‍ය, එළවළු, පළතුරු, කුළු බඩු සහ ඖෂධීය බෝග වගාව

උඳු, බඩඉරිඟු, මුං ඇට, කව්පි, කුරක්කන් සහ මෙනේරි නිෂ්පාදන වැඩිවීමේ වාසිදායක තත්ත්වය හේතුවෙන් අගය එකතු කළ ධාන්‍ය නිෂ්පාදන 2018 වසරේ මුල් කාර්තු තුන තුළ දී සියයට 30.5 කින් වර්ධනය වී ඇති අතර 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 16.9 ක වර්ධනයට සාපේක්ෂව පුළුල් වී ඇත. මේ අතර, 2018 වසරේ මුල් කාර්තු තුන තුළ අගය එකතු කළ පළතුරු සහ එළවළු නිෂ්පාදනයේ වර්ධනය පිළිවෙළින් සියයට 5.6 ක් සහ 12.8 ක් විය. කුළු බඩු සහ ඖෂධීය බෝග නිෂ්පාදනය 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී සියයට 2.8 කින් වර්ධනය වී ඇත.

රූපසටහන 2.3 | කෘෂිකාර්මික අංශයේ සංයුතිය
2018 පළමු කාර්තු තුන




## ධීවර සහ පශු සම්පත්

2018 වසරේ පළමු කාර්තු තුනේ දී අගය එකතු කළ සත්ත්ව නිෂ්පාදන සහ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාවන් යන උප අංශ වල පිළිවෙළින් සියයට 4.4 ක සහ සියයට 6.2 ක වර්ධනයක් සිදුවී ඇත. කෙසේ වුවද, කරදිය ධීවර කර්මාන්තය හා ජලජීවී අංශ වල වර්ධනය 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 0.5 ක වර්ධනයට සාපේක්ෂව අනුරූප

කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.8 කින් හැකිලීමකට ලක්ව ඇත. සමස්ත කරදිය මත්ස්‍ය අස්වැන්න කිලෝ ග්‍රෑම් මිලියන 385.7 දක්වා සියයට 1.0 කින් අඩු වී ඇත. අස්වැන්න අඩු වුවද, මුහුදු ආහාර අපනයනය ඇ.ඩො. මිලියන 191 දක්වා සියයට 8.4 කින් වර්ධනය වී ඇත.

**2.1 වගුව | ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි. ආංශික සංයුතිය**

*රු. මිලි.*

| | අංශය | 2015(ආ) | 2016(ආ) | 2017(ආ) | පළමු කාර්තු 3 | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2017 | 2018(අ) | 2017 | 2018(අ) |
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **669,725** | **644,262** | **639,279** | **461,014** | **480,947** | **(3.5)** | **4.3** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 14,984 | 13,149 | 11,799 | 8,128 | 10,603 | (16.9) | 30.5 |
| 2 | වී වගාව | 76,293 | 52,387 | 50,269 | 21,003 | 32,215 | (40.6) | 53.4 |
| 3 | එළවළු වගාව | 56,730 | 58,705 | 49,198 | 33,612 | 37,930 | (22.8) | 12.8 |
| 4 | උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන බෝග | 1,882 | 2,168 | 1,863 | 1,511 | 1,334 | (13.8) | (11.7) |
| 5 | පළතුරු වගාව | 48,038 | 46,511 | 49,960 | 38,034 | 40,180 | 6.3 | 5.6 |
| 6 | තෙල් සහිත පළතුරු බෝග වගාව (පොල්, තැඹිලි සහ ෆාම් ඔයිල් වගාව) | 67,514 | 66,970 | 53,929 | 42,041 | 42,360 | (16.9) | 0.8 |
| 7 | තේ වගාව (Green Leaves) | 72,051 | 63,970 | 67,021 | 50,778 | 48,483 | 6.0 | (4.5) |
| 8 | වෙනත් පානීය බෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 1,259 | 1,354 | 1,268 | 951 | 1,000 | (6.4) | 5.2 |
| 9 | කුළුබඩු, සුවඳ දෙන බෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 60,797 | 62,197 | 62,500 | 46,889 | 48,190 | 1.0 | 2.8 |
| 10 | රබර් වගාව | 25,783 | 23,028 | 24,167 | 18,827 | 17,430 | 1.2 | (7.4) |
| 11 | වෙනත් බහුවාර්ෂික බෝග වගාව | 16,839 | 16,484 | 16,739 | 12,899 | 12,577 | 3.5 | (2.5) |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 51,857 | 55,629 | 57,810 | 42,949 | 44,841 | 5.6 | 4.4 |
| 13 | පැළ බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යන් | 10,421 | 10,210 | 10,250 | 7,817 | 8,156 | 1.1 | 4.3 |
| 14 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 48,362 | 52,669 | 64,261 | 48,743 | 48,810 | 20.1 | 0.1 |
| 15 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 104,413 | 105,094 | 103,038 | 76,878 | 76,261 | 0.5 | (0.8) |
| 16 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 12,503 | 13,735 | 15,208 | 9,955 | 10,576 | 9.4 | 6.2 |
| | **කර්මාන්ත** | **2,267,725** | **2,399,285** | **2,509,829** | **1,871,028** | **1,904,084** | **4.8** | **1.8** |
| 17 | පතල් හා කැණීම් කර්මාන්තය | 191,145 | 218,587 | 240,699 | 172,562 | 170,828 | 10.4 | (1.0) |
| 18 | ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදනය | 528,821 | 527,794 | 535,983 | 412,587 | 432,183 | (0.3) | 4.7 |
| 19 | රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 282,719 | 287,760 | 304,291 | 262,472 | 272,663 | 6.2 | 3.9 |
| 20 | ගෘහ භාණ්ඩ හැර දැව හා දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 27,320 | 31,666 | 31,556 | 19,975 | 20,237 | 0.9 | 1.3 |
| 21 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 27,728 | 30,504 | 33,236 | 23,729 | 22,900 | 12.4 | (3.5) |
| 22 | අඟුරු සහ බනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 29,075 | 31,245 | 29,743 | 22,340 | 19,811 | (10.4) | (11.3) |
| 23 | රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 83,179 | 86,929 | 89,175 | 63,982 | 65,314 | 0.9 | 2.1 |
| 24 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 76,144 | 88,635 | 96,367 | 64,269 | 64,831 | 7.5 | 0.9 |
| 25 | ලෝහමය නොවන වෙනත් ඛනිජමය නිෂ්පාදන | 75,191 | 67,168 | 72,784 | 52,554 | 53,803 | 16.4 | 2.4 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 26 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 28,953 | 36,186 | 39,312 | 26,234 | 27,802 | 9.3 | 6.0 |
| 27 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 38,848 | 45,087 | 48,104 | 31,820 | 30,930 | 12.1 | (2.8) |
| 28 | ගෘහභාණ්ඩ නිෂ්පාදනය | 94,489 | 97,958 | 102,715 | 74,035 | 73,734 | 6.2 | (0.4) |
| 29 | වෙනත් කර්මාන්ත නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව හා සවි කිරීම | 68,509 | 72,973 | 75,874 | 58,956 | 59,935 | 9.3 | 1.7 |
| 30 | විදුලිය, ගෑස්, වායු, හා වායු සමීකරණ සැපයීම | 85,202 | 92,350 | 94,819 | 70,981 | 75,021 | 2.8 | 5.7 |
| 31 | ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 12,023 | 12,971 | 13,569 | 10,218 | 10,521 | 6.7 | 3.0 |
| 32 | මලාපවහන කටයුතු හා කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය | 21,681 | 25,539 | 27,567 | 20,653 | 21,871 | 8.6 | 5.9 |
| 33 | ඉදිකිරීම් කර්මාන්තය | 596,697 | 645,933 | 674,035 | 483,660 | 481,700 | 5.0 | (0.4) |
| | **සේවාවන්** | **4,894,717** | **5,124,016** | **5,289,407** | **3,884,046** | **4,054,790** | **3.2** | **4.4** |
| 34 | තොග හා සිල්ලර වෙළඳාම | 933,216 | 956,918 | 993,501 | 766,407 | 806,912 | 3.3 | 5.3 |
| 35 | මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 931,529 | 982,643 | 991,727 | 687,974 | 693,696 | 0.6 | 0.8 |
| 36 | තැපැල් හා කුරියර් සේවාවන් | 4,052 | 4,260 | 4,425 | 3,166 | 3,317 | 6.4 | 4.8 |
| 37 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 134,017 | 139,442 | 146,431 | 107,585 | 114,534 | 5.2 | 6.5 |
| 38 | ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 2,624 | 2,831 | 3,205 | 2,424 | 2,077 | 19.6 | (14.3) |
| 39 | විදුලි සංදේශ සේවාවන් | 34,146 | 36,982 | 41,435 | 30,522 | 34,659 | 12.1 | 13.6 |
| 40 | තොරතුරු තාක්ෂණ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 12,148 | 13,015 | 13,564 | 10,046 | 10,748 | 4.3 | 7.0 |
| 41 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 493,785 | 554,521 | 606,468 | 451,841 | 507,357 | 10.0 | 12.3 |
| 42 | රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 82,013 | 88,999 | 94,088 | 71,301 | 77,880 | 8.5 | 9.2 |
| 43 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 489,352 | 520,080 | 544,728 | 404,800 | 419,396 | 5.0 | 3.6 |
| 44 | වෘත්තීමය සේවාවන් | 154,266 | 152,228 | 158,720 | 118,506 | 120,943 | 3.1 | 2.1 |
| 45 | රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව | 430,105 | 452,586 | 430,671 | 306,490 | 304,613 | (4.8) | (0.6) |
| 46 | අධ්‍යාපනය | 159,875 | 171,826 | 172,698 | 125,114 | 125,225 | 0.6 | 0.1 |
| 47 | සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 160,056 | 162,400 | 174,150 | 120,406 | 121,980 | 5.2 | 1.3 |
| 48 | වෙනත් පුද්ගලික සේවාවන් | 873,534 | 885,286 | 913,597 | 677,463 | 711,452 | 3.5 | 5.0 |
| | **සමස්ත එකතු කළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **7,832,167** | **8,167,563** | **8,438,515** | **6,216,088** | **6,439,821** | **3.2** | **3.6** |
| | **(+) භාණ්ඩ හා සේවා මත අය කරන බදු** | **815,667** | **866,727** | **894,702** | **484,979** | **483,172** | **4.0** | **(0.4)** |
| | **දළ දේශීය නිෂ්පාදිතය(GDP), වෙළඳ පළ මිල** | **8,647,833** | **9,034,290** | **9,333,217** | **6,701,067** | **6,922,993** | **3.2** | **3.3** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

*(ආ) සංශෝධිත*

### කර්මාන්ත

2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ඉදිකිරීම් කටයුතු වල සිදු වූ සියයට 0.4 ක හැකිලීම සහ නිෂ්පාදන කටයුතු වල සිදු වූ මන්දගාමී කාර්යසාධනය පිළිබිඹු කරමින් වාර්තා වූ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව, 2018 වසරේ පළමු කාර්තු තුන තුළ කර්මාන්ත අංශය සියයට 1.8 කින් මධ්‍යස්ථව පුළුල් වී ඇත. පතල් හා කැනීම් උප අංශයේ සියයට 1.0 ක දායකත්වය කර්මාන්ත අංශයේ මධ්‍යස්ථ කාර්යසාධනයට ද දායක වී ඇත. විදුලි බල හා ගෑස් සැපයුම, දුව ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම සහ රසායන ද්‍රව්‍ය හා ඖෂධ නිපදවීම ඇතුළත් උප අංශ වැඩිදියුණු වූ කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. කෙසේ වුවද, කෝක් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන, කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන හා මාධ්‍ය කටයුතු සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදනය මෙම කාලපරිච්ඡේදය තුළ දී අඩු වී ඇත.

රූපසටහන 2.4 | කර්මාන්ත අංශයේ සංයුතිය
2018 පළමු කාර්තු තුන




### නිෂ්පාදන

2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී අගය එකතු කළ රෙදිපිළි කර්මාන්තය හා ආශ්‍රිත නිෂ්පාදන සියයට 3.9 ක මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කර ඇත. ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ දී, රෙදිපිළි කර්මාන්තය මඟින් ඇ.ඩො. මිලියන 3,928 ක ආදායමක් උපයාගෙන ඇත. 2018 වසරේ දී ආහාර, පාන සහ දුම්කොළ නිෂ්පාදන උප අංශය සියයට 4.7 කින් පුළුල් වී ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ දී ආහාර, පාන, සහ දුම්කොළ නිෂ්පාදන අපනයනයෙන් ලද ආදායම ඇ.ඩො. මිලියන 347.2 කි. දුව හා දුව ආශ්‍රිත නිෂ්පාදන, රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන පිළිවෙළින් සියයට 1.3 ක්, සියයට 0.9 ක් සහ සියයට 2.4 ක් ලෙස පුළුල් වී ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ දී රබර් ආශ්‍රිත නිෂ්පාදන වලින් ලද ආදායම ඇ.ඩො. මිලියන 656 කි. අගය එකතු කළ රසායනික ද්‍රව්‍ය හා ඖෂධ ආශ්‍රිත නිෂ්පාදන, ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අංශ පිළිවෙළින් සියයට 2.1 කින් සහ සියයට 6.0 කින් වර්ධනය වී ඇත. කෙසේ වුවද, 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී අගය එකතු කළ කඩදාසි නිෂ්පාදන, මුද්‍රණ හා මාධ්‍ය නිෂ්පාදන නැවත සැකසීම, කෝක් හා පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදන අංශ පිළිවෙළින් සියයට 3.5 ක, සියයට 11.3 ක, සියයට 2.8, සහ සියයට 0.4 ක සෘණාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

රූපසටහන 2.5 | නිෂ්පාදන අංශයේ සංයුතිය - 2018 පළමු කාර්තු තුන




### විදුලිය, ගෑස්, ජලය සහ මලාපවහන

විදුලිය, ජල සැපයුම සහ මලාපවහන පද්ධති සංවර්ධනය සඳහා සිදු කරන ලද රජයේ ආයෝජන හේතුවෙන් 2018 වසරේ පළමු කාර්තු තුන තුළ විදුලිය සැපයීම, ජලය රැස්කිරීම සහ මලාපවහන ආශ්‍රිත හා අප ජලය බැහැර කිරීමේ කටයුතු පුළුල් වීමට හේතු විය. විදුලිය හා ගෑස්, ජලය රැස්කිරීම සහ මලාපවහන හා කසළ කළමනාකරණය යන උප අංශ පිළිවෙළින් සියයට 5.7 ක්, සියයට 3.0 ක් සහ සියයට 5.9 ක් ලෙස ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත. දිවයිනෙහි ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා

කාලපරිච්ඡේදය තුළ දී සමස්ත බලශක්ති සැපයුම ගිගා වොට් 11,436 ක් දක්වා සියයට 4.0 කින් වර්ධනය වී ඇත. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සැළකිය යුතු වර්ෂාපතනය හේතුවෙන් ජල විදුලි බලයෙන් බලශක්ති උත්පාදන ධාරිතාව ගිගා වොට් පැය 3,428 ක් දක්වා සියයට 87.4 කින් වර්ධනය වී ඇත. 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී විදුලි උත්පාදනය සඳහා ඉන්ධන සහ ගල් අඟුරු බලශක්තීන්ගේ දායකත්වය පිළිවෙළින් සියයට 23.0 කින් සහ සියයට 9.0 කින් අඩු වී ඇත. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් විදුලිය උත්පාදනය ගිගා වොට් පැය 1,256 ක් දක්වා සියයට 23.0 කින් වර්ධනය වී ඇත.

### සේවා අංශය

### තොග හා සිල්ලර වෙළඳාම, භාණ්ඩ ප්‍රවාහනය, ගබඩා කිරීම හා මගී සේවා

2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 3.3 ක් ලෙස වාර්තා වූ තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු වලට සාපේක්ෂව 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දි සියයට 5.3 ක් දක්වා වර්ධනය විය. ප්‍රවාහන අංශයේ සියයට 0.8 ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී, ලියාපදිංචි වූ මුළු නව වාහන සංඛ්‍යාව වාහන 417,881 ක් දක්වා සියයට 10.0 කින් වර්ධනය වී ඇත.

නිෂ්පාදන බදු ව්‍යුහය සංශෝධනය කිරීම හේතුවෙන්, දෙමුහුන් මෝටර් රථ සහ එන්ජින් ධාරිතාව 1,000 ට අඩු මෝටර් රථ ලියාපදිංචිය සියයට 123.5 ක් දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. කෙසේ වුවද, භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිත වන වාහන, ඉඩම් වාහන සහ ත්‍රී රෝද රථ ලියාපදිංචිය පිළිවෙළින් සියයට 13.7 කින්, සියයට 22.9 කින්, සහ සියයට 13.0 කින් පහළ වැටී ඇත. 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී මෙහෙයවන ලද මුළු බහළුම් ප්‍රමාණය අඩි 20 බහළුම් ඒකක (TEUs) මිලියන 5.8 ක් දක්වා සියයට 15.0 කින් වර්ධනය වී ඇත. මෙහෙයවන ලද ප්‍රතිනැව්ගත කිරීම් සහ නැවත තැබීම් පිළිවෙළින් සියයට 19.6 කින්, සහ සියයට 15.0 කින් වර්ධනය වි ඇත. 2018 වසරේ පළමු කාර්තු තුන තුළ පටවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 36 ක් දක්වා සියයට 16.6 කින් වර්ධනය වී ඇති අතර, ගොඩබාන ලද භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 50.9 ක් දක්වා සියයට 10.3 කින් වර්ධනය වී ඇත. 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දි ශ්‍රී ලංකා වරායන් විසින් මෙහෙයවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය සියයට 12.8 ක් දක්වා වර්ධනය වී ඇත.

**රූප සටහන 2.6 | සේවා අංශයේ සංයුතිය - 2018 පළමු කාර්තු තුන**




### නවාතැන්, ආහාර සහ පාන වර්ග සැපයීමේ සේවා

2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී අගය එකතු කළ නවාතැන්, අහාර සහ පාන වර්ග සැපයීමේ සේවා අංශ වෙතින් වාර්තා වූ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව, 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී එම අංශ වෙතින් සියයට 6.5 ක වර්ධනයක් වාර්තා වී ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පැමිණි මිලියන 1.5 ක් වූ සංචාරකයින්ගේ සංඛ්‍යාවට සාපේක්ෂව, 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී, සංචාරකයන්ගේ පැමිණීම මිලියන 1.7 දක්වා සියයට 11.6 කින් වර්ධනය විය. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී සංචාරක ඉපයීම් ඇ.ඩො. මිලියන 3,212 දක්වා සියයට 11.6 කින් වර්ධනය විය.

**2.2 වගුව | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්**

| දර්ශකය | 2014 | 2015 | 2016 | 2017 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| | | | | | ජන. - නොවැ. | ජන. - නොවැ.(අ) |
| **වරාය සේවා** | | | | | | |
| පැමිණි නැව් (සංඛ්‍යාව) | 4,298 | 4,728 | 4,998 | 4,879 | 4,449 | 4,487 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. ‘000) | 74,431 | 77,579 | 86,519 | 93,857 | 85,242 | 95,918 |
| මෙහෙයවන ලද මුළු බහළුම් (TEU ‘000) | 4,908 | 5,185 | 5,735 | 6,209 | 5,622 | 6,439 |
| ප්‍රති නැව් ගත කිරීම් (TEU ‘000) | 3,781 | 3,888 | 4,355 | 4,742 | 4,293 | 5,121 |
| **විදුලි සංදේශ අංශය** | | | | | ජන. - සැප්. | ජන. - සැප්.(අ) |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව '000)(ආ) | 2,679 | 2,601 | 2,550 | 2,603 | 2,496 | 2,509 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව '000) | 22,123 | 24,385 | 26,228 | 28,199 | 28,229 | 32,050 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව '000) | 1,556 | 1,473 | 1,384 | 1,405 | 1,306 | 1,303 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් ඛ්‍යාව 000*) | 3,383 | 4,091 | 4,921 | 5,904 | 5,642 | 7,126 |
| **සෞඛ්‍ය අංශය** | | | | | ජන. - ජුනි | ජන. - ජුනි(අ) |
| පුද්ගලික රෝහල් | 210 | 217 | 225 | 181 | 181 | 191 |
| රජයේ රෝහල් | 601 | 610 | 598 | 612 | 612 | 612 |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 76,918 | 76,781 | 76,829 | 76,774 | 76,774 | 76,824 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 21,331 | 19,429 | 20,458 | 20,349 | 20,349 | 19,692 |
| හෙදියන් සංඛ්‍යාව (රජයේ) | 31,964 | 32,272 | 32,499 | 34,221 | 34,221 | 34,714 |
| **මූල්‍ය අංශය** | | | | | ජන. - අගෝ. | ජන. - අගෝ.(අ) |
| බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථාන | 6,554 | 6,583 | 6,107 | 6,213(ඈ) | 6,569(ඈ) | 6,609(ඈ) |
| ණය කාඩ්පත් (ක්‍රියාකාරී) | 1,032,833 | 1,142,231 | 1,315,915 | 1,486,545 | 1,435,053(ඉ) | 1,640,786(ඉ) |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් | 48 | 47 | 46 | 45 | 45 | 43 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 8 | 7 | 7 | 6 | 6 | 5 |
| **සංචාරක අංශය** | | | | | | |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 1,527,153 | 1,798,380 | 2,050,832 | 2,116,407 | 1,871,871 | 2,080,627 |
| සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලි.) | 2,431 | 2,981 | 3,519 | 3,925 | 3,472 | 3,906 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 74.3 | 74.5 | 74.8 | 73.3 | 72.5 | ලැ.නො. |
| **ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදිංචි කිරීම)** | | | | | | |
| බස් රථ | 3,851 | 4,140 | 2,685 | 3,331 | 3,009 | 2,810 |
| කාර් | 38,780 | 105,628 | 45,172 | 39,182 | 35,230 | 76,816 |
| ලොරි(ඊ) | 5,121 | 7,142 | 7,563 | 11,432 | 10,548 | 8,782 |
| යතුරු පැදි | 272,885 | 370,889 | 340,129 | 344,380 | 319,446 | 316,728 |
| ත්‍රී රෝද රථ | 79,038 | 129,547 | 56,945 | 23,537 | 22,172 | 18,646 |
| ට්‍රැක්ටර්ස් සහ ට්‍රේලර්ස් | 9,082 | 12,105 | 13,947 | 13,049 | 11,991 | 9,454 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*
*(ආ) රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව මෙහි ඇතුළත්*
*(ඇ) ජුනි අවසාන*
*(ඈ) සංශෝධිත*
*(ඉ) නොවැම්බර් අවසානයට*
*(ඊ) විශේෂ කාර්ය වාහන මෙහි ඇතුළත් වේ*

**2.3 වගුව** | සංචාරක අංශයේ කාර්යසාධනය

| මාසය | සංචාරකයින්ගේ පැමිණීම | | | | | සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලි.) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2014 | 2015 | 2016 | 2017(අ) | 2018 (ආ) |
| ජනවාරි | 146,575 | 156,246 | 194,280 | 219,360 | 238,924 | 233 | 259 | 333 | 407 | 449 |
| පෙබරවාරි | 141,878 | 165,541 | 197,697 | 197,517 | 235,618 | 226 | 274 | 339 | 366 | 442 |
| මාර්තු | 133,048 | 157,051 | 192,841 | 188,076 | 233,382 | 212 | 260 | 331 | 349 | 438 |
| අප්‍රේල් | 112,631 | 122,217 | 136,367 | 160,249 | 180,429 | 179 | 203 | 234 | 297 | 339 |
| මැයි | 90,046 | 113,529 | 125,044 | 121,891 | 129,466 | 143 | 188 | 215 | 226 | 243 |
| ජූනි | 103,175 | 115,467 | 118,038 | 123,351 | 146,828 | 164 | 191 | 203 | 229 | 276 |
| ජූලි | 133,971 | 175,804 | 209,351 | 205,482 | 217,829 | 213 | 291 | 359 | 381 | 409 |
| අගෝස්තු | 140,319 | 166,610 | 186,288 | 190,928 | 200,359 | 223 | 276 | 320 | 354 | 376 |
| සැප්තැම්බර් | 105,535 | 143,374 | 148,499 | 145,077 | 149,087 | 168 | 238 | 255 | 269 | 280 |
| ඔක්තෝබර් | 121,576 | 132,280 | 150,419 | 152,429 | 153,123 | 194 | 219 | 258 | 283 | 287 |
| නොවැම්බර් | 119,727 | 144,147 | 167,217 | 167,511 | 195,582 | 191 | 239 | 287 | 311 | 367 |
| දෙසැම්බර් | 178,672 | 206,114 | 224,791 | 244,536 | 253,169 | 284 | 342 | 386 | 453 | 475 |
| **එකතුව** | **1,527,153** | **1,798,380** | **2,050,832** | **2,116,407** | **2,333,796** | **2,431** | **2,981** | **3,519** | **3,925** | **4,381** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

**2.4 වගුව** | ද.දේ.නි. වර්ධනයේ අංශික ව්‍යාප්තිය (%)

| අංශය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | පළමු කාර්තු 3 | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2017 | 2018(අ) |
| **කෘෂිකාර්මික** | **3.2** | **(2.2)** | **5.5** | **(4.2)** | **(0.8)** | **(3.5)** | **4.3** |
| තේ වගාව | 3.7 | (1.3) | (2.6) | (11.2) | 4.8 | 6.0 | (4.5) |
| වී වගාව | 5.3 | (18.6) | 23.3 | (31.0) | (4.0) | (40.6) | 53.4 |
| රබර් වගාව | (14.2) | (24.5) | (10.1) | (10.7) | 4.9 | 1.2 | (7.4) |
| ධාන්‍ය වගාව | 14.3 | (1.9) | 1.0 | (10.5) | (10.3) | (16.9) | 30.5 |
| එළවළු වගාව | 5.7 | 1.4 | 24.9 | (2.1) | (16.2) | (22.8) | 12.8 |
| සත්ව නිෂ්පාදන | 24.0 | (25.4) | 8.0 | 6.3 | 3.9 | 5.6 | 4.4 |
| වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 12.7 | 8.3 | 1.9 | 5.5 | 22.0 | 20.1 | 0.1 |
| ධීවර කර්මාන්තය | 6.1 | 2.1 | (2.7) | 1.6 | (0.5) | 1.4 | 0.0 |
| **කර්මාන්ත** | **4.1** | **1.2** | **3.0** | **6.7** | **4.6** | **4.8** | **1.8** |
| පතල් හා කැනීම් | 7.6 | 2.2 | (0.9) | 14.4 | 10.1 | 10.4 | (1.0) |
| නිෂ්පාදන ක්‍රියාකාරකම් | 2.3 | 2.9 | 4.7 | 1.8 | 3.9 | 3.9 | 2.8 |
| අනෙකුත් කර්මාන්ත | 2.9 | 4.1 | 10.1 | 10.0 | 3.9 | 4.3 | 5.5 |
| ඉදිකිරීම් | 7.5 | (3.4) | (0.9) | 14.9 | 4.4 | 5.0 | (0.4) |
| **සේවා** | **3.8** | **6.5** | **5.3** | **4.2** | **3.2** | **3.2** | **4.4** |
| තොග හා සිල්ලර වෙළඳාම | 1.3 | 3.8 | 4.7 | 2.5 | 3.8 | 3.3 | 5.3 |
| ප්‍රවාහනය හා ගබඩා කිරීම | 5.4 | 4.5 | 5.5 | 4.1 | 0.9 | 0.6 | 0.8 |
| නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම් | (5.8) | 4.0 | (1.3) | 4.0 | 5.0 | 5.2 | 6.5 |
| තොරතුරු හා සන්නිවේදනය | 7.7 | 11.4 | 12.5 | 8.0 | 9.7 | 10.1 | 10.3 |
| මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම් | 5.3 | 14.6 | 14.8 | 11.8 | 8.9 | 9.8 | 11.9 |
| නිශ්චල දේපල ක්‍රියාකාරකම් | 12.8 | 6.4 | 9.6 | 4.2 | 4.7 | 5.0 | 3.6 |
| වෘත්තීමය සේවා | 4.0 | 2.8 | (7.1) | (3.1) | 4.3 | 3.1 | 2.1 |
| අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජයීය ක්‍රියාකාරකම් | (10.8) | 5.7 | (1.6) | 4.5 | 3.8 | 2.8 | 0.7 |
| රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව | (0.8) | 5.2 | 6.9 | 5.2 | (4.8) | (4.8) | (0.6) |
| අනෙකුත් සේවා (ස්වයං සේවා හැර) | 10.0 | 8.6 | 2.9 | 1.3 | 3.2 | 3.5 | 5.0 |
| **ද.දේ.නි.** | **3.4** | **4.5** | **4.8** | **4.2** | **3.3** | **3.2** | **3.3** |

*මූලාශ්‍රය: ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### විදුලි සංදේශ සහ තැපැල් සේවා

2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී විදුලි සංදේශ අංශය සියයට 13.6 කින් වර්ධනය වී ඇත. එසේම, තොරතුරු තාක්ෂණ උපදේශන සේවා සහ තැපැල් සේවාව ආශ්‍රිත සේවාවන් පිළිවෙළින් සියයට 7.0 කින් හා 4.8 කින් වර්ධනය විය. 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී ජංගම දුරකථන ඇතුළුව දුරකථන භාවිතය පුද්ගලයන් සියයකට සියයට 11.4 කින් වර්ධනය වී ඇත. අන්තර්ජාල පරිශීලකයන් සංඛ්‍යාව මිලියන 7.1 ක් දක්වා සියයට 26.3 කින් ද, ජංගම දුරකථන භාවිතය මිලියන 32 දක්වා සියයට 13.5 කින් ද වර්ධනය වී ඇත.

### මූල්‍ය සහ මූල්‍ය අතරමැදි මූල්‍ය සේවා

2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 10.0 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී අගය එකතු කළ මූල්‍ය සහ මූල්‍ය අතරමැදි සේවා අංශය සියයට 12.3 කින් පුළුල් වී ඇත. මේ අතර, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී රක්ෂණ උප අංශය සියයට 9.2 කින් වර්ධනය වී ඇත.

### දේපල වෙළඳාම සහ අනෙකුත් සේවා

2018 වසරේ පළමු කාර්තු තුන තුළ දී දේපල වෙළඳාම් කටයුතු සියයට 3.6 කින් පුළුල් වූ අතර අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා අංශ පිළිවෙළින් සියයට 0.1 ක සහ සියයට 1.3 ක ආන්තික වර්ධනයක් පෙන්නුම් කර ඇත. කෙසේ වුවද, එම කාලපරිච්ඡේදය තුළ දී අගය එකතු කළ පරිපාලන සේවා සියයට 0.6 කින් හැකිලීමකට ලක් වී ඇත.

### සේවා වියුක්තිය

2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.2 ක් ලෙස වාර්තා වූ සේවා වියුක්ති අනුපාතය 2018 වසරේ තෙවන කාර්තුව තුළ දී සියයට 4.1 ක් දක්වා ආන්තිකව පහත වැටී ඇත. 2018 වසරේ තෙවන කාර්තුව තුළ දී පුරුෂ පාර්ශවයේ සේවා වියුක්ති අනුපාතය සියයට 2.8 කින් වර්ධනය වී ඇති අතර, ස්ත්‍රී පාර්ශවයේ සේවා වියුක්තිය සියයට 6.6 කින් පහත වැටී ඇත. විශේෂයෙන්ම, තොරතුරු තාක්ෂණ සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයන්හි රැකියා අවස්ථා දස ලක්ෂයක් නිර්මාණය කිරීමට රජය පියවර ගෙන තිබේ.

රූප සටහන 2.7 | සේවා වියුක්තිය




## 2.3 මූල්‍ය අංශයේ ප්‍රවණතා

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී මූල්‍ය වෙළඳපල හා සම්බන්ධ දේශීය සහ විදේශීය අංශයන් හි වර්ධනයත් සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මධ්‍යස්ත මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. දේශීය මූල්‍ය වෙළඳපල තුළ උග්‍ර ද්‍රවශීලතා හිඟයක් නිරීක්ෂණය වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2018 වසරේ නොවැම්බර් මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි වාණිජ බැංකු විසින් සියළුම රුපියල් බැරකම් මත පවත්වා ගත යුතු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) සියයට 7.5 සිට සියයට 6.0 ක් දක්වා ප්‍රතිශත ඒකක 1.50 කින් අඩු කරන ලද අතර එමගින් බැංකු අරමුදල් වල පිරිවැය අඩුවීමට හේතු වනු ඇත. ඒ ආකාරයෙන්ම මූල්‍ය ප්‍රතිපත්ති උදාසීන කිරීම සඳහා 2018 වසරේ නොවැම්බර් මස 14 වන දින නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) සියයට 8.0 ක් දක්වා පදනම් ඒකක 75 කින් ඉහළ දමන ලද අතර නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) සියයට 9.00 ක් දක්වා පදනම් ඒකක 50 කින් ඉහළ දමන ලදී. මෙම ගැළපුම් තැන්පතු සහ ණය අනුපාතික අතර පරතරය අඩු කිරීමට මෙය උපකාරී වනු ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 17.9 ක වර්ධනයට සාපේක්ෂව පුළුල් මුදල් සැපයුම ($M_2b$), 2018 වසරේ නොවැම්බර් මස තුළ දී

වාර්ෂික ලක්ෂමය පදනම මත රු. බිලියන 7,043 ක් දක්වා සියයට 13.9 කින් පුළුල් වී ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 15.4 ක පුළුල් වීම හා සැසඳීමේ දී පුද්ගලික අංශය සඳහා සපයනු ලැබූ ණය ප්‍රමාණය 2018 වසරේ නොවැම්බර් මස දී වාර්ෂික ලක්ෂමය පදනම මත රු. බිලියන 5,509 ක් දක්වා සියයට 16.2 කින් වැඩි වී ඇත. 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී සාමාන්‍ය බරිත ඒක්ෂණ පොළී අනුපාතිකය (AWCMR) සහ සතිපතා ගණනය කරන සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය (AWPR) පිළිවෙළින් සියයට 8.96 ක් සහ 12.03 ක් ලෙස පැවතුණි. 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී සාමාන්‍ය බරිත ණය දීමේ අනුපාතිකය (AWLR) සහ සාමාන්‍ය බරිත නව ණය දීමේ අනුපාතිකය (AWNLR) පිළිවෙළින් සියයට 14.50 සහ සියයට 14.51 ක් විය. 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතිකය (AWDR) සහ සාමාන්‍ය බරිත ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) පිළිවෙළින් සියයට 8.77 ක් සහ සියයට 10.81 ක් විය. දේශීය මුල්‍ය වෙළඳපලෙ හි දනට පවතින දැඩි ද්‍රවශීලතා මට්ටම හමුවේ කෙටිකාලීන පොළී අනුපාත ඉහළ නංවා ඇති අතර මේ හේතුවෙන් ප්‍රාථමික හා ද්විතියික වෙළඳපලෙ හි රජයේ සුරැකුම්පත් වල ඉපැයීම් හි වර්ධනයක් නිරීක්ෂණය විය.

**රූපසටහන 2.8 | පොළී අනුපාත, මුදල් සමස්තයන් සහ පුද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය**




## උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI 2013 = 100) මඟින් මනිනු ලබන වාර්ෂික ලක්ෂමය පදනම (YoY) මත උද්ධමනය 2018 වසරේ ඔක්තෝබර් මස දී සියයට 3.1 ක් ලෙස වාර්තා වූ අතර ආහාර මිල ගණන් ඉහළ යාම හේතුවෙන් 2018 වසරේ නොවැම්බර් මස දී එම අගය සියයට 3.3 දක්වා වර්ධනය වී ඇත. මේ අතර, 2018 වසරේ ඔක්තෝබර් මස දී සියයට 0.1 ක් ලෙස වාර්තා වූ ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI 2013 = 100) මඟින් මනිනු ලබන වාර්ෂික ලක්ෂමය පදනම (YoY) මත උද්ධමනයෙහි සමස්ත අනුපාතිකය ද 2018 වසරේ නොවැම්බර් මස දී සියයට 1.0 දක්වා ඉහළ ගොස් ඇත

**2.5 වගුව | ශ්‍රී ලංකාවේ මතුපිට, මූලික සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය: 2013 = 100)**

| මාසය | මතුපිට උද්ධමනය (%) | | | | මූලික උද්ධමනය (%) | | | | ආහාර උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලක්ෂමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂමය | | වාර්ෂික සාමාන්‍ය | |
| | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| ජනවාරි | 5.5 | 5.8 | 4.3 | 6.6 | 7.0 | 3.5 | 4.7 | 5.6 | 4.5 | 10.5 | 6.4 | 9.8 |
| පෙබරවාරි | 6.8 | 4.5 | 4.6 | 6.4 | 7.1 | 3.5 | 5.0 | 5.3 | 7.7 | 6.0 | 6.9 | 9.6 |
| මාර්තු | 7.3 | 4.2 | 5.0 | 6.1 | 7.3 | 3.4 | 5.3 | 5.0 | 9.2 | 5.1 | 7.4 | 9.2 |
| අප්‍රේල් | 6.9 | 3.8 | 5.3 | 5.9 | 6.8 | 3.5 | 5.5 | 4.7 | 8.6 | 3.0 | 7.5 | 8.8 |
| මැයි | 6.0 | 4.0 | 5.4 | 5.7 | 5.2 | 3.2 | 5.5 | 4.5 | 9.3 | 3.3 | 7.6 | 8.3 |
| ජූනි | 6.1 | 4.4 | 5.5 | 5.6 | 5.1 | 3.4 | 5.5 | 4.4 | 9.1 | 2.9 | 7.6 | 7.7 |
| ජූලි | 4.8 | 5.4 | 5.4 | 5.6 | 4.9 | 3.9 | 5.4 | 4.3 | 4.8 | 5.6 | 7.0 | 7.8 |
| අගෝස්තු | 6.0 | 5.9 | 5.5 | 5.6 | 6.0 | 3.7 | 5.6 | 4.1 | 6.9 | 7.5 | 6.9 | 7.8 |
| සැප්තැම්බර් | 7.1 | 4.3 | 5.8 | 5.4 | 6.0 | 3.8 | 5.8 | 3.9 | 10.4 | 2.3 | 7.1 | 7.1 |
| ඔක්තෝබර් | 7.8 | 3.1 | 6.1 | 5.0 | 5.8 | 3.8 | 6.0 | 3.8 | 12.6 | (2.3) | 7.6 | 5.9 |
| නොවැම්බර් | 7.6 | 3.3 | 6.4 | 4.6 | 5.2 | 3.4 | 6.0 | 3.6 | 13.8 | (1.0) | 8.4 | 4.6 |
| දෙසැම්බර් | 7.1 | 2.8 | 6.6 | 4.3 | 4.3 | 3.1 | 5.9 | 3.5 | 14.4 | (1.5) | 9.3 | 3.3 |

*මූලාශ්‍රය: ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*

**CCPI මූලික උද්ධමනය - අමු ආහාර, බලශක්ති සහ ප්‍රවාහනය හැර*

**රූප සටහන 2.9 | මතුපිට, මූලික සහ ආහාර උද්ධමන විචලතා (පදනම : 2013=100)**




(NCPI 2013 = 100) මගින් මනිනු ලබන වාර්ෂික ලක්ෂමය පදනම (YoY) මත උද්ධමනයෙහි සමස්ත අනුපාතිකය ද 2018 වසරේ නොවැම්බර් මස දී සියයට 1.0 දක්වා ඉහළ ගොස් ඇත

## 2.4 කොටස් වෙළඳපල

2018 වසරේ මුල් මාස එකොළහ තුළ කොළඹ කොටස් හුවමාරුවේ ක්‍රියාකාරීත්වය මන්දගාමී කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. කොළඹ කොටස් හුවමාරුව යටතේ ලියාපදිංචි වී ඇති සියළුම සමාගම් වල ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන ප්‍රධාන කොටස් වෙළඳපල දර්ශකය වන සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) 2017 වසරේ නොවැම්බර් මස අවසානයේ දී වාර්තා කළ ඒකක 6,412 හා සැසඳීමේ දී, එම අගය 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී සියයට 6.1 කින් අඩු වී ඒකක 6,019 ක් ලෙස වාර්තා විය. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී S&P SL 20 දර්ශකය 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී සියයට 14.7 කින් අඩු වී ඒකක 3,179 ට ළඟා විය. 2018 වසරේ නොවැම්බර් අවසානයේ දී කොළඹ කොටස් හුවමාරුව තුළ වෙළඳපල ප්‍රාග්ධනීකරණය සියයට 3.4 කින් අඩු වී රු. බිලියන 2,824 ක් විය. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ සමස්ත කොටස් පිරිවැටුම රු. බිලියන 183 ක් දක්වා සියයට 12.9 කින් පහළ ගොස් ඇත.

**2.6 වගුව | ප්‍රාග්ධන වෙළඳපල වෙනස්වීම්**

| දර්ශකය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | නොවැම්බර් අවසානය 2107 | නොවැම්බර් අවසානය 2018(අ) |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 5,643 | 5,913 | 7,299 | 6,895 | 6,228 | 6,369 | 6,412 | 6,019 |
| මිලංකා මිල දර්ශකය/එස් ඇන්ඩ් පී එස්එල් 20 දර්ශකය* | 5,119 | 3,264 | 4,089 | 3,626 | 3,496 | 3,672 | 3,725 | 3,179 |
| වෙළඳපල ප්‍රාග්ධනීකරණය (රු. බිලි.) | 2,168 | 2,460 | 3,105 | 2,938 | 2,745 | 2,899 | 2,923 | 2,824 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 287 | 289 | 294 | 294 | 295 | 296 | 296 | 297 |
| වාර්ෂික පිරිවැටුම (රු. බිලි.) | 214 | 200 | 341 | 253 | 177 | 220.6 | 210 | 183 |
| විදේශ විකුණුම් (රු. මිලි.) | 33,972 | 60,873 | 83,554 | 89,790 | 74,200 | 94,627 | 88,860 | 90,003 |
| විදේශ ගැනුම් (රු. මිලි.) | 72,653 | 83,657 | 104,771 | 84,418 | 74,583 | 112,285 | 106,254 | 71,479 |
| ශුද්ධ ගැනුම් (රු. මිලි.) | 38,681 | 22,784 | 21,217 | (5,372) | 383 | 17,657 | 17,394 | (18,524) |

*මූලාශ්‍ර: කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

*2012 ජුනි සිට මිලංකා මිල දර්ශකය වෙනුවට එස්.ඇන්ඩ් පී එස්.එල් 20 දර්ශකය භාවිතා කරනු ලැබේ.*

## 2.5 විදේශ අංශයේ ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී මධ්‍යස්ථ කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී ඇ.ඩො. මිලියන 8,590 ක් ව පැවති වෙළඳ ශේෂය 2018 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 9,642 ක් දක්වා සියයට 12.2 කින් පුළුල් වී ඇති අතර මේ සඳහා අපනයන ආදායම් ඉහළ යෑමට සාපේක්ෂව ආනයන වියදම් ඉහළ යෑම හේතුවිය. සමුච්චිත වශයෙන් ගත්කළ, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ.ඩො. මිලියන 10,341 ක් ව පැවති අපනයන ආදායම 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ඇ.ඩො. මිලියන 10,856 ක් දක්වා සියයට 5.0 කින් වර්ධනය විය. මෙම අපනයන ආදායම වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යාම හේතු වී ඇත. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී කාර්මික අපනයන වලින් ලද ආදායම ඇ.ඩො. මිලියන 8,445 ක් දක්වා සියයට 9.0 කින් වර්ධනය වී ඇති අතර, මේ සඳහා රෙදිපිළි සහ ඇඟළුම්, ඛනිජතෙල් නිෂ්පාදන, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ යාම හේතු විය. කෙසේ වුවද, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම ඇ.ඩො. මිලියන 2,363 ක් දක්වා සියයට 7.3 කින් පහළ ගොස් ඇති අතර මේ සඳහා මුහුදු ආහාර හැර අනෙකුත් සියළුම අපනයන වල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවිය. තවද, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ආනයන වියදම ඇ.ඩො. මිලියන 20,498 ක් දක්වා සියයට 8.3 කින් වර්ධනය වී ඇති අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් ඉන්ධන, මෝටර් රථ සහ ප්‍රවාහන උපකරණ ආනයනය හේතුවිය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී සහල්, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ සඳහා වූ ආනයනික වියදම් අඩු වී ඇත.

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී, සමස්ත ගෙවුම් ශේෂ හිඟය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කළ ඇ.ඩො. මිලියන 2,005 ක අතිරික්තයට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 807 ක හිඟයක් වාර්තා කර ඇත. මේ අතර, දිගුකාලීන ණය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පස්වන වාරිකය, ඇ.ඩො. මිලියන 2,500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත ආ ශුද්ධ ගලා ඒම් සහ කොළඹ කොටස් හුවමාරුව වෙත අඛණ්ඩව ආ ගලා ඒම් හේතුකොට ගෙන මූල්‍ය ගිණුම වෙත මධ්‍යස්ථ ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී කොළඹ කොටස් හුවමාරුව වෙත වූ මුළු විදේශ ආයෝජන ඇ.ඩො. මිලියන 29 ක ශුද්ධ ගලායාමක් ලෙස වාර්තා වූ අතර එය ද්විතික වෙළඳපොල වෙතින් වූ ඇ.ඩො. මිලියන 106 ක ශුද්ධ ගලායාමක් සහ ප්‍රාථමික වෙළඳපල වෙත වූ ඇ.ඩො. මිලියන 77 ක ශුද්ධ ගලාඒමක් ලෙස සමන්විත විය. මේ අතර, සමුච්චිත වශයෙන්, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපල වෙතින් ඇ.ඩො. මිලියන 802 ක ශුද්ධ ගලායාමක් වාර්තා විය.

## 2.7 වගුව | විදේශ වෙළඳාම

ඇ.ඩො. මිලි.

| අයිතමය | 2015 | 2016 | 2017(ඉ) | ජන. - නොවැ. | |
|---|---|---|---|---|---|
| | | | | 2017 | 2018(ඉ) |
| **අපනයන** | **10,505** | **10,310** | **11,361** | **10,341** | **10,856** |
| **කෘෂිකාර්මික අපනයන** | **2,481** | **2,326** | **2,767** | **2,548** | **2,363** |
| තේ | 1,341 | 1,269 | 1,530 | 1,403 | 1,311 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 1,141 | 1,057 | 1,237 | 1,145 | 1,052 |
| **කාර්මික අපනයන** | **7,976** | **7,940** | **8,542** | **7,746** | **8,445** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,820 | 4,884 | 5,032 | 4,562 | 4,824 |
| ආහාරපාන සහ දුම්කොළ | 265 | 324 | 393 | 360 | 424 |
| රබර් නිෂ්පාදන | 761 | 768 | 835 | 761 | 799 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 294 | 318 | 371 | 341 | 402 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 374 | 287 | 434 | 372 | 569 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,461 | 1,359 | 1,477 | 1,350 | 1,427 |
| **ඛනිජමය අපනයන** | **28** | **29** | **35** | **32** | **32** |
| **වර්ගීකරණය නොකළ අපනයන** | **20** | **15** | **17** | **16** | **16** |
| **ආනයන** | **18,934** | **19,183** | **20,980** | **18,931** | **20,498** |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,714** | **4,319** | **4,503** | **4,069** | **4,622** |
| ආහාර හා පාන | 1,628 | 1,627 | 1,841 | 1,660 | 1,471 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 3,086 | 2,692 | 2,662 | 2,409 | 3,151 |
| **අතරමැදි භාණ්ඩ** | **9,638** | **9,870** | **11,436** | **10,242** | **11,505** |
| ඛනිජ තෙල් | 2,700 | 2,481 | 3,428 | 2,995 | 3,835 |
| රෙදිපිළි හා ඇඟලුම් | 2,296 | 2,705 | 2,724 | 2,492 | 2,617 |
| තිරිඟු හා බඩඉරිඟු | 357 | 249 | 357 | 354 | 349 |
| අනෙකුත් | 4,285 | 4,435 | 4,927 | 4,401 | 4,704 |
| **ආයෝජන භාණ්ඩ** | **4,567** | **4,982** | **4,895** | **4,476** | **4,297** |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 2,278 | 2,741 | 2,621 | 2,391 | 2,292 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,352 | 1,569 | 1,591 | 1,461 | 1,383 |
| ප්‍රවාහන උපකරණ | 931 | 663 | 675 | 617 | 616 |
| අනෙකුත් | 6 | 9 | 8 | 7 | 6 |
| **වර්ගීකරණය නොකළ ආනයන** | 16 | 13 | 147 | 144 | 74 |
| **වෙළඳ හිඟය** | **(8,429)** | **(8,873)** | **(9,620)** | **(8,591)** | **(9,642)** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

*(ඉ) තාවකාලික*

### රූපසටහන 2.10 | වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම්






2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී සංචාරක පැමිණීම් මිලියන 2.0 ක් දක්වා සියයට 11.2 කින් ඉහළ යාමත් සමග, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 3,471 ක් වූ සංචාරක ඉපැයීම් වලට සාපේක්ෂව, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී එම ඉපයීම් ඇ.ඩො. මිලියන 3,905 ක් දක්වා සියයට 12.5 කින් ඉහළ ගොස් ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 6,493 ක් වූ විදේශ ශ්‍රමික ප්‍රේෂණ 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ඇ.ඩො. මිලියන 6,431 ක් දක්වා සියයට 0.9 කින් ආන්තිකව අඩු වී ඇත. 2018 වසරේ නොවැම්බර් මාසය අවසානයේ දී දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 7.0 ක් වූ අතර එය මාස 3.7 ක ආනයන හා සමාන වන අතර මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 9.7 ක් වූ අතර එය මාස 5.2 ක ආනයන හා සමාන වේ. 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී ශ්‍රී ලංකා රුපියල ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව සියයට 15.1 කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකක වලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

### අපනයන

අපනයන ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ ඇ.ඩො. මිලියන 10,341 ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ඇ.ඩො. මිලියන 10,856 ක් දක්වා සියයට 5.0 කින් වර්ධනය වී ඇත. කාර්මික අපනයන වලින් ලද ආදායම 2018 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 8,445 ක් දක්වා සියයට 9.0 කින් වර්ධනය වී ඇති අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟළුම් සියයට 5.7 කින්, ඛනිජ තෙල් නිෂ්පාදන සියයට 53.0 කින්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සියයට 17.8 කින් සහ මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සියයට 44.8 කින් ඉහළ යාම මේ සඳහා හේතු විය. රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම ඇ.ඩො. මිලියන 4,824 ක් දක්වා වර්ධනය වී ඇති අතර මේ සඳහා යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඉල්ලුම ඉහළ යාම මෙන්ම සාම්ප්‍රදායික නොවන වෙළඳපල වෙත සිදුකළ අපනයන ඉහළ යාම ද හේතු විය. නැව් සහ ගුවන් යානා සඳහා භාවිතා කරන ඉන්ධන අපනයන මිල ගණන් සහ අපනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. මේ අතර, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී කුළු බඩු, පොල් මද සහ රබර් වලින් ලද ආදායම අඩුවීම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම ඇ.ඩො. මිලියන 2,363 ක් දක්වා සියයට 7.3 කින් පහළ යන ලදී.

**රූප සටහන 2.11 | අපනයන සංයුතිය**




### ආනයන

පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී ඇ.ඩො. මිලියන 18,931 ක් වූ ආනයන වියදම 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ඇ.ඩො. මිලියන 20,498 ක් දක්වා සියයට 8.3 කින් වර්ධනය විය. මේ සඳහා අතරමැදි භාණ්ඩ සඳහා වූ ආනයන වියදම ප්‍රධාන වශයෙන් ඉහළ යාම හේතු විය. ඇ.ඩො. මිලියන 10,242 ක් වූ අතරමැදි භාණ්ඩ සඳහා වූ ආනයන වියදම ඇ.ඩො. මිලියන 11,505 ක් දක්වා සියයට 12.3 කින් සුවිශේෂී ලෙස ඉහළ ගොස් ඇති අතර මේ සඳහා ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ පොහොර ආනයන වියදම ඉහළ යාම හේතු විය. බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. මේ අතර, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී පරිභෝගික භාණ්ඩ ආනයනය ඇ.ඩො. මිලියන 4,623 ක් දක්වා සියයට 13.6 කින් වර්ධනය වී ඇති අතර මේ සඳහා ආහාර සහ පාන වර්ග ආනයන වියදම හැර ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යාම හේතු විය. ඇ.ඩො. මිලියන 2,409 ක් වූ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 3,151 ක් දක්වා සියයට 30.8 කින් වර්ධනය වී ඇති අතර මේ සඳහා එන්ජින් ධාරිතාව 1,000 ට අඩු මෝටර් රථ, දෙමුහුන් මෝටර් රථ සහ විද්‍යුත් මෝටර් රථ ආනයනය කැපී පෙනෙන ලෙස ඉහළ යාම හේතු

විය. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 4,296 ක් දක්වා සියයට 4.0 කින් පහළ ගිය අතර මේ සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන ප්‍රමාණය පහළ යාම හේතු විය. තවද, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී ආයෝජන භාණ්ඩ සියළු උප අංශයන්හි ආනයන වියදම ඇ.ඩො. මිලියන 616 ක් දක්වා සියයට 0.2 කින් අඩු වී ඇත. 2018 වසරේ පළමු මාස හත තුළදී සිදුකරන ලද ආනයන වලින් සියයට 62.0 ක් ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය සහ සිංගප්පූරුව මූලිකව සිදුකර ඇත.

**රූපසටහන 2.12 | ආනයන සංයුතිය**




## 2.6 ගෝලීය ආර්ථික සන්දර්භය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඔක්තෝම්බර් මස පුරෝකථනයට අනුව 2018 සහ 2019 වසර සඳහා ගෝලීය ආර්ථික වර්ධනය සියයට 3.7 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර එය 2017 වසරේ එම අගයෙහිම පැවතිය ද එය අප්‍රේල් මස පුරෝකථනයට වඩා සියයට 0.2 ක අඩු අගයක් ගෙන ඇත. මෙලෙස ගෝලීය ආර්ථික වර්ධනය නොවෙනස්ව පැවතීම සඳහා සලකා බලන කාලසීමාවේ දී දියුණු ආර්ථිකයන්හි පැවති මන්දගාමී ක්‍රියාකාරිත්වය, නැගීඑන හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථික වල සිදුවූ දුර්වල වර්ධනය සමඟින් මැද පෙරදිග හු දේශපාලනික අස්ථාවරත්වය සහ තෙල් මිල ඉහළ යාම හේතු විය. එක්සත් ජනපදයේ පොලී අනුපාතිකය ඉහළ යාමත් සමඟ නැගීඑන හා සංවර්ධනය වන ආර්ථිකයන්ගේ වෙළඳ හිඟය සහ ප්‍රාග්ධනය පිටතට ගලායාම මෙම ගැටළුව තවදුරටත් පුළුල් කිරීමට හේතු විය. මේ අතර, දියුණු ආර්ථිකයන් විසින් අනුගමනය කරනු ලබන දැඩි මූල්‍ය ප්‍රතිපත්ති, නැගීඑන වෙළඳපල වල විනිමය අනුපාතකයින්ගේ තියුණු වෙනස්වීම් සහ ප්‍රාග්ධන ගලා ඒම අඩුවීම කෙරෙහි සෘණාත්මකව බලපෑම් ඇතිකර තිබේ. ගෝලීය ආර්ථිකයේ පවතින එවැනි අවදානම් තත්ත්වයන්, ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයන්හි පූර්ණ වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා බාහිර සහ දේශීය කම්පනයන්ට ඔරොත්තු දීම ශක්තිමත් කරගනිමින් රටෙහි අභ්‍යන්තර ප්‍රතිපත්තීන් සකස් කරගැනීම අවධාරණය කර ඇත.

# 03

# රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය

## 3.1 සමාලෝචනය

ඉහළ නංවන ලද සාමූහික ක්‍රියාමාර්ග කළමනාකරණ ප්‍රතිසංස්කරණ, නවෝත්පාදන මූල්‍යනය, ශක්තිමත් හා විචක්ෂණ මූල්‍ය කළමනාකරණය, තරඟකාරීත්වයට විවෘත වීම, ජාත්‍යන්තරව පිළිගත් මනා පරිචයන් භාවිතය සහ පොදු වගවීම ඉහළ නංවන ලද ඵලදායී මානව සම්පත් කළමනාකරණය තුළින් ස්වයංපෝෂිත වීම සඳහා රජය සතු වාණිජ ව්‍යාපාර දිරිමත් කිරීම සහ මඟ පෙන්වීම රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන ක්‍රමෝපාය වේ.

2018 වසරේ මුල් මාස එකොළහ තුළ දී රජයේ බදු නොවන ආදායම සඳහා රු. මිලියන 41,828 ක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර ඇති අතර ඉන් රු. මිලියන 37,320 ක් අයභාර වන අතර රු. මිලියන 4,598 ක් ලාභාංශ වේ. 2018 වසරේ මුල් මාස එකොළහ තුළ රජය සතු වාණිජ ව්‍යාපාර 48 ක් මගින් රු. මිලියන 42,364 ක අලාභයක් වාර්තා වී ඇත.

රාජ්‍ය ව්‍යාපාරයන්හි කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ දී, සාමූහික අභිලාෂ ප්‍රකාශ සංකල්පය හඳුන්වා දුන් අතර, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යන ප්‍රධානතම රජය සතු වාණිජ ව්‍යාපාර අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුම් අත්සන් තැබිණි. සාමූහික අභිලාෂ ප්‍රකාශ තුළ මූල්‍ය සහ මූල්‍ය නොවන කාර්යසාධනය පිළිබිඹු කරනු ලබන අතර ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරීත්වය ඉලක්ක කර ගත් කාර්යසාධන දර්ශක එහි ඇතුළත් වේ.

එසේම, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා සතොස (පුද්ගලික) සමාගම, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය දැව සංස්ථාව, කුරුණෑගල වැවිලි සමාගම, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, මිල්කෝ (පුද්ගලික) සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන තෝරාගත් ආයතන දහය සමඟ ද 2018 වසරේ ඔක්තෝම්බර් මස අවසන් වන විට සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුම් අත්සන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, රට තුළ පැවති දේශපාලන සහ පරිපාලන අස්ථාවරභාවය නිසා ඉහත සාමූහික අභිලාෂ ප්‍රකාශයේ අත්සන් කිරීම 2019 වසරේ පළමු කාර්තුව අවසානය දක්වා කල් තබන ලදී.

## 3.2. රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් පිළිබඳව කෙටි හැඳින්වීම

### ලංකා බැංකුව

ගනුදෙනුකරුවන් වෙත නවීන බැංකු පහසුකම් සැපයීම සඳහා ඩිජිටල්කරණය යන ආයතනික සැලසුම් තේමාවට අනුව 2018 වසරේ ජනවාරි මාසයේ දී බැංකුව විසින් නවතම 'B App' ජංගම දුරකථන භාවිත යෙදුම හඳුන්වාදෙන ලදී. මූල්‍ය ක්ෂේත්‍රය තුළ නව නිපැයුම් අවකාශයේ ප්‍රමුඛස්ථානය ලබාගැනීමේ අරමුණෙන්, 2018 වසරේ පෙබරවාරි මාසයේ දී ලංකා බැංකුවේ පළමු 'BOC DIGI' ශාඛාව ආරම්භ කරන ලදී. 577 ක් වන ශාඛා ජාලය හරහා ලංකා බැංකුව සිය ගනුදෙනුකරුවන්ට සේවය සලසනු ලබයි.

2018 වසරේ නොවැම්බර් මාසය අවසාන වන විට රු. ට්‍රිලියන 2.1 ක විශාලතම වත්කම් පදනමක් සහිතව ලංකා බැංකුව තව දුරටත් මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයක රැඳී සිටී. 2017 වසරේ අවසානයේ පැවති රු. ට්‍රිලියන 1.9 ක් වූ වත්කම් පදනමට සාපේක්ෂව 2018 වසරේ බැංකුවේ වත්කම් පදනම සියයට 11.7 කින් ඉහළ ගොස් ඇත. ලංකා බැංකුව 2017 වසරේ පළමු මාස එකොළහ තුළ සියයට 18.0 ක තැන්පතු වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ සියයට 9.5 ක් වන තැන්පතු වර්ධනයක් වාර්තා කර ඇත. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී අක්‍රීය ණය අනුපාතිකය 2017 වසරේ වාර්තා වූ සියයට 2.9 සිට සියයට 4.2 දක්වා වර්ධනය වී ඇත. ලංකා බැංකුව 2018 වසරේ පළමු මාස එකොළහ තුළ බදු පෙර ලාභය ලෙස රු. බිලියන 27.7 ක් වාර්තා කළ අතර එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ බදු පෙර ලාභය සමඟ සැසඳීමේ දී සියයට 17.0 ක වර්ධනයක් වේ.

### මහජන බැංකුව

මහජන බැංකුව ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට ගෙනයමින් 2020 වසර වන විට 'ඉහළතම ඩිජිටල්කරණය කරන ලද බැංකුව' බවට පත්වීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ජංගම බැංකු දුරකථන භාවිත යෙදුම වන 'People's Wave' හඳුන්වාදෙන ලදී. 2018 වසරේ නොවැම්බර් මාසය අවසාන වන විට බැංකුව විසින් මුදල් තැන්පත් යන්ත්‍ර (CDMs), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) සහ උපයෝගී බිල්පත් ගෙවීම සඳහා කියොස්ක් (Kiosk) යන්ත්‍ර වලින්

සමන්විත ස්වයංක්‍රීය බැංකු ඒකක 208 ක් සමඟ සිය ගනුදෙනුකරුවන්ට බැංකු පහසුකම් ලබාදේ.

රු. ට්‍රිලියන 1.5 ක් ලෙස 2017 වසර අවසානයේ පැවති බැංකුවේ වත්කම් පදනම, 2018 වසරේ නොවැම්බර් මාසය අවසාන වන විට රු. ට්‍රිලියන 1.7 දක්වා සියයට 14.0 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2017 වසර අවසානයේ රු. ට්‍රිලියන 1.2 ක් වූ තැන්පතු පදනම 2018 වසරේ නොවැම්බර් මස අවසානය වන විට සියයට 16.0 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු. ට්‍රිලියන 1.4 ක් දක්වා වැඩි වී ඇත. බැංකුවේ ණය කළඹ 2018 වසරේ මුල් මාස එකොළහ තුළ සියයට 8.0 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු. ට්‍රිලියන 1.2 ක් වාර්තා කර ඇත. 2017 වසර අවසානයේ දී සියයට 1.9 ක් ලෙස පැවති බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී සියයට 2.5 දක්වා වැඩි වී ඇත. මහජන බැංකුව 2018 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා රු. බිලියන 20.7 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ශ්‍රී ලංකාවේ විශාලතම ඉතුරුම් බැංකුව වන අතර ශ්‍රී ලංකා රජය විසින් තැන්පතු සම්පූර්ණයෙන්ම සහතික කර ඇති එකම බැංකුව ද වේ. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ශාඛා දෙකකින් ශාඛා ජාලය වැඩි කරමින් ශාඛා 255 ක් දක්වා ව්‍යාප්තිය වැඩි කරගෙන ඇත. රට පුරා විහිදුනු තැපැල් කාර්යාල /උප තැපැල් කාර්යාල 4,063 ක් සමඟින් බැංකුවේ ශාඛා ජාලය තවදුරටත් ශක්තිමත් වී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2018 වසරේ දී නොකඩවා 16 වන වරටත් ෆිච් රේටින් ශ්‍රේණිගත කිරීමෙහි AAA (lka) ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීම පවත්වාගෙන ඇත.

රු. ට්‍රිලියන 1.0 ක් ලෙස 2017 වසර අවසානයේ පැවති බැංකුවේ වත්කම් පදනම, 2018 වසරේ නොවැම්බර් මාසය අවසාන වනවිට රු. ට්‍රිලියන 1.03 දක්වා සියයට 3.0 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2017 වසර අවසානයේ රු. බිලියන 721 ක් ලෙස පැවති තැන්පතු පදනම රු. බිලියන 803 දක්වා සියයට 11.4 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ශුද්ධ ණය සහ අත්තිකාරම් රු. බිලියන 434 ක් දක්වා සියයට 20.6 කින් වර්ධනය වී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 2018 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා රු. බිලියන 7.3 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට අදාළ බදු පෙර ලාභයට සාපේක්ෂව සියයට 39.0 ක අඩුවීමකි.

### ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ 2017 වසරේ වාර්තාගත රු. මිලියන 208,018 ක ආදායමට සාපේක්ෂව 2018 වසරේ නොවැම්බර් මාසය අවසන් වන විට රු. මිලියන 216,819 ක ආදායමක් වාර්තා කර ඇත. 2018 වසරේ මුල් භාගය තුළ දී වැසි සහිත කාලගුණික තත්ත්වය හේතුවෙන් ජල විදුලි උත්පාදනය වර්ධනය වීමත් සමඟ සෘජු උත්පාදන පිරිවැය අඩු වූ අතර එමඟින් 2017 වසරේ නොවැම්බර් මාසය අවසන් වන විට වාර්තා කරන ලද මෙහෙයුම් අලාභය වූ රු. මිලියන 36,061 ක සාපේක්ෂව මෙහෙයුම් අලාභය සියයට 47.0 කින් අඩුකර ගැනීමට හැකිවිය.

විදුලි උත්පාදනය මූලාශ්‍රයන්හි සංකලනය වන ගිගාවොට් පැය 3,950 ක වූ ජල විදුලි, පුනර්ජනනීය බලශක්ති හා සුළං බල උත්පාදනය, ගිගාවොට් පැය 4,773 ක් වූ තාප විදුලි උත්පාදනය සහ ගිගාවොට් පැය 4,828 ක් වූ ගල් අඟුරු විදුලි උත්පාදනය 2017 වසරේ 29:35:36 යන අනුපාතයේ සිට සමාලෝචනය කරන ලද කාලපරිච්ඡේදයේ දී 44:23:34 අනුපාතය දක්වා වෙනස් වී ඇත. 2018 වසර මුල් භාගය තුළ දී ඇති වූ වැසි කාලගුණය හේතුවෙන් සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී පෙර වසරට සාපේක්ෂව ජල විදුලි උත්පාදනය ආසන්න වශයෙන් සියයට 73.0 කින් වර්ධනය විය. එමනිසා, පෙර වසරේ එක් ඒකකයක් වෙනුවෙන් දරණ ලද පිරිවැය වූ රු. 19.77 සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී රු. 18.25 දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇත.

පසුගිය වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී බැංකු වෙතින් ලබාගන්නා ලද ණය ප්‍රමාණය වූ රු. මිලියන 1,242 ට සාපේක්ෂව 2018 වසරේ දී ලබාගන්නා ලද ණය ප්‍රමාණය රු. මිලියන 59,849 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත (මහජන බැංකුවෙන් ලබාගන්නා ලද රු. බිලියන 35 ද ඇතුළුව). පිරිවැය පිලිඹිබු මිල ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට සිය ද්‍රවශීලතා අවශ්‍යතාවයන් රාජ්‍ය බැංකු වෙතින් ණය ලබාගැනීම මඟින් කළමනාකරණය කර ගැනීමට සිදු වූ අතර එමනිසා ණය ලබාගැනීම් ද වර්ධනය වී ඇත. 2017 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය් තුළ දී ලංකා විදුලිබල මණ්ඩලය විසින් බැංකු වලට ගෙවීමට ඇති හිඟ ණය ප්‍රමාණය වූ රු. මිලියන 24,393 හා සැසඳීමේ දී 2018 වසරේ රු. මිලියන 67,015 ක් විය.

තවද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ඛණිජ තෙල් සංස්ථාවට සහ පෞද්ගලික විදුලිබල ගැනුම්කරුවන් වෙත නොගෙවූ බැඳීම් 2017 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී වාර්තා වී තිබූ රු. මිලියන 64,603 සාපේක්ෂව 2018 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී රු. මිලියන 60,556 දක්වා අඩු වී ඇත.

**3.1 වගුව | විදුලි ජනන ධාරිතාවයේ සංයුතිය**

| ප්‍රභවය | 2018 ජන. - නොවැ.[(අ)] | | |
|---|---|---|---|
| | ස්ථාපිත ධාරිතාවය (මෙගා වොට්) | (ගිගා වොට් පැය) | මුළු උත්පාදන ධාරිතා ප්‍රතිශතය |
| ජල විදුලිය | 1,387 | 4,744 | 33 |
| තාප විදුලිය - ලං.වි.ම. තෙල් | 604 | 1,694 | 12 |
| තාප විදුලිය - පෞ.වි.ගැ. තෙල් | 629 | 1,553 | 11 |
| තාප විදුලිය - ගල් අඟුරු | 900 | 4,971 | 34 |
| පුනර්ජනනීය බලශක්ති හා සුළං බල | 560 | 1,577 | 11 |
| **එකතුව** | **4,080** | **14,539** | 100 |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා විදුලිබල මන්ඩලය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් අලාභය, පිරිවැයට වඩා අඩු මිලකට නිෂ්පාදන අලෙවි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ මෙහෙයුම් ලාභය 2017 වසරේ මුල් මාස එකොළහ තුළ දී වාර්තාගත රු. මිලියන 15,450 ට සාපේක්ෂව 2018 වසරේ නොවැම්බර් මස අවසානය වන විට රු. මිලියන 19,034 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇත.

2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් ආනයන වියදම රු. මිලියන 335,526 ක් විය. තවද, 2018 වසරේ පළමු මාස එකොළහ තුළ දී බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිල ඩොලර් 57.19 ක් වූ අතර 2017 වසරේ එම කාලපරිච්ඡේදයේ දී බැරලයක මිල ඩොලර් 56.68 ක් ලෙස සටහන් විය. මෙහෙයුම් අලාභ සහ මූල්‍යමය බාධාවන් අවම කිරීමේ ක්‍රමෝපායක් ලෙස 2018 මැයි මාසයේ දී සංස්ථාව විසින් මිල සූත්‍රයක් හඳුන්වාදෙන ලදී. කෙසේ වුවද, අවදානම් සහිත වෙළඳපල අර්බුදය සහ වෙළඳපල බිඳ වැටීම නිසා තෙල් ඉල්ලුම අඩු වීම යන කරුණු හේතුවෙන් අදාළ කාලපරිච්ඡේදය තුළ දී මිල ඉහළ යාමේ ප්‍රවණතාව අඩුවිය.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුළු විකුණුම් පිරිවැය 2017 වසරේ මුල් මාස එකොළහ තුළ දී වාර්තාගත රු. මිලියන 373,657 ට සාපේක්ෂව, 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී රු. මිලියන 475,330 ක් දක්වා සියයට 27.0 කින් වැඩි වී ඇත. විශාල මූල්‍ය පිරිවැය සහ හිඟ ණය ශේෂ පැවතීම හේතුවෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වර්තමානයේ දරුණු මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇත. ඊට අමතරව, ණය නැවත අයකර ගැනීම් විශාල ප්‍රමාණයක් පැවතීම ආයතනයේ මූල්‍ය තත්ත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. ඉහත අවදානම් තත්ත්වයක් පිළිඹිබු කරමින් 2018 වසරේ නොවැම්බර් මස අවසානයේ දී සමුච්චිත අලාභය රු. මිලියන 313,182 ක් ලෙස වාර්තා වේ.

සංස්ථාව සතු මෙහෙයුම් සහ මූල්‍යමය බාධා රාජ්‍ය වාණිජ බැංකු දෙක තාවකාලිකව අන්තර්ග්‍රහන කරන ලද අතර 2018 වසරේ නොවැම්බර් මස 30 දිනට මෙම බැංකු දෙක සඳහා ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 558,798 කි. ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම ද ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපා ඇති අතර 2017 වසරේ මුල් මාස එකොළහ තුළ දී විනිමය අනුපාතික බලපෑම වන රු. මිලියන 5,992.48 ට සාපේක්ෂව 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී එම අගය රු. මිලියන 75,241.66 ක් විය.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2020 වසර ඉලක්ක වන සියයට 60.0 ක සමස්ත නළ ජල ආවරණය, සියයට 91.7 ක ආරක්ෂිත ජල සම්පාදන ආවරණය සහ සියයට 3.3 ක නළ ජලාපවහන ආවරණය පරිදි, 2018 වසරේ මුල් මාස එකොළහ තුළ දී සියයට 50.2 ක සමස්ත ජල නළ ආවරණයක්, සියයට 90.0 ක ආරක්ෂිත ජල සම්පාදන ආවරණයක් සහ සියයට 2.1 ක සමස්ත නළ ජලාපවහන ආවරණයක් වාර්තා කර ඇත. දැනටමත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජල සම්පාදන යෝජනා ක්‍රම 343 ක්

සහ නළ මාර්ග සඳහා ව්‍යාපෘති දෙකක් දියත් කර ඇත.

වගකීම් සපුරාලීම සහ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ පරමාර්ථයෙන්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දේශීය අරමුදල් ලෙස ව්‍යාපෘති 33 ක් සඳහා රු. මිලියන 83,908 ක්, විදේශීය අරමුදල් ව්‍යාපෘති සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1,155.38 ක් සහ යුරෝ මිලියන 170.03 ක් වශයෙන් 2018 වසරේ නොවැම්බර් මස 30 වන දිනට මුදල් අමාත්‍යාංශය විසින් ණය සීමා අනුමත කර ඇත. නාගරික ව්‍යාපෘති සඳහා සියයට 50.0 ක්, ග්‍රාමීය ව්‍යාපෘති සඳහා සියයට 75.0 ක් සහ වකුගඩු ආශ්‍රිත රෝග අඩු කිරීමේ ව්‍යාපෘති සඳහා සියයට 100.0 ක් ආවරණය වන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය මුදල් වලින් රු. මිලියන 580 ක් මහා භාණ්ඩාගාරය විසින් 2018 වසරේ පළමු මාස අට තුළ දී සපයා ඇත.

2017 වසරේ මුල් මාස අට තුළ දී වාර්තා වූ පරිදි රු. මිලියන 16,644 ක් වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල ආදායම, 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී රු. මිලියන 17,310 ක් ලෙස සියයට 4.0 කින් වර්ධනය වීම සාමූහික අභිලාෂ ප්‍රකාශය සඳහා වූ ත්‍රෛපාර්ශවීය ගිවිසුම සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියයට 40.0 ක් වූ ඉලක්කගත ආදායමට අනුවය. එමෙන්ම සියයට 40.0 ක ආදායම් වැඩි වීම සහ 2017 වසරේ අපේක්ෂිත ලාභය සියයට 1.0 කින් වර්ධනය වීම හමුවේ වුවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හි බදු පෙර ලාභය සියයට 90.0 ක් දක්වා රු. මිලියන 83 කින් අඩුවිය.

කාන්දුවීම්, මැනීමේ ගැටළු සහ අනවසර පරිභෝජනය හේතුවෙන් ආදායම් නොලබන ජලය පිළිගත නොහැකි ප්‍රමාණයක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුය. 2018 වසරේ පළමු මාස අට අවසානයේ දී ආදායම් නොලබන ජල මට්ටම, පෙර වසරේ එම කාලපරිච්ඡේදය පරිදිම සියයට 25.6 සිට සියයට 25.3 දක්වා සුළු වශයෙන් පහත වැටී ඇත.

**3.2 වගුව | රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ලාභදායිත්වය**

රු. මිලි.

| ව්‍යවසායය | ලාභය/(අලාභය) | | |
|---|---|---|---|
| | 2016 | 2017 | 2018.11.30 දිනට (තාවකාලික) |
| ලංකා බැංකුව | 31,189 | 37,592 | 27,725 |
| මහජන බැංකුව | 20,814 | 25,913 | 20,663 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 13,303 | 14,029 | 7,354 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 706 | 446 | 483 |
| නිවාස සංවර්ධන හා මූල්‍ය බැංකුව | 660 | 557 | 421 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 259 | 378 | 275 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1,256 | 2,191 | 1,425 |
| ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 691 | 708 | 473 |
| සේවක භාරකාර අරමුදල් මණ්ඩලය | 16,043 | 19,534 | 21,345 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 13,791 | 5,890 | 3,521 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 2,840 | 813 | 2,881 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 193 | (182) | 274 |
| කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | (3,261) | (3,895) | (2,897) |
| ලංකා විදුලිබල මණ්ඩලය | (13,191) | (49,231) | (18,891) |
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 69,620 | 3,504 | (94,459) |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය[අ] | 1,035 | 13,222 | 12,329 |
| ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 1,737 | 738 | 350 |
| ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 6,909 | 10,820 | 9,623 |
| ශ්‍රී ලංකන් එයාලයින් සමාගම | (12,622) | (28,930) | (40,611) |
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | (633) | 1,617 | 2,100 |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | (958) | (943) | (954) |
| ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 499 | 757 | 436 |
| රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව[අ] | 23 | (491) | 82 |
| මිල්කෝ (පුද්ගලික) සමාගම | 274 | (154) | (770) |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 9 | (869) | (429) |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | (117) | (101) | ලැ.නො. |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | (564) | (399) | ලැ.නො. |
| කුරුණෑගල වැවිලි සමාගම | 144 | 248 | 211 |
| හලාවත වැවිලි සමාගම | 126 | 85 | (26) |
| කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව | 43 | 31 | (17) |
| ශ්‍රී ලංකා කජු සංස්ථාව | (52) | 16 | ලැ.නො. |
| ලංකා ඛනිජ වැලි සමාගම | 170 | 535 | 676 |
| ලංකා පොස්පේට් සමාගම | 61 | 32 | 9 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 1 | 24 | 22 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,695 | 2,331 | 1,997 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 897 | 624 | 400 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 441 | 322 | 222 |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 53 | 60 | 28 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | 1,940 | 1,868 | 1,135 |
| ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | (171) | (144) | (5) |
| ස්වාධීන රූපවාහිනී සේවය | (70) | (287) | (520) |
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව[(ආ)] | 107 | (196) | 223 |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 84 | 75 | 68 |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | 9 | 25 | 4 |
| රාජ්‍ය දැව සංස්ථාව | 531 | 967 | 436 |
| සීමාසහිත රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව | 61 | 71 | 3 |
| ලංකා සතොස (පුද්ගලික) සමාගම[(අ)] | (4,445) | (2,255) | (89) |
| රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | (32) | (229) | (222) |
| ලංකා ධීවර සංස්ථාව | (161) | ලැ.නො. | ලැ.නො. |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | (113) | (64) | ලැ.නො. |
| ලංකා පොහොර සමාගම | 713 | 836 | 21 |
| කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 253 | 70 | 184 |
| හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම | 172 | 173 | 127 |
| ලංකා සිනි (පුද්ගලික) සමාගම | 1,006 | 638 | ලැ.නො. |
| **එකතුව** | **154,968** | **59,370** | **(42,364)** |

*මූලාශ්‍රය: රජය සතු ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

*(අ) ලාභදායිත්වය 2018.09.30*
*(ආ) ලාභදායිත්වය 2018.10.31*
*ලැ.නො. - ලැබී නොමැත*

### 3.3 වගුව | රජය සතු වාණිජ ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම

*රු. මිලි.*

| ව්‍යවසායය | 2014 | 2015 | 2016 | 2017 | 2018.11.30 දිනට |
|---|---|---|---|---|---|
| **අයභාර** | **42,137** | **26,118** | **92,338** | **50,447** | **37,230** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 4,000 | 2,800 | 12,026 | 3,865 | 500 |
| ලංකා බැංකුව | 6,500 | 5,000 | 18,000 | 12,000 | 4,500 |
| මහජන බැංකුව | 6,000 | 3,000 | 8,000 | 5,000 | 3,200 |
| විදුලි සංදේශ නියාමන කොමිසම | 10,000 | 10,000 | 28,000 | 22,800 | 21,850 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 10,000 | - | 10,000 | - | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 10 | 10 | 10 | 25 | - |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව | - | 87 | 88 | - | - |
| රාජ්‍ය දැව සංස්ථාව | 25 | 50 | 175 | 100 | 100 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 25 | 30 | 65 | 45 | 50 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 4,000 | 3,000 | 2,500 | 2,100 | 2,750 |
| භූ විද්‍යා හා පතල් කාර්යාංශය | 650 | 850 | 900 | 1,500 | 1,700 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | 75 | 175 | 100 | 25 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | - | - | - | - | - |
| ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව | 2 | - | - | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලය | - | - | 8,000 | - | - |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 100 | 141 | 115 | 220 | 250 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | - | 50 | 550 | - | - |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම | - | - | - | - | - |
| ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | - | - | - | - | - |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | - | - | - | - | - |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | - | - | 25 | - | 15 |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | - | - | - | - | - |
| ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | - | 25 | 25 | 25 | 25 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 500 | 500 | 1,500 | 1,000 | 1,000 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 250 | 400 | 768 | 800 | 800 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | 75 | 100 | 216 | 222 | - |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | - | - | 200 | 160 | 165 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | - | - | 1,000 | 185 | 200 |
| ජාතික ගමනාගමන කොමිසම | - | - | - | 300 | 100 |
| **ලාභාංශ** | **4,664** | **3,678** | **15,821** | **3,550** | **4,598** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 60 | 60 | 60 |
| ලංකා බැංකුව | 346 | 346 | 346 | 346 | 346 |
| මහජන බැංකුව | 316 | 316 | 316 | 316 | 316 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 36 | 36 | 36 | 41 | 41 |
| ජාතික සංවර්ධන බැංකුව | 6 | 5 | 2 | 2 | 1 |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව | - | - | - | - | 86 |
| ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 2,001 | 1,003 | 11,857 | 503 | 1,856 |
| ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 500 | 497 | 1,500 | 850 | 300 |
| ලංකා ඛනිජ වැලි සමාගම | 43 | 14 | - | - | 35 |
| ලංකා පොස්පේට් සමාගම | 35 | 30 | - | 8 | 5 |
| ස්වාධීන රූපවාහිනී සේවය | 125 | 84 | - | 10 | 12 |
| ලංකා ලේලන්ඩ් සමාගම | 11 | 54 | 34 | 35 | 45 |
| රක්නා ආරක්ෂක ලංකා සමාගම | 68 | 93 | - | - | 40 |
| මන්තායි සෝල්ට් ලිමිටඩ් | 1 | - | - | - | - |
| ලංකා පොහොර සමාගම | 38 | 54 | 116 | 90 | 21 |
| කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 12 | 10 | 25 | 12 | 20 |
| පරන්තන් කෙමිකල්ස් සමාගම | 10 | 5 | - | 8 | 11 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | 1 | - | - | - | - |
| ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව | - | - | 5 | - | - |
| ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 759 | 795 | 795 | 795 | 795 |
| ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 49 | 61 | 62 | 79 | 106 |
| ලංකා විදුලිබල සමාගම | 25 | 87 | 152 | 218 | 305 |
| ලංකා කාර්මික වතු සමාගම | 55 | 55 | 47 | 55 | 78 |
| නිපුනතා සංවර්ධන අරමුදල | - | 2 | - | - | - |
| ලංකා කෘෂිකර්මාන්ත සමාගම | 7 | 6 | 12 | 12 | 19 |
| ලංකා සීනි (පුද්ගලික) සමාගම | 80 | - | - | - | - |
| ඒෂියන් ප්‍රතිරක්ෂණ සමාගම | - | - | - | - | - |
| ලංකා ලොජස්ටික්ස් සමාගම | 2 | 2 | 5 | - | 1 |
| ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම | - | - | 438 | - | - |
| වැවිලි සමාගම්** | 80 | 62 | 10 | 103 | 95 |
| වෙනත් | - | 1 | 3 | 7 | 4 |
| **එකතුව** | **46,801** | **29,796** | **108,159** | **53,997** | **41,828** |

*මූලාශ්‍රය: රජය සතු ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

***කුරුණෑගල, කළුබෝවිටියන, හලාවත, පුස්සැල්ලාව, කොටගල, නමුණුකුල, ඇල්පිටිය වැවිලි සමාගම් ඇතුළුව ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම, කාසන්ස් සමාගම, ලංකා කැනරීස් සමාගම, යුනයිටඩ් මෝටර්ස් ලංකා සමාගම, බෝගල ග්‍රැෆයිට් සමාගම, ඔටෝ ග්‍රිල් ලංකා සමාගම, හුන්නස් ෆෝල්ස් සමාගම, ලංකා හයිඩ්‍රොලික් සර්විස් පුද්ගලික සමාගම ජයබහළුම් පර්යන්ත සමාගම ඇතුළුව*

# 04

# 2019 අයවැය ඇස්තමේන්තු සැකසීම සඳහා පදනම් වූ සාධක

## දළ දේශීය නිෂ්පාදිතය

ආර්ථිකයේ කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා අංශයන්හි සිදු වන ධනාත්මක සංවර්ධනයන් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වසරේ සියයට 3.5 - 4.5 ත් අතර වර්ධනයක් අත්පත් කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපනයන සහ ආයෝජන සඳහා සහාය වන අඩු උද්ධමනකාරී පරිසරය සහ තරඟකාරී විනිමය අනුපාතිකය ආර්ථික වර්ධනයේ ප්‍රබලතාවකට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආහාර සුරක්ෂිතතාව සහ තිරසාර කෘෂිකර්මාන්තයක් සහතික කිරීමට එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු වලට (SDGs) අනුකූලව රජය විසින් ගෙන ඇති මූලාරම්භයන් හේතුවෙන් 2019 වසරේ දී කෘෂිකාර්මික අංශය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, කෘෂිකාර්මික නිෂ්පාදනයට සහ පර්යේෂණ සඳහා පුද්ගලික අංශයේ මැදිහත්වීම තවදුරටත් දිරිමත් කෙරේ. භෞතික හා නියාමන යටිතල පහසුකම්, වෙළඳපල ප්‍රවේශය, අගය එකතු කළ අපනයන නිෂ්පාදනයන්ගේ වර්ධනය සහ “Enterprise Sri Lanka” වැඩසටහන ඇතුළු තාක්ෂණික වර්ධනයන් හේතුවෙන් කර්මාන්ත අංශය තවදුරටත් වර්ධනය වනු ඇත. දේශීය හා විදේශීය වෙළඳාම, විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණික වැඩ සටහන්, සංචාරක, ප්‍රවාහන, මූල්‍ය සේවා සහ දේපල වෙළඳාම යනාදි අංශයන්හි ධනාත්මක දායකත්වය තුළින් සේවා අංශයේ ප්‍රගතිය පවත්වාගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පාරිභෝගික මිල ගණන්

2019 වසර තුළ දී උද්ධමනය මධ්‍ය තනි අගයක පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. වර්ධන වූ දේශීය සැපයුම හා බෙදා හැරීමේ ජාලය සහ වැඩි වන කෘෂිකාර්මික නිෂ්පාදන සමඟ තරඟකාරී වෙළඳපල රාමුවක් තුළ සාධාරණ මිලකට ආහාර ආනයනය කිරීමට ඉඩ සැලැස්වීම තුළින් කෙටි කාලීනව ස්ථාවර මිලක් පවත්වා ගැනීමට උපකාරී වනු ඇත. අඩු උද්ධමන අනුපාතයක් පවත්වාගෙන යෑම ආර්ථික කටයුතුවලට සහ වෙළඳපළ තරඟකාරීත්වය පවත්වාගෙන යාමට උපකාරී වේ. ඒ අනුව, වෙළඳපල පොළී අනුපාත අඩු මට්ටමක පවත්වාගත හැකි වන අතර එමගින් වඩා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට දිගුකාලීන හිතකර ආර්ථික වර්ධනයට හිතකර පරිසරයක් නිර්මාණය කෙරේ.

## සේවා නියුක්තිය හා සේවා වියුක්තිය

පුද්ගලික අංශයේ ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟ, විශේෂයෙන් තරුණ පරපුර සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීමට රජය විසින් ගෙන ඇති මූලාරම්භයන් සමගින් සේවා නියුක්ත පුද්ගලයින් ගණන ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් සමඟ ආයෝජක විශ්වාසය ඉහළ නැංවීම තුළින් රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් බිහි කිරීමට අවස්ථාව සැළසෙනු ඇත. ළමා සුරැකුම් මධ්‍යස්ථාන, අර්ධ කාලීන රැකියාවල නියුතු වීමට පහසු වන පරිදි ප්‍රවාහන පහසුකම් සැපයීම, නම්‍යශීලී වැඩ පරිසරය, පුද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සඳහා මාතෘ වරප්‍රසාද වැඩි කිරීම සහ වෘත්තීය පුහුණු ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම යනාදිය මඟින් ක්‍රියාකාරී ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. දේශීය ශ්‍රම වෙළඳපලෙ හි හිඟයක් ඇති නොවන පරිදි විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. පුද්ගලික අංශයේ සහභාගිත්වය ද ඇතුළුව 2019 වසරේ දී මුළු ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස සේවා වියුක්ති අනුපාතය සියයට 4.0 ක් ලෙස පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ගෙවුම් ශේෂය

මූල්‍ය වෙළඳපලෙ හි මෑත කාලීන ප්‍රවණතා ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවාහයන්ට බලපෑම් කෙරේ. ගෝලීය ආර්ථික විචලනයන් මධ්‍යයේ වුව ද, ගෙවුම් ශේෂයේ සමස්ත අතිරික්ත ශේෂය සහ එමගින් වර්ධනය වන රටෙහි විදේශ සංචිත හේතුවෙන් 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශ අංශය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් ජනපදය, යුරෝපය සහ ඉන්දියාව වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථිකයන්, 2019 වසර වන විට තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. චීනය සහ ජපානය වැනි රටවල් සමඟ දැඩි ආර්ථික ඒකාබද්ධතාවයක් ගොඩනගා ගැනීම, මෙරටෙහි අපනයන සඳහා යහපත් බලපෑමක් ඇති කෙරේ. සංචාරක සේවා සහ වරාය ආශ්‍රිත සේවා සැපයීමෙන් ලද ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන් විසින් මෙරටට එවනු ලබන ප්‍රේෂණ හේතුවෙන් සේවා ගිණුම වර්ධනය වීමෙන්, බාහිර ජංගම ගිණුමේ හිඟය සමනය වනු ඇත. වර්ධනය වූ විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය පිළිබිඹු කරමින් හිමිකම් සහ ණය ආයෝජනය ඉහළ යාම හේතුකොට ගෙන 2019 වසරේ දී ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම් ශක්තිමත් වනු ඇත.

### විනිමය අනුපාතය

විනිමය අනුපාතය 2019 වසරේ දී අඛණ්ඩව තවදුරටත් ස්ථාවරව පවත්වා ගැනීමට අපේක්ෂා කරන අතර මෙරටෙහි විදේශ සංචිත ශක්තිමත් කිරීමෙන් සහ ගෝලීය වෙළඳපල තුළ ශ්‍රී ලංකාවේ අපනයන වල තරඟකාරිත්වය සඳහා සහාය වන අයුරින් නම්‍යශීලී විනිමය අනුපාතය පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

### මුදල් සමස්තයන්

2019 වසරේ දී නාමික ද.දේ.නි. යෙහි අපේක්ෂිත වර්ධනයට අනුකූල වන මට්ටමක මුදල් සැපයුම පවත්වා ගෙන යනු ලැබේ. රාජ්‍ය මූල්‍ය කටයුතු වල අපේක්ෂිත ඒකාග්‍රතාවය සහ රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්යසාධනය වර්ධනය වීමත් සමඟ වෙළඳපලෙ හි පවතින වැඩි සම්පත් ප්‍රමාණය පුද්ගලික අංශය විසින් තම ආයෝජන ප්‍රවර්ධනය කිරීමට යොදා ගැනීමෙන් අපේක්ෂිත ආර්ථික වර්ධනය ළඟා කර ගත හැක.

#### ආදායම

ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා පදනම් වූ උපකල්පන ඇමුණුම IV හි සඳහන් කර ඇත.

#### වියදම

රජයේ වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට යොදා ගත් උපකල්පන පහත සඳහන් වේ.

- රාජ්‍ය සේවයේ මිලියන 1.3 ක පමණ සේවක පිරිසක් සිටින අතර ඔවුන්ට වාර්ෂිකව ලැබෙන අනුමත වැටුප් වර්ධක හේතුවෙන් සිදුවන වාර්ෂික නාමික වැටුප් වැඩිවීම මත වැටුප් හා වේතන වියදම පදනම් වී ඇත.
- 2019 වසරේ විශ්‍රාම යාමට නියමිත විශ්‍රාමිකයින් 25,000 කගේ ආංශික බලපෑම සමඟ විශ්‍රාම වැටුප් ගෙවීම් ලබන විශ්‍රාමිකයින් සංඛ්‍යාව 600,000 ක් වනු ඇතැයි උපකල්පනය කර ඇත.
- ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය අගය අඩු වීමත් සමඟ රජයේ ණය ගැනීමේ අවශ්‍යතාවය මෙන්ම උද්ධමනය ද පහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් දේශීය පොළී අනුපාතිකය පහළ යාමක් අපේක්ෂා කරන අතර, ඒ හේතුවෙන් පොළී ගෙවීම් සුළු වශයෙන් පමණක් ඉහළ යනු ඇත.
- මධ්‍යකාලීන අයවැය ඉලක්කයන් ළඟා කර ගැනීමට, උපයෝගිතා සේවා හා සැපයුම් මත වන වියදම ශක්තිමත්ව කළමනාකරණය කෙරේ.
- පාසල් ළමුන් සහ ආබාධිත රණවිරුවන් සඳහා සහාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් කුටුම්භ සඳහා පැවරුම් සහ සහනාධාර අඛණ්ඩව ලබා දෙනු ලැබේ. අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නොමිලේ ඖෂධ ලබා දීම, දරිද්‍රතාවය පිටු දැකීමේ වැඩසටහන් යනාදී සමාජ ආරක්ෂණ සහ සුභසාධක වැඩසටහන් මෙන්ම කෘෂිකාර්මික ආධාර වැඩසටහන් සහ මිලියනයක රැකියා අවස්ථා ජනනය කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.
- තොරතුරු තාක්ෂණය මත පදනම් වූ වැඩසටහන් රාජ්‍ය ආයතන වෙත පැවරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් සංස්ථාවන්හි තීව්‍ර ප්‍රගතියක් අපේක්ෂා කරන අතර එය ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යෑමට, රාජ්‍ය - පුද්ගලික හවුල්කාරීත්ව සංකල්පය තුළින් පුද්ගලික අංශයේ දායකත්වය ධනාත්මකව යොදා ගනු ලැබේ.
- පුද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් උත්ප්‍රේරණය කිරීම තුළින් ප්‍රශස්ත ආර්ථික වර්ධනයක් ළඟාකර ගනිමින් දරිද්‍රතාවය සහ ප්‍රාදේශීය ආර්ථික විෂමතා අඩු කිරීමේ අරමුණින් අධ්‍යාපනය, සෞඛ්‍ය සහ වෘත්තීය පුහුණුව යනා දී ක්ෂේත්‍ර වල ආර්ථික හා සාමාජීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වූ ජාතික, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ සංවර්ධන වැඩසටහන් සඳහා කෙරෙන රජයේ ආයෝජන ද.දේ.නි. යෙන් සියයට 5.0 ක පමණ මට්ටමක පවත්වා ගනු ලැබේ.
- රාජ්‍ය විදයම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ඵලදායී නොවන වියදම් සීමා කිරීම සඳහා දරන උත්සාහයන් ශක්තිමත් කරනු ඇත.
- සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී අයවැය ප්‍රතිපාදන උපයෝජනයේ සුමට ක්‍රියාකාරීත්වයට සහ ද්විකරණය වැළැක්වීමට විමධ්‍යගත ආයතන සහ රේඛීය අමාත්‍යාංශ සමඟ මනා අධීක්ෂණයකින් සහ සමීප සම්බන්ධතාවයකින් කටයුතු කෙරේ.
- රාජ්‍ය මූල්‍ය සහ මූල්‍ය ප්‍රවාහ කළමනාකරණය සඳහා වගකීම කළමනාකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කෙරේ.

#### ණය ගැනීම්

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2018 වසර අවසානයේ දී පැවති සියයට 76.6 ක පැවති රාජ්‍ය ණය 2020 වසරේ දී සියයට 70.9 දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ. දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය ණය දරණ අනුපාතය ක්‍රමිකව අඩු කිරීම

තහවුරු කිරීම සඳහා දේශීය සහ විදේශීය ණය මනා සංයුතියකින් යුක්තව පවත්වා ගනු ලැබේ. විශේෂයෙන්ම, 2020 වසරේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 14.5 කින් බදු ආදායම වැඩිකිරීම, රාජ්‍ය වියදම් තාර්කිකරණය සහ මෙරටෙහි ආයෝජන පරිසරය ඉහළ නැංවීම යනාදී ක්‍රියාකාරකම් තුළින් රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමෙන් රාජ්‍ය ණය අඩු කෙරේ. අවම පිරිවැයකින් යුක්තව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් රාජ්‍ය ණය කළමනාකරණය අඛණ්ඩව සිදුවනු ඇත.

### ඇස්තමේන්තු වල සංවේදීතාවය

ආර්ථික පුරෝකථන පහත සඳහන් අභියෝග මත විචලනය වනු ඇත:

- ගෝලීය ආර්ථිකය ඉතා ඉක්මනින් යථා තත්ත්වයට පත්වීම අන්තර්ජාතික වශයෙන් ඛනිජ තෙල් සහ අනෙකුත් භාණ්ඩ වල මිල ගණන් අපේක්ෂිත මට්ටමට වැඩි වූයේ නම්, ආනයන පිරිවැය, දේශීය පාරිභෝගික මිල ගණන්, නිෂ්පාදන පිරිවැය මෙන්ම අයවැය වියදම් කෙරෙහි ද අහිතකර ලෙස බලපානු ඇති නමුත්, ඒ හේතුවෙන් ඇති වන අපනයන වැඩිවීම වැනි හිතකර ප්‍රතිඵල

- දේශීය නිෂ්පාදන, විදේශ වෙළෙඳාම, දේශීය මිල ගණන් සහ සමස්ත ආර්ථික වර්ධනයට බලපෑම් ඇතිවිය හැකි පරිදි බාහිර ආර්ථික පරිසරයේ ඇති වන කම්පන සඳහා සිදු කරනු ලබන ගැලපුම් පිරිවැය

- ස්වාභාවික විපත් සහ විශේෂයෙන් මැද පෙරදිග කලාපයේ වැනි අන්තර්ජාතික භූ දේශපාලනික පීඩනයන්ගෙන් ඇති වන අවදානම්

- කෘෂිකාර්මික, ජල විදුලි උත්පාදනය සහ රාජ්‍ය අයවැය මත අහිකර බලපෑම් ඇති විය හැකි අයහපත් කාලගුණික තත්ත්වයන්

- පරිපාලනමය සහ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවහිරතාවයන්

- මැදිකාලීනව අපේක්ෂා කරන පරිවර්තනයන් සිදු කිරීමට පවතින සීමිත හැකියාව හේතුවෙන් විදේශ මූල්‍යයනය මත සිදු කෙරෙන විශාල ව්‍යාපෘති සහ එමගින් ආයෝජන ප්‍රමාණය සහ ආර්ථික වර්ධනය කෙරෙහි ඇති වන බලපෑම්

- මූල්‍ය ස්ථාවරත්වයට බාධා පැමිණි විය හැකි ප්‍රමාණාත්මක අවදානම්

- ගෝලීය අසමතුලිතතාවයන් හේතුකොට ගෙන ලෝක ආර්ථිකයේ වර්ධනය අපේක්ෂිත මට්ටමට ළඟා නොවීම නිසා ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ සේවා සඳහා වන විදේශීය ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි අතර එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය මන්දගාමී වීම

- ජාත්‍යන්තර වෙළඳපලෙ හි ඛණිජ තෙල් සහ පාරිභෝගික භාණ්ඩ මිල ගණන් වල විචලනයන් සාර්ව ආර්ථික ස්ථාවරත්වයට සහ ආර්ථික වර්ධනයේ අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීම කෙරෙහි අයහපත් බලපෑම් ඇති කරනු ලැබිය හැකි අතර එමගින් රජයේ ආදායම සහ වියදම් කෙරෙහි ද ඇතිවන බලපෑම්

- රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ විශ්‍රාම වැටුප් ආශ්‍රිත පුනරාවර්තන වියදම් වැඩිවීමේ ප්‍රවණතාවයන්

- රාජය සතු වාණිජ ව්‍යවසායයන් හි කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට වඩා අවම වීම

## ඇමුණුම - 1

**අයවැය සහාය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති ප්‍රතිපාදන - 2018 ජනවාරි සිට නොවැම්බර්**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කාර්යය | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 1 | අතිගරු ජනාධිපති | ග්‍රාමීය අංශයේ සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම, ශ්‍රී ලංකා අමරපුර සංඝ සභාවේ මහානායක අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස නාහිමියන්ගේ භාවිතය සඳහා වාහනයක් ලබාගැනීම, හිඟ බිල්පත් නිරවුල් කිරීම හා කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන, අයවැය යෝජනා අනුව ජාතික ආර්ථික සභාව සඳහා පුද්ගල පඩිනඩි හා සංවර්ධන සහනාධාර සහ සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපාකාර සමිති සමූහය හරහා දේශීය අල මිල දී ගැනීම | 145,000,000 | 611,890,000 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | අයවැය යෝජනාවක් අනුව සංහිඳියා යාන්ත්‍රණය සම්බන්ධීකරණය කිරීම සඳහා මහලේකම් කාර්යාලයක් ක්‍රියාත්මක කිරීම සහ වාහනයක් ලබාගැනීම | 177,000,000 | 13,000,000 |
| 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | පුද්ගල පඩිනඩි සඳහා වන ප්‍රතිපාදන | 59,400,000 | - |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 2017 වර්ෂයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීම, පුද්ගල පඩිනඩි, ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා, වාහන නඩත්තුව හා මූලධන වත්කම් පුනරුත්ථාපනය/වැඩි දියුණු කිරීම, මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන සඳහා ගෙවීම් කිරීම | 11,850,000 | 85,260,000 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | ප්‍රවාහන සේවා සඳහා වන ප්‍රතිපාදන | 2,600,000 | - |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීම සඳහා වන ව්‍යාපෘතියට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් ලබාදුන් මූල්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම, පුද්ගල පඩිනඩි, ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා, ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැංවීමට සහාය වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 21,550,000 | 7,499,000 |
| 9 | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය | පුද්ගල පඩිනඩි සහ බදුකුලී හා දේශීය බදු සඳහා වන ප්‍රතිපාදන | 1,976,000 | - |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | දූෂණ වලට එරෙහිව සටන් වැදීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, විදේශ ගමන් සහ ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ ලබා ගැනීම | 11,000,000 | 29,032,000 |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | රජයේ සේවකයන් සඳහා වන නිවාස ණය පොළිය | 28,000 | - |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැංවීමේ ව්‍යාපෘතියට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් ලබාදුන් මූල්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම, කිලිනොච්චිය, පුත්තලම සහ | - | 21,065,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | මන්නාරම දිස්ත්‍රික්කයන් හි නැවත තම මුල් බිම් කරා ගිය ජනතාවට තම අයිතීන් වෙත ප්‍රවේශ වීමට ඉඩ ලබාදීම සඳහා වන ව්‍යාපෘතියට එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය මගින් ලබාදුන් ආධාර උපයෝජනය කිරීම, මූලධන වත්කම් පුනරුත්ථාපනය/වැඩිදියුණු කිරීම සහ මානව හිමිකම් කොමිෂන් සභාවේ ධාරිතාවය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | | |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | වාහන නඩත්තුව | 450,000 | - |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | විදේශ ගමන් | 600,000 | - |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලය | ගොඩනැගිලි සහ ව්‍යුහයන් නඩත්තුව | 157,000 | - |
| 23 | විගණන සේවා කොමිෂන් සභාව | ගමන් වියදම් | 1,000,000 | - |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළිය, විදුලි බලය, ජලය, බදු කුලී සහ දේශීය බදු | 13,206,000 | - |
| 25 | සීමා නිර්ණය කොමිෂන් සභාව | පුද්ගල පඩිනඩි, සැපයුම් හා වෙනත් සේවාවන් | 3,205,000 | - |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | විදේශ ගමන්, තැපැල් හා සන්නිවේදන සේවා සඳහා වන ප්‍රතිපාදන | 480,000 | - |
| 101 | බුද්ධ ශාසන අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පුරාණ රජ මහා විහාර ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නවීකරණය කිරීම, හිඟ බැදීම් නිරවුල් කිරීම, නේපාලයේ භූමි කම්පා හේතුවෙන් හානි වූ පූජනීය ස්ථාන නවීකරණය කිරීම, පුද්ගල පඩිනඩි, විදේශ ගමන්, ප්‍රවාහන, රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළිය, රේගු ගාස්තු සහ වෙනත් බදු | 34,144,000 | 381,193,000 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | දහම් දිරිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා දහම් පාසල් ගුරුවරුන් සඳහා දීමනා, දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම්, දහම් පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම සහ අති පූජ්‍ය බෙල්ලන්විල විමලරතන, අතිපූජ්‍ය ගිරාඹේ ආනන්ද සහ අති පූජ්‍ය දරණාගම කුසලධම්ම යන ස්වාමීන්වහන්සේලාගේ අවමංගල්‍යයන් රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදු කිරීම සඳහා දැරීමට සිදුවූ වියදම් නිරවුල් කිරීම | 842,720,000 | - |
| 102 | මුදල් අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව වසන්තම් රූපවාහිනී නාලිකාවේ සේවා වැඩිදියුණු කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන සැලසීම, අයවැය යෝජනා | 537,300,000 | 36,500,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | අනුව ITMIS වැඩසටහන වියදම් ඒකකයන් වෙත ව්‍යාප්ත කිරීම සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වියදම්, හිඟ බැදීම් නිරවුල් කිරීම, වාහන සඳහා වන බදු කුලී ගෙවීම, ගම්පෙරළිය වැඩසටහනට අදාළ වියදම්, ආසියානු පුවත්පත් මණ්ඩල පිළිබඳ සහයෝගිතා සමුළුව, ආරක්ෂක සේවා සඳහා ප්‍රතිපාදන, සංග්‍රහ වියදම්, පුවත්පත් දැන්වීම් සහ පවිත්‍ර කිරීමේ සේවාවන් | | |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | ජූලි වර්ජකයන් සඳහා එක් වරක් පමණක් ලබාදෙන දීමනා වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 60,000,000 | - |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, ලංකා බැංකුව සඳහා ප්‍රාග්ධන පහසුකම් සැපයීම සහ අයවැය යෝජනා අනුව කාර්මික මූලාරම්භයන් සඳහා ආයෝජකයින් | 150,000 | 5,002,000,000 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | ගමන් වියදම, සැපයුම් සහ ප්‍රවාහන සේවාවන් සඳහා ප්‍රතිපාදන | 3,610,000 | - |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන ආරම්භ කිරීම, ජනමාධ්‍යවේදීන් හා කලාකරුවන් සඳහා වන ණය යෝජනා ක්‍රමය සඳහා ණය සහනාධාර, ලියාපදිංචි මූල්‍ය සමාගම් හරහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා ණය සහනාධාර ප්‍රදානය කිරීම, දේශීය කිරිපිටි නිෂ්පාදකයින් සඳහා මිල සහනාධාර සහ සත්කාරක නිවාස වැඩසටහන සඳහා පොළී සහනාධාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ණය ව්‍යාපෘතිය සහ අයවැය යෝජනා අනුව ගබඩා 3 ක් ඉදිකිරීම | 770,000,000 | 1,350,000,000 |
| 244 | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති සංවර්ධන දෙපාර්තමේන්තුව | නැංගුරම් ආයෝජකයෙකු ලෙස පොදු රාජ්‍ය මණ්ඩලීය කුඩා රාජ්‍ය වෙළඳ මූල්‍යකරණ පහසුකම (CSSTFF) සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.5 ක දායකත්ව ගාස්තු ගෙවීම | 239,000,000 | - |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | මූලධන වත්කම් පුනරුත්ථාපනය කිරීම/වැඩිදියුණු කිරීම හා අත්පත් කරගැනීම සඳහා ප්‍රතිපාදන, USAID STAIR ව්‍යාපෘතියේ හා ව්‍යාපෘති ක්‍රියාකාරම්වලට අදාළ බදු නිරවුල් කිරීම, විදේශාධාර ගිණුම්ගත කිරීම, සහ ඊ-රාජ්‍ය ප්‍රසම්පාදන මහලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම | - | 122,718,800 |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම | 10,000,000 | 500,000,000 |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතිය (EDSL) ක්‍රියාත්මක කිරීම | - | 50,000,000 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | රාජ්‍ය ණය ආපසු ගෙවීම සඳහා වන ප්‍රතිපාදන | - | 170,000,000 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, විදේශ ගමන්, ඉන්ධන, තැපැල් හා රජයේ සේවකයින් සඳහා | 6,680,000 | - |

| | | | | |
|---|---|---|---|---|
| | | දේපළ ණය පොළිය සඳහා ප්‍රතිපාදන | | |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | විදේශ ගමන් සඳහා ප්‍රතිපාදන | 1,100,000 | - |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | සමුද්‍රීය ආරක්ෂක හැකියා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, වාහන ලබා ගැනීම සහ ඒකාබද්ධ අරමුදලට ප්‍රතිපූරණය කරනු ලබන මුදල මත පර්යේෂණ කටයුතු සඳහා වියදම් | - | 2,674,429,000 |
| 222 | ශ්‍රී ලංකා යුධ හමුදාව | එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ප්‍රතිපාදන, උතුරු සහ නැගෙනහිර පළාත්වල යුධ හමුදා කඳවුරු ප්‍රතිෂ්ඨාපනය සඳහා වන වියදම් සහ පාකිස්ථානු ණය සඳහා වන ප්‍රතිපාදන | - | 1,649,172,000 |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 2017 වසරට අදාළ හිඟ ගෙවීම් නිරවුල් කිරීම, ගිලන් රථ හයක් මිලදී ගැනීම, මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, වාහන නඩත්තුව, ඉහළ ස්ථායීතාවයක් සහිත වෙරළාරක්ෂක යාත්‍රාවක් අමෙරිකා එක්සත් ජනපදයෙන් ලබා ගැනීම සහ ඉන්ධන සඳහා වන ප්‍රතිපාදන | 150,000,000 | 2,732,035,000 |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සහ ගිලන් රථ දෙකක් මිලදී ගැනීම | - | 627,400,000 |
| 104 | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව විශ්‍රාමිකයින් සඳහා අග්‍රහාර ණය යෝජනා ක්‍රමය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ "රැකියා සඳහා සූදානම් කිරීමේ අරමුදල" ස්ථාපිත කිරීම, යොවුන් සේනාංකය විසින් මෙහෙයවනු ලබන නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා සහාය වීම, අයවැය යෝජනා අනුව ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ සහයෝගයෙන් කාර්මික විද්‍යාල පහක් ස්ථාපිත කිරීම, හිඟ බිල්පත් ගෙවීම, උසස් අධ්‍යාපන විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, ආපදාවන්ගේ බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ණය යෝජනා ක්‍රම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාව තුළ පූර්ව සත්කාරක සේවා හදිසි ගිලන් රථ සේවාවක් ක්‍රියාත්මක කිරීම, උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා වන වියදම්, කුරුණෑගල, රස්නායකපුර කණුකැටිය මුඩුත්තාව ජලාශය, 2018-2019 ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අළුතින් බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා දීමනා ගෙවීම, බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු, වාහන සඳහා වන බදු කුලී, පුද්ගල පඩි නඩි, වාහන නඩත්තුව, ඉන්ධන, ප්‍රවාහන, තැපැල් හා සන්නිවේදන, කුලී සහ රජයේ සේවකයින්ගේ දේපළ ණය පොළිය | 392,730,000 | 29,282,288,000 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | උපාය මාර්ගික ව්‍යාපෘති සැකසුම් සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය | - | 102,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| 252 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | ජාතික සමීක්ෂණ ව්‍යාපෘතියේ දත්ත එක්රැස් කිරීම සහ කලමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මෙවලම් ක්‍රියාත්මක කිරීම, ආසියා සහ පැසිපික් කලාපය සඳහා වන ජාත්‍යන්තර සැසඳුම් වැඩසටහනේ වියදම් සහ කම්කරු තෘප්තිය පිළිබඳ 19 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියමු ව්‍යාපෘතියේ වියදම් | - | 10,412,000 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව ගංවතුරින් හා නායයාමෙන් හානි වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, හිඟ බිල්පත් නිරවුල් කිරීම, නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම හා මීතොටමුල්ල සහ සාලාව ඛේදවාචක වලින් විපතට පත්වූවන්ට වන්දි ලබා දීම, හදිසි අවස්ථාවන්හ දී කඩිනම් සහන ලබාදීම සඳහා උපයෝජනය කිරීමට සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක්ම වෙත රු. මිලියන 1 බැගින් ප්‍රතිපාදන ලබාදීම | 5,544,140,000 | 1,047,819,000 |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වැඩිදියුණු කිරීම, දායකත්ව සහ සම්මාදම් ගාස්තු සඳහා වන වියදම්, තැපැල් හා සන්නිවේදන සේවා, ප්‍රවාහන සේවා, දේශීය ගමන්, පුද්ගල පඩිනඩි හා ඉන්ධන සැපයුම් | 1,000,000 | 200,000,000 |
| 108 | තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පුරාණ රජමහා විහාර හා වෙනත් එවැනි ස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නවීකරණය කිරීම සහ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | - | 24,970,000 |
| 202 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | දහම් දිරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම, දහම් පාසල් ගුරුවරුන් සඳහා දීමනා, දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම්, දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම, විදුලිබල හා ජල සේවා සඳහා ගෙවීම් සිදුකිරීම සහ මුස්ලිම් ප්‍රජාව වෙත රට ඉඳි ලබා දීමට අදාළ හිඟ ගෙවීම් නිරවුල් කිරීම | 157,200,000 | - |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | ශ්‍රී ලංකාවේ සාධාරණත්වය වෙත ප්‍රවේශ වීම ශක්තිමත් කිරීමේ හා වින්දිත සාක්ෂි ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ලැබුණු මුදල් උපයෝජනය කිරීම | - | 21,660,500 |
| 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදනය | - | 2,000,000 |
| 228 | අධිකරණ පරිපාලනය | අයවැය යෝජනා අනුව ශ්‍රව්‍ය හා දෘෂ්‍ය පටිගත කිරීමේ පද්ධතියක් සමග විශේෂ මහාධිකරණයක් පිහිටුවීම, ස්වයංක්‍රීය නඩු කළමනාකරණ යාන්ත්‍රණයක් හඳුන්වා දීම හා මුල් පැමිණිල්ල අදාළ අධිකරණයේ ඉලෙක්ට්‍රොනිකව ගොනුගත කිරීමේ හැකියාව සොයා බැලීම, නායයෑමට ඉඩ ඇති බැවින් රත්නපුර හා වැලිමඩ | 570,640,000 | 975,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | අධිකරණ වෙනත් ස්ථාන වෙත ගෙනයාම, අයවැය යෝජනා අනුව කිලිනොච්චිය, තෙල්දෙණිය, පූගොඩ හා කන්තලේ අධිකරණ පුළුල් කිරීම සහ ප්‍රවාහන සේවා සඳහා වන වියදම්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තුව, ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා, රජයේ සේවකයින්ගේ දේපළ ණය පොළිය හා වෙනත් සේවාවන් | | |
| 229 | නීතිපති දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, ඉන්ධන, දේශීය ගමන් හා වෙනත් සේවාවන් සඳහා වන ප්‍රතිපාදන | 469,740,000 | - |
| 230 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි හා ඉන්ධන සැපයුම් සඳහා වන ප්‍රතිපාදන | 19,700,000 | - |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | වෙනත් සැපයුම් (ඩී.එන්.ඒ. රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම) හා බාහිර රස පරීක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිපාදන | 67,540,000 | - |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | පිටපත් කිරීමේ ගාස්තු, අභියාචනාධිකරණයේ භාෂා පරිවර්තන ඒකකය හා තැපැල් හා සන්නිවේදන සේවාවන් සඳහා වන වියදම් | 6,326,000 | - |
| 111 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව හෙද අභ්‍යාස විද්‍යාලයන්හි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සුවසැරිය සමාරම්භයන් ශක්තිමත් කිරීම, කොළඹ, මහනුවර හා අනුරාධපුර රෝහල් වල විශේෂිත ප්‍රසව මධ්‍යස්ථාන 3 ක් ස්ථාපිත කිරීම, මඩකලපුව හා රත්නපුර රෝහල්වල පිළිකා ඒකක ස්ථාපිත කිරීම, කාසල් වීදියේ කාන්තා රෝහලේ ප්‍රජනන ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, පොළොන්නරුව රෝහලේ මාතෘ සහ නව උපත් ළදරු සංකීර්ණය, මොරටුව ප්‍රාදේශීය රෝහල, දෙනියාය ප්‍රාදේශීය රෝහල හා බේරුවල මූලික රෝහල පුළුල් කිරීම, මාතර දිස්ත්‍රික් මහ රෝහලේ මාතෘ, ළමා, වෛද්‍ය හා පරිපාලන ඒකක කඹුරුගමුවට ගෙන යාම මගින් එම රෝහල අළුත්වැඩියා කිරීම, මහරගම දන්ත සෞඛ්‍ය ආයතනය වැඩිදියුණු කිරීම, රජයේ බෙහෙත් ශාලා ජාලය වැඩිදියුණු කිරීම හරහා මූලික සෞඛ්‍ය කටයුතු වැඩිදියුණු කිරීම, පුළුල් ආහාර ස්වස්ථතා සහ ආහාර සුරැකුම් ක්‍රමයක් සංවර්ධනය කිරීම, මානසික හා ස්නායු සෞඛ්‍ය අංශ ශක්තිමත් කිරීම, ජාතික සෞඛ්‍ය හා ඒකාබද්ධ පර්යේෂණ වැඩිදියුණු කිරීම සහ කොළඹ ජාතික රෝහලේ අපස්මාර ඒකකය සඳහා මූලධන වත්කම් අත්පත් කර ගැනීම, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සඳහා ප්‍රතිපාදන ලබාදීම සහ වෛද්‍ය නිලධාරීන්ගේ, ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ගේ හා සහකාර වෛද්‍ය නිලධාරීන්ගේ අතිකාල රාජකාරී දීමනා ගෙවීම් | 2,649,000,000 | 1,767,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, සැපයුම්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තුව, විදේශ ගමන්, සහ අළුතින් පත්කරන ලද ආයුර්වේද වෛද්‍ය නිලධාරීනගේ හා සීමාවාසික ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් හා සන්නිවේදන සේවාවන් සඳහා වන වියදම් | 167,400,000 | - |
| 112 | විදේශ කටයුතු අමාත්‍යාංශය | මහාද්වීපික තටකය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මහලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම, අයවැය යෝජනා අනුව 70 වැනි නිදහස් දින සැමරුම සඳහා විදේශ තානාපති කාර්යාලයන්ට සහාය වීම, නිව්යෝර්ක් හා බ්‍රසීලයෙ හි තානාපති කාර්යාල පිහිටි ගොඩනැගිලි වල අයිතිය විදේශ කටයුතු අමාත්‍යාංශයට පවරා ගැනීම ගිණුම්ගත කිරීම, විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන්හි භාවිතය සඳහා වාහන මිල දී ගැනීම, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන සඳහා බදු කුලී ගෙවීම, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අධිකරණයේ පෙනී සිටීමට නීතීඥයෙකු ලබා ගැනීම සඳහා වන වියදම්, IORA ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම් වලට අදාළව ඕස්ට්‍රේලියානු රජයෙන් ලැබුණු ප්‍රදාන ගිණුම්ගත කිරීම, රාජ්‍ය ආයතන ගෙවීම් හා වෙනත් සේවාවන්, පුද්ගල පඩිනඩි, දේශීය හා විදේශීය ගමන්, සැපයුම්, සේවාවන්, වාහන නඩත්තුව සහ පාඩු හා කපා හැරීම්, ජාතික සමුද්‍රීය කටයුතු පිළිබඳ මහලේකම් කාර්යාලයට මාරුකිරීම් | 471,817,500 | 825,025,000 |
| 114 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | ත්‍රිරෝද රථ නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීම හා මීටර් අනිවාර්ය කිරීම, අයවැය යෝජනා අනුව ශ්‍රීලංගම බස් සංචිතයට විදුලි බස්රථ හඳුන්වා දීම, පාසල් හා උසස් අධ්‍යාපන ආයතන වාර ප්‍රවේශ පත්‍ර වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ලාබ නොලබන මාර්ගයන්හි ධාවන කටයුතු පවත්වා ගැනීම හා ත්‍රිවිධ හමුදා නිදහස් වාර ප්‍රවේශ පත් සඳහා ශ්‍රී ලංගම වෙත ප්‍රදාන ලබාදීම, දේශීය හා විදේශීය ගමන් සහ ශ්‍රී ලංගමයෙහි නොගෙවූ සේවක අර්ථසාධක අරමුදල් නිරවුල් කිරීම, පුද්ගල පඩිනඩි, වාහන නඩත්තුව සහ ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා, බස් රථ සංචිතය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපාදන, ආයතනික සංවර්ධනය හා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හැකියා ප්‍රවර්ධනය | 11,540,000,000 | 700,000,000 |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | උතුරු දුම්රිය මාර්ගය සඳහා දුම්රිය සංඥා හා සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීමේ ගාස්තු නිරවුල් කිරීම, මැදවච්චිය - මඩු මාර්ගය හා පලාලි - කන්කසන්තුරෙයි මාර්ගය ප්‍රතිෂ්ඨාපනය කිරීම, දුම්රිය සංවර්ධන ව්‍යාපෘතිය හා ඩීසල් බලවේග කට්ටල | - | 1,852,598,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | 9 ක් මිලදී ගැනීම, මගී ප්‍රවාහන මැදිරි 200 ක් අළුත්වැඩියා කිරීම සහ මුහුදු බඩ මාර්ගයේ දුම්රිය ඇණිය සඳහා වන රැඳවුම් ගාස්තු හා අවසන් ගෙවීම් නිරවුල් කිරීම | | |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි හා ව්‍යුහයන් සඳහා වන ප්‍රතිපාදන, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනය සඳහා බදු කුලී, වාහන ලියාපදිංචි කිරීමේ අංක තහඩු හා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා වන වියදම් | 151,082,000 | 132,000,000 |
| 117 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | මධ්‍යම හා දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන, සියළුම විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක්, දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයක් ස්ථාපිත කිරීම, වයඹ, සබරගමුව හා මොරටුව විශ්වවිද්‍යාලයන්හි රජයේ වෛද්‍ය පීඨ ස්ථාපිත කිරීම, කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපිත කිරීම, රුහුණු විශ්වවිද්‍යාලයේ නාවික අධ්‍යයන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, උසස් අධ්‍යාපනය සඳහා ස්වාධීන ගුණාත්මක හා පිළිගත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම, කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ඒකකයට ආධාර කිරීම, ආහාර තාක්ෂණ, පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම මගින් වයඹ විශ්වවිද්‍යාලයට ආධාර කිරීම, මහපොළ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සඳහා වන වාර්ෂික ගෘහ ආදායම් සීමාව රු. 300,000 සිට රු. 500,000 දක්වා වැඩි කිරීම, නව තාක්ෂණ පීඨ හතක් තාක්ෂණික ධාරාවේ උපාධි වැඩසටහන් පුළුල් කිරීම වයඹ සබරගමුව හා මොරටුව විශ්වවිද්‍යාලවල රජයේ වෛද්‍ය පීඨ ස්ථාපිත කිරීම, කොළඹ විශ්වවිද්‍යාලය මගින් හඳුන්වා දුන් දත්ත විද්‍යාව හා විශාල දත්ත විශ්ලේෂණය, ආයුගණක අධ්‍යයනය හා ව්‍යාපාර විශ්ලේෂණ ආදී නව විෂය ධාරාවන් සඳහා ආධාර කිරීම, වවුනියාව සරසවියේ අතිනවීන පුස්තකාල පහසුකම් හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම, අයවැය යෝජනා අනුව ව්‍යාපාර පිළිබඳ උසස් විද්‍යාලයේ පිළිගැනීම ලබාගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයට ආධාර කිරීම හා 2017 වසරට අදාළ ව්‍යාපෘති සඳහා වන බැඳීම් නිරවුල් කිරීම, නේවාසිකාගාර සංකීර්ණ 84 ක් ඉදිකිරීම, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ ලැප්ටොප් පරිගණක ණය හා වයිෆයි පහසුකම් සඳහා පොළී සහන, රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට මහල් 10 කින් යුත් ගොඩනැගිල්ලක් සහ | 199,500,000 | 44,570,193,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරත වීමට දිරිගැන්වීම්, මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිශෝධිත ප්‍රමුඛතාවන් සඳහා කටයුතු සලසා දීම, බදු කුලී හා පළාත් පාලන ආයතන බදු සහ වැටුප් හා දීමනා වැඩි කිරීමට කටයුතු සලසා දීම, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය නව ස්ථානයක පිහිටුවීම හා සංවර්ධනය කිරීම සඳහා ලබාගත් බැංකු ණය ආපසු ගෙවීම, පහත සඳහන් පර්යේෂණ සඳහා ලද විදේශ ප්‍රදාන<br>- ආර්ථික කටයුතුවල ස්ත්‍රී පුරුෂ සමාජ භාවී විශ්ලේෂණය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය<br>- විශ්ව විද්‍යාල පද්ධතිය තුළ නවක වදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ හිංසනය | | |
| 214 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් සඳහා මහපොළ හා ශිෂ්‍යාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම, 2017 වසරට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීම, විශ්ව විද්‍යාල වල වැටුප් හා දීමනා වැඩි කිරීමට අදාල වියදම් | 3,270,500,000 | 3,254,000,000 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව පරිසර - සහතිකකරණ වැඩසටහන හඳුන්වා දීම ක්‍රියාත්මක කිරීම, කුඩා වැව් 1,500 ක් පුනරුත්ථාපනය, ප්‍රතිසංස්කරණය හා රොන් මඩ ඉවත් කිරීම, ගොවීන් සඳහා දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම, හොරණ හා මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානයන්හි ඉහළ ඵලදාවක් සහිත කෙසෙල් හා අන්නාසි වගාවන් සංවර්ධනය කිරීම පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, අයවැය යෝජනා අනුව ජාතික නිරෝධායන මධ්‍යස්ථානයේ පර්යේෂණ පහසුකම් වැඩිදියුණු කිරීම, පොහොර සහනාධාර වැඩසටහන, සංවර්ධන සහනාධාර හා 2017 වසරට අදාළ ව්‍යාපෘතීන්හි හිඟ බැඳීම් නිරවුල් කිරීම, අප්‍රිකානු ආසියානු ග්‍රාමීය සංවර්ධන සංවිධානය මගින් ලබාදී ඇති ප්‍රදාන හා ජයිකා ආයතනය මගින් ලබාදුන් ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුම්ගත කිරීම, මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩි දියුණු කිරීම හා අත්පත් කර ගැනීම, පුද්ගල පඩි නඩි, දේශීය හා විදේශීය ගමන්, සැපයුම්, නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ව්‍යාපෘතියේ නඩත්තු හා වෙනත් සේවාවන්, ජාතික කෘෂිකාර්මික බෝග විවිධාංගිකරණ හා ජනපද අධිකාරිය සඳහා ප්‍රතිපාදන හා KOPIA මධ්‍යස්ථානය සඳහා ආනයනය කරන ලද වාහනයේ ආනයන බදු | 24,978,449,000 | 5,784,823,640 |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 2017 වසරට අදාළ හිඟ බැඳීම් නිරවුල් කිරීම | - | 612,793,701 |

| | | | | |
|---|---|---|---|---|
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2017 වසරට අදාළ ව්‍යාපෘතීන්හි හිඟ බැදීම් නිරවුල් කිරීම, ශ්‍රී ලංකාවේ පළතුරු වල පසු අස්වනු කළමනාකරණ හා අගය එකතු කිරීමට අදාළ වියදම් සහ අතිකාල හා නිවාඩු දින ගෙවීම් සඳහා වන වියදම් | 45,887,000 | 199,396,837 |
| 119 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | විශ්වීය තර්ජන අවම කිරීමේ සමාරම්භක වැඩසටහනින් ලැබුණු ප්‍රදාන උපයෝජනය කිරීම, 2017 වර්ෂයේ හිඟ බිල්පත් නිරවුල් කිරීම, පිරිසිදු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ වියදම්, තිරසර ජෛව ස්කන්ධ නිෂ්පාදනය කිරීමේ සහ නවීන ජෛව බලශක්ති තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වියදම්, පුද්ගල පඩි නඩි, ඉන්ධන සැපයුම් සහ වාහන නඩත්තුව | 9,800,000 | 280,538,000 |
| 120 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | බාල වයස්කාර වරදකරුවන් හා වින්දිතයින් ප්‍රවාහනය කිරීම සඳහා වාහන ලබාගැනීම, අයවැය යෝජනා අනුව රජයේ කාර්යාලවල ළමා සුරකුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, ගැබිණි මවුවරුන් සඳහා පෝෂණ මල්ල, පෙර පාසැල් ළමුන් සඳහා උදේ ආහාරය ලබාදීම, සුහසාධන වැඩසටහන් අනුව පෙර පාසැල් ගුරුවරුන් සඳහා ළමා දිරිය දීමනා, එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය හා යුනිසෙෆ් ආයතනය මගින් ලබාදී ඇති මූල්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම, හදිසි සහන පැකේජ සඳහා වන හිඟ බිල්පත් නිරවුල් කිරීම සහ විදේශ ගමන් වියදම් | 5,818,080,000 | 103,763,453 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | විදේශ ගමන් වියදම් | 750,000 | - |
| 121 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ගංවතුර හා නායයාම් ආපදා ප්‍රතිචාර වියදම්, සංවර්ධන ව්‍යාපෘතිවල හිඟ වැඩ කටයුතු සම්පූර්ණ කිරීම, සේවා පියස ගොඩනැගිලි 1,000 ක් ඉදිකිරීමට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීම සහ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම | - | 1,131,473,000 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 2017 වසරට අදාළ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීම, පුද්ගල පඩි නඩි සඳහා වන ප්‍රතිපාදන | 36,000,000 | 21,270,000 |
| 256 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 2017 මැයි මස සිදු වූ ආපදාවන්ට අදාළ වන්දි සඳහා වන වියදම් | - | 10,840,000 |
| 257 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | 2017 මැයි මස සිදු වූ ආපදාවන් හේතුවෙන් සිදු කල පුනරුත්ථාපන කටයුතු වලට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම සහ වන්දි ගෙවීම | - | 1,234,627,000 |
| 261 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | 2017 මැයි මස සිදු වූ ආපදාවන් හේතුවෙන් සිදු කල පුනරුත්ථාපන කටයුතුවලට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම සහ වන්දි ගෙවීම | - | 717,760,000 |
| 262 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | නිල්වලා නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ හිඟ බිල්පත් නිරවුල් කිරීම හා 2017 මැයි මස සිදුවූ ආපදාවන් | - | 2,038,768,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | හේතුවෙන් සිදු කල පුනරුත්ථාපන කටයුතු වලට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම සහ වන්දි ගෙවීම | | |
| 263 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | 2017 මැයි මස සිදු වූ ආපදාවන් හේතුවෙන් සිදු කල පුනරුත්ථාපන කටයුතු වලට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම සහ වන්දි ගෙවීම | - | 208,810,000 |
| 271 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය | ආරක්ෂක සේවා සඳහා වන ප්‍රතිපාදන | 7,150,000 | - |
| 272 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | පිරිසිදු කිරීමේ හා ආරක්ෂක සේවා සඳහා ප්‍රතිපාදන | 26,800,000 | - |
| 278 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | 2017 මැයි මස සිදුවූ ආපදාවන් හේතුවෙන් සිදු කල පුනරුත්ථාපන කටයුතුවලට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම සහ වන්දි ගෙවීම | - | 2,353,920,000 |
| 279 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල | 2017 මැයි මස සිදුවූ ආපදාවන් හේතුවෙන් සිදු කල පුනරුත්ථාපන කටයුතුවලට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම සහ වන්දි ගෙවීම | - | 66,740,000 |
| 122 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ජනගහණ ව්‍යාපෘතිය සඳහා ලැබුණු ප්‍රදාන උපයෝජනය කිරීම, වන්දි සමාලෝචන මණ්ඩලයේ වියදම් හා ඉන්ධන සැපයුම් | 3,200,000 | 11,700,000 |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි හා ව්‍යුහයන් සඳහා වන වියදම් | - | 1,500,000 |
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා වෙනත් සේවාවන් | 8,900,000 | - |
| 287 | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | පුද්ගල පඩි නඩි සඳහා වන ප්‍රතිපාදන | 12,000,000 | - |
| 123 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව හිමිකරු විසින් කරගෙන යනු ලබන නිවාස යෝජනා ක්‍රම හා ග්‍රාමීය අංශයේ පවත්නා නිවාස වැඩිදියුණු කිරීමට ආධාර කිරීම, ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය යටතේ ඉඩම් අත්පත් කරගැනීම හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සඳහා වන්දි ගෙවීම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ හිග ගොඩනැගිලි කුලී නිරවුල් කිරීම | 42,460,000 | 822,000,000 |
| 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | පුද්ගල පඩි නඩි සඳහා ප්‍රතිපාදන | 26,600,000 | - |
| 124 | සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන්ට ආධාර කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා මූල්‍ය ආධාර, වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර හා කන්ද උඩරට උරුමය සඳහා ව්‍යවස්ථාපිත මණ්ඩලයක්/අධිකාරියක් ස්ථාපිත කිරීම පිළිබඳ කමිටුවල වියදම් | 12,474,980,000 | 20,000,000 |
| 331 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | සමෘද්ධි සහනාධාර වැඩසටහනේ වියදම් | 39,600,000,000 | - |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාත්‍යන්තර ශිෂ්‍ය ඇගයීම් වැඩසටහන හඳුන්වා දීම, ජාතික අධ්‍යාපන විද්‍යා | 479,900,000 | 2,582,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | පීඨවල ශිෂ්‍යන්ට එක් අයෙකුට රු. 5,000 ක් බැගින් මාසික දීමනාවක් ලබාදීම, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, " සුහුරු පන්ති කාමර" සංකල්පය ශක්තිමත් කිරීම, ඉලෙක්ට්‍රොනික පෙළ පොත් ඩිජිටල්කරණය කිරීම හා සංවර්ධනය කිරීම, මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් පුහුණු කිරීමට වෙන් වූ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, හාපිටිගම හා අඩ්ඩාලච්චේන අධ්‍යාපන විද්‍යා පීඨවල විශේෂ අවශ්‍යතා පුහුණු පහසුකම් ශ්‍රේණිගත කිරීම, අයවැය යෝජනා අනුව කලාකරුවන් සඳහා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්, 5 වසර ශිෂ්‍යත්වය හා "සුහග" ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම. | | |
| 207 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව රිටිගල හා රජගලතැන්න පුරා විද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම | - | 25,000,000 |
| 212 | විභාග දෙපාර්තමේන්තුව | මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම | - | 500,000,000 |
| 130 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | ජාතික චිත්‍රපටි සංස්ථා භාරය මගින් ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප් දීමනාව වැඩි කිරීම, 2017 වර්ෂයේ හිඟ බිල්පත් නිරවුල් කිරීම සහ අර්බුදවල බලපෑමට ලක්වූ ප්‍රදේශයන් හි ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳව පෙරමුණේ සිටින නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | 10,000,000 | 11,680,000 |
| 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | පුද්ගල පඩි නඩි | 122,000,000 | - |
| 135 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ලබාදෙන සහාය සහ දෙමුහුම් පොල් පැල ලබාදීම සඳහා පොල් පර්යේෂණ ආයතනයට ලබාදෙන සහාය ශක්තිමත් කිරීම, රබර් ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම, තේ, රබර් හා පොල් වැවිලි අංශයේ කුඩා වතු හිමියන් සඳහා පොහොර සහනාධාර වැඩසටහන සහ කම්කරු විනිශ්චය සභා මගින් ලබා දී ඇති නියෝග අනුව ගෙවීම් සිදු කිරීම, දායකත්ව හා සම්මාදම් ගාස්තු, පුද්ගල පඩි නඩි, ඉන්ධන, ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා, වාහන නඩත්තුව හා වෙනත් සේවාවන් | 117,930,000 | 338,452,000 |
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | දායකත්ව හා සම්මාදම් ගාස්තු සඳහා වන ප්‍රතිපාදන | 2,000,000 | - |
| 136 | ක්‍රීඩා අමාත්‍යාංශය | මානව කාර්ය සාධන විද්‍යාගාරයට උපකරණ ලබාදීම ක්‍රියාත්මක කිරීම, සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාගාරය නවීකරණය කිරීම හා රාජ්‍ය හා පුද්ගලික අංශයේ සහයෝගීතාවක් ලෙස කළමනාකරණය කිරීම, සුගතදාස එළිමහන් ක්‍රීඩාගාරය වැඩිදියුණු කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජාතික අවබෝධතා වැඩසටහන හා මත්ද්‍රව්‍ය පරීක්ෂා | - | 2,383,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමේ හා පර්යේෂණ කිරීමේ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම, රට පුරා ග්‍රාමීය ක්‍රීඩාංගන 100 ක් සංවර්ධනය කිරීම මගින් ප්‍රජා ක්‍රීඩා සංකල්පය හඳුන්වා දීම හා ඒ සඳහා පහසුකම් සැලසීම, දියගම ක්‍රීඩා පාසැල හා විද්‍යායතනයක් ස්ථාපිත කිරීම සහ 2020 දකුණු ආසියානු ක්‍රීඩා සඳහා සංකීර්ණය සූදානම් කිරීම, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ප්‍රවීණයින් හා ආබාධිත මළල ක්‍රීඩකයින්ට සහභාගී වීමට පහසුකම් සැලසීම, දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ ක්‍රීඩාගාර වැඩිදියුණු කිරීම, අයවැය යෝජනා අනුව මාතලේ හොකී ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීම සහ ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ අතැති බිල්පත් නිරවුල් කිරීම | 50,000,000 | 405,700,000 |
| 140 | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | වාහන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | - | 4,706,000 |
| 145 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | හිටපු සටන්කාමීන් හා යුධ වැන්දඹුවන්ගේ හැකියා වැඩිදියුණු කිරීම හා වැටුප් සහනාධාර ලබාදීම, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පුරාණ රජමහා විහාර හා පූජනීය ස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නවීකරණය කිරීම, ආබාධිත කාන්තාවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා වන විශේෂ වැඩසටහන, ණයගැති පුද්ගලයන්ට ආධාර කිරීම, අයවැය යෝජනා අනුව තෝරාගත් කුඩා කර්මාන්ත සඳහා ආධාර කිරීම හා වාහන සඳහා බදු කුලී, නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් ව්‍යාපෘතියට අදාළ අතැති බිල්පත් නිරවුල් කිරීම හා මත්ද්‍රව්‍යවලට අබ්බැහිවූවන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, තල් සංවර්ධන මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල් හා බිම් බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුම් පවත්වාගෙන යාම | 304,965,000 | 3,182,600,000 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් හා පුස්තකාල පොත් දීමනාව සඳහා වන වියදම් සහ "දහම් දිරිය" - දහම් පාසල් ගුරුවරුන් සඳහා මාසික දීමනාවන් | 41,500,000 | - |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | ඉන්ධන සැපයුම්, ආහාර හා නිල ඇඳුම් සඳහා වන ප්‍රතිපාදන | 126,480,000 | - |
| 148 | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | මූල්‍ය අධ්‍යයන ආයතනයේ පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීම | - | 17,480,000 |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | විදේශ ගමන් සඳහා ප්‍රතිපාදන | 1,000,000 | - |
| 149 | කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය | බුද්ධිමය දේපළ කාර්යාලය නවීකරණය කිරීම, රොබෝ තාක්ෂණ | 254,167,360 | 3,233,010,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම හා නව නිපැයුම් සඳහා ආධාර කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ සිටින පොලිතින් නිෂ්පාදකයින්ට උපකරණ හා යන්ත්‍රසූත්‍ර සඳහා දැරීමට සිදුවන ආයෝජන පිරිවැයෙන් 50% ක් ලබා දීම, අච්චුවේලි කාර්මික කලාපයේ පහසුකම් වැඩිදියුණු කිරීම, සිංහල හා මුස්ලිම් අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, අයවැය යෝජනා අනුව මන්නාරම නාගරික ප්‍රදේශයේ පුනරුත්ථාපන කටයුතු හා සිලාවතුර නගර සංවර්ධනය කඩිනම් කිරීම, දේශීය ටින් මාළු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණය පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, පුද්ගල පඩිනඩි, සමුපකාර සමිති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, ලංකා සතොස සිල්ලර වෙළඳසැල් ජාලය පුළුල් කිරීම, අවශ්‍ය යටිතල පහසුකම් හා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදීම, කාර්මික ගම්මාන නගාසිටුවීම, විශාල ප්‍රදර්ශනාගාරයක් හා රොබෝ යෙදවුම් විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් පිහිටුවීම, වෙළඳ ප්‍රවර්ධන කටයුතු හා සිංහල හා මුස්ලිම් අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, ඇඟළුම් පදනම් කරගත් කුඩා කර්මාන්ත ශාලා හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියට ප්‍රතිපාදන සැලසීම, අලිමංකඩ ලුණු ලේවාය වැඩිදියුණු කිරීම, අත්යන්ත්‍ර කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් හා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදීම, ලක් සතොස හා ඔසුසැල බලයලත් වෙළඳසැල් පුළුල් කිරීම | | |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | දායකත්ව හා සම්මාදම් ගාස්තු, සංවර්ධන සහායන් සහ 2014 සිට 2018 දක්වා Bureau International des Exposition (BIE) ආයතනය සඳහා වන සාමාජික ගාස්තු ගෙවීම් | 9,800,000 | 2,000,000 |
| 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | පුද්ගල පඩි නඩි හා රජයේ සේවකයින්ගේ දේපළ ණය පොළිය සඳහා ප්‍රතිපාදන | 4,500,000 | - |
| 299 | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | පුද්ගල පඩි නඩි සඳහා ප්‍රතිපාදන | 1,500,000 | - |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | පවත්නා සහල් ගබඩා නවීකරණය කිරීම සහ හැකියා ප්‍රවර්ධනය සඳහා වියදම් | - | 30,200,000 |
| 150 | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | සී/ස පොලිප්ටෝ ලංකා (පුද්) සමාගමේ සහ පුද්ගල පඩි නඩි සඳහා වන වියදම් | 1,830,000 | 17,400,000 |
| 151 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | නව ධීවර හා ජල ජීවී ප්‍රතිපත්තියක් සකස් කිරීම, ජාතික ජල සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ පරීක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම හා සහන මිලට ලබාදෙන මාළු සඳහා මිල සහනාධාර, 2017 වසරට අදාළ | 348,830,000 | 1,739,451,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | ඒකාබද්ධ අභ්‍යන්තර ධීවර ගම්මාන පිහිටුවීමේ "වැවක් සහිත ගමක් වැඩසටහන" ට අදාළ හිඟ බිලපත් නිරවුල් කිරීම, සී/ස මිල්කෝ පුද්ගලික සමාගම සඳහා මිල සහනාධාර ලබා දීම, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන සඳහා බදු කුලී, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ වියදම්, ධීවර වරායන්, නැංගුරම් ස්ථාන ගොඩබෑසීමේ ස්ථාන සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම, මඩකලපුව දිස්ත්‍රික්කයේ ජලජීවී වගා කාර්මික උද්‍යානයක් ස්ථාපිත කිරීම, කලපු 10 ක් පිරිසිදු කිරීම, ගන්දර ධීවර වරාය සංවර්ධනය  කිරීම හා වැල්ලමන්කර නව ධීවර වරායක් සංවර්ධනය  කිරීම, වේක්ක මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් හා සමුද්‍රීය විසිතුරු මසුන් අභිජනන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, ජාතික ජලජ සම්පත් පර්යේෂණ ආයතනයේ පරීක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම, අයවැය යෝජනා අනුව මයිලඩි වරාය ධීවර වරායක් බවට සංවර්ධනය  කිරීම, ශීතාගාර හා ගබඩා පහසුකම් ඇති කිරීම | | |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව අඩි 55 ට වැඩි දිගින් යුත් බහුදින බෝට්ටු මිලදී ගැනීම සහ බහුදින බෝට්ටුවල මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා වන පිරිවැයෙන් 50% ක් ලබාදීම, ධීවර සහයෝගිතා කළමනාකරණ සැලසුම් ව්‍යාපෘතියේ II අදියර ක්‍රියාත්මක කිරීම, පුද්ගල පඩි නඩි සහ ලංකා බැංකුව හරහා ක්‍රියාත්මක කරනු ලබන "දියවර දිරිය " ණය යෝජනා ක්‍රමය සඳහා පොළී සහනාධාර ගෙවීම | 62,500,000 | 420,090,925 |
| 154 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා වන වියදම්, වී මිලදී  ගැනීම, 2017 වසරට අදාළ ව්‍යාපෘතිවල හිඟ බැඳීම් නිරවුල් කිරීම සහ බඩල්ගම කිරි සැකසුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම | 500,000,000 | 120,000,000 |
| 155 | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ඝන අපද්‍රව්‍ය පිළිබඳ ගැටළුවල දී පළාත් පාලන ආයතනවලට සහාය වීම, ග්‍රාමීය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම, ඉලෙක්ට්‍රොනික පළාත් පාලන ආයතන යෙදවුම් පද්ධතියක් හඳුන්වා දීම, වන්දනාකරුවන් සඳහා නවාතැන් පහසුකම් ඇති කිරීම, අයවැය යෝජනා අනුව පළාත්  පාලන ආයතන වැඩිදියුණු කිරීම සහ " අම්මච්චි" සංකල්පය ක්‍රියාත්මක කිරීම, කොළඹ මහනගර සභාවට හිඟ ගිවිසුම්ගත ගෙවීම් නිරවුල් කිරීම, පළාත් පාලන ආයතන 100 ක පිළිගැනීමේ කවුන්ටර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීම, පළාත් සභා සඳහා | 41,842,000 | 2,841,953,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | ආධාර, මීරිගම "සෙත් සෙවන" රජයේ වැඩිහිටි නිවාසය නවීකරණය කිරීම හා නැගෙනහිර පළාතේ අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම, උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අවසාන ශේෂය ආපසු ගෙවීම, අළුතින් ඇති කරන ලද රාජ්‍ය අමාත්‍යාංශයේ වියදම් සහ ෂැන්ග්‍රිලා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියට සහ කොම්පඤ්ඤ වීදිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියට යටිතල පහසුකම් ලබාදීම සඳහා වන හිඟ ගිවිසුම්ගත ගෙවීම් | | |
| 312 | බස්නාහිර පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සහ සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය සඳහා වැඩිකරන ලද දීමනා | 701,170,000 | 21,000,000 |
| 313 | මධ්‍යම පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන, වෛද්‍ය නිලධාරීන් සඳහා අමතර රාජකාරී දීමනා සහ අතිකාල සංශෝධන | 426,000,000 | 23,000,000 |
| 314 | දකුණු පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන, වෛද්‍ය නිලධාරීන් සඳහා අමතර රාජකාරී දීමනා සහ අතිකාල සංශෝධන | 849,000,000 | 23,000,000 |
| 315 | උතුරු පළාත් සභාව | උතුරු පළාත් මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන, යාපනය - කිලිනොච්චිය ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ණය කාලසීමාව දීර්ඝකිරීම හේතුවෙන් පවතින ආධාර උපයෝජනය කිරීම, පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන, චංචල දේපල සඳහා වන මුද්දර ගාස්තු ආපසු ගෙවීම හා ගිණුම්ගත නොකළ වියදම් ගිණුම්ගත කිරීම සහ උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ බේරුම්කරණ ගාස්තු නිරවුල් කිරීම සහ වෛද්‍ය නිලධාරීන් සඳහා අතිකාල සංශෝධන | 284,000,000 | 908,010,000 |
| 316 | වයඹ පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සහ 2017 වසරට අදාළ හිඟ ගෙවීම් නිරවුල් කිරීම සහ වෛද්‍ය නිලධාරීන් සඳහා අමතර රාජකාරී දීමනා සහ අතිකාල සංශෝධන | 372,000,000 | 222,000,000 |
| 317 | උතුරු මැද පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සහ 2017 වසරට අදාළ හිඟ ගෙවීම් නිරවුල් කිරීම, උතුරු පළාත් මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම, සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ වැඩි කරන ලද දීමනා සහ වෛද්‍ය නිලධාරීන් සඳහා අතිකාල සංශෝධන | 581,010,000 | 55,190,000 |

| | | | | |
|---|---|---|---|---|
| 318 | ඌව පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන, ඌව පළාතේ කෘෂිකාර්මික මාර්ග හා කුඩා වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ 2017 වසරට අදාළ හිඟ ගෙවීම් නිරවුල් කිරීම, සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ වැඩි කරන ලද දීමනා සහ වෛද්‍ය නිලධාරීන් සඳහා අතිකාල සංශෝධන | 357,000,000 | 324,000,000 |
| 319 | සබරගමුව පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සහ 2017 වසරට අදාළ හිඟ ගෙවීම් නිරවුල් කිරීම සහ වෛද්‍ය නිලධාරීන් සඳහා අතිකාල සංශෝධන | 350,000,000 | 322,000,000 |
| 321 | නැගෙනහිර පළාත් සභාව | පාසල් අධ්‍යාපනය දනුම් කේන්ද්‍රස්ථානයක පදනම බවට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සහ 2017 වසරට අදාළ හිඟ ගෙවීම් නිරවුල් කිරීම සහ වෛද්‍ය නිලධාරීන් සඳහා අමතර රාජකාරී දීමනා සහ අතිකාල සංශෝධන | 431,000,000 | 222,000,000 |
| 157 | ජාතික සංවාද අමාත්‍යාංශය | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ ජාතික සහජීවනය ක්‍රියාත්මක කිරීම, අයවැය යෝජනා අනුව භාෂා ප්‍රවීණතාවය, භාෂා පරිවර්තනය ආදිය වැඩිදියුණු කිරීම, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහනයේ බදු කුලී, වාහනයක් ලබා ගැනීම, පුද්ගල පඩිනඩි, දේශීය හා විදේශීය ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය හා ඉන්ධන සැපයුම්, වාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තුව, තැපැල් සහ මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩි දියුණු කිරීම හා අත්පත් කර ගැනීම | 46,117,000 | 250,310,000 |
| 158 | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සහ සී/ස ඇල්කඩුව වැවිලි සමාගමේ වැටුප් හා වේතන ගෙවීම, ශ්‍රී ලංකා කජු සංස්ථාවේ හිඟ බැදීම් නිරවුල් කිරීම, වාහන නඩත්තුව, බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු, ප්‍රවාහනය, වෙනත් සේවාවන් සහ විදේශ ගමන් | 11,750,000 | 625,520,000 |
| 159 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව බලකොටු හයක් සංවර්ධනය කිරීම ක්‍රියාත්මක කිරීම, දුම්රිය ස්ථාන වැඩිදියුණු කිරීම හා පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන ලෙස ප්‍රකාශයට පත්කිරීම, සංචාරක හිතකාමී ටුක් ටුක් වැඩසටහන | - | 375,000,000 |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම්, දැහැමි දිරිය හා දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පූජනීය ස්ථාන නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සහ දේවස්ථානයන් හි යටිතල පහසුකම් නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම | 111,900,000 | 24,850,000 |

| | | | | |
|---|---|---|---|---|
| 160 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | කාර්මික අපද්‍රව්‍ය හා ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ වියදම්, නිසරු වී ඇති කෘෂිකාර්මික ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීම, වන විනාශයෙන් හා වන හායනයෙන් ඇතිවන විමෝචකයන් අඩුකිරීමේ යාන්ත්‍රණය, ජෛව - විවිධත්ව හා කෘෂි ජෛව විවිධත්වය සංරක්ෂණ පද්ධති ප්‍රධාන ප්‍රවාහගත කිරීම, ජල සම්පත් සංවර්ධන ආයෝජන වැඩසටහනේ වියදම්, මොරගහකන්ද සහ කළු ගඟ ජලාශ ව්‍යාපෘතිය සහ සෞඛ්‍ය හා පරිසර ප්‍රතිපත්තීන් සඳහා වායු තත්ත්ව තක්සේරු ව්‍යාපෘතිය, මධ්‍යම පරිසර අධිකාරිය සඳහා බඳවාගත් නව කාර්ය මණ්ඩලයට වැටුප් හා වේතන ගෙවීම | 45,000,000 | 901,784,000 |
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කාර්මික වැවිලි ස්ථාපනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන වියදම් | - | 75,000,000 |
| 291 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ යාන්ත්‍රණය සංවර්ධනය කිරීම හා වෙරළ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ව්‍යාපෘතිය සහ ඉංජිනේරු හා සංවර්ධන නිලධාරීන්ගේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම හේතුවෙන් වැටුප් ගෙවීම | 1,150,000 | 425,000,000 |
| 161 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | - | - | - |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව ආවේනික විශේෂ සංරක්ෂණය කිරීම ක්‍රියාත්මක කිරීම සහ සෆාරි ආදිය සඳහා සහායවීමට මාදුරුඔය හා ගල්ඔය ජාතික උද්‍යාන සංවර්ධනය කිරීම | - | 95,000,000 |
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව දෙහිවල සත්වෝද්‍යානයේ "එළිමහන් සත්ත්වෝද්‍යාන" සංකල්පය සහ පින්නවල අලි අනාථාගාරයේ "යදම් රහිත නිදහස් පරිසරයක්" සංකල්පය ක්‍රියාත්මක කිරීම | - | 150,000,000 |
| 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව මල් වගා කිරීමේ කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සහාය | - | 10,000,000 |
| 162 | මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව අරුවක්කාළු අපද්‍රව්‍ය බැහැර කිරීමේ හා කළමනාකරණය කිරීමේ පරිශ්‍රය සංවර්ධනය කිරීම, රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීත්වයක් ලෙස සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම හරිත උයන් පිහිටුවීම, නිල්වලා එළිය ආදර්ශ උද්‍යානය, නිවාස ඒකක 20000 ක් ලබාදීම, නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය, නගර හා උපාය මාර්ගික නගර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ 2017 වසරට අදාළ ව්‍යාපෘතිවල හිඟ බැඳීම් නිරවුල් කිරීම | - | 16,270,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| 163 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව මොරටුව අති නවීන සංස්කෘතික මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම හා මන්නාරම තාල්වුපාඩු හි සංස්කෘතික මධ්‍යස්ථානයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම, පුද්ගල පඩිනඩි, විදුලි බලය හා ජලය, ජාතික සාහිත්‍ය කලා උත්සවය, සංස්කෘතික මධ්‍යස්ථානයන්හි පුහුණු වැඩසටහන් සඳහා වන වියදම්, මූලධන වත්කම් පුනරුත්ථාපනය කිරීම/වැඩි දියුණු කිරීම හා අත්පත් කර ගැනීම, සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම හා පුනරුත්ථාපනය කිරීම, යන්ත්‍රසූත්‍ර, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව, වෙනත් සේවාවන්, දේශීය ගමන්, වාහන නඩත්තුව සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන වියදම් | 11,576,413 | 742,423,587 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | හැකියා ප්‍රවර්ධනය සඳහා වන වියදම්, වෙනත් සේවාවන්, ආධාර අවශ්‍ය කලාකරුවන් සඳහා ආධාර, ජාතික කලා උළෙල සහ වෙනත් සේවාවන්, මූලධන වත්කම් පුනරුත්ථාපනය/වැඩි දියුණු කිරීම සහ අත්පත් කර ගැනීම, කුණ්ඩසාලේ කලා නිකේතනය ඉදිකිරීම, උතුරු-දකුණු මිතුරු සෙවණ, මිහින්තලාව-උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ සහ ජෝන් ද සිල්වා රඟහල සහ ජාතික කලාගාරය ප්‍රතිසංස්කරණය කිරීම | 8,281,072 | 41,618,928 |
| 165 | ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | උතුරු හා නැගෙනහිර පළාත්වල ගඩොල් හා බදාම සහිත නිවාස 50,000 ක් ඉදිකිරීම, ග්‍රාමීය වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් හා ක්‍රියාවන් සඳහා සහාය වීම, වැසි ජලයෙන් වගා කිරීම හා ඒකාබද්ධ ගම්මාන සංවර්ධනය, ආර්ථික සවිබල ගැන්වීම හා සමාජයීය යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කරගත් ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරීම, කිලිනොච්චි හා ඩෙල්ෆ්ට් දූපත්හි ආහාර සැකසුම් මධ්‍යස්ථාන දෙකක් ස්ථාපනය කිරීම, යාපනයේ නවීන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීම හා අයවැය යෝජනා අනුව අතුරුදහන් වූවන් සඳහා වන කාර්යාලය පිහිටුවීමට ආධාර කිරීම සහ ගරු රාජ්‍ය අමාත්‍යවරයා සඳහා වාහනයක් ලබාගැනීම, ප්‍රතිසන්ධානය අරමුණු කරගත් ආර්ථික සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය | 650,000,000 | 4,232,826,000 |
| 166 | නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය | අයවැය යෝජනා අනුව කල්මුණේ හා සමන්තුරේ සඳහා ප්‍රධාන සැලසුමක් ක්‍රියාත්මක කිරීම, පසුගාමී කලාපවල නගර සංවර්ධනය කිරීම සහ 2017 වසරට අදාළ හිඟ බිල්පත් නිරවුල් කිරීම | - | 2,500,000,000 |
| 167 | විශේෂ කාර්යභාර අමාත්‍යාංශය | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනය සඳහා බදු කුලී | 4,100,000 | - |
| 176 | වරාය හා නාවික අමාත්‍යාංශය | හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා ඉඩම් අත්පත් | 279,000,000 | 1,073,204,040 |

| | | | | |
|---|---|---|---|---|
| | | කරගැනීමට අදාළ හිඟ වන්දි ගෙවීම් නිරවුල් කිරීම සහ හම්බන්තොට වරාය සඳහා වන අනුග්‍රහ ගිවිසුමට පෙර කොන්දේසි සපුරාලීමේ වියදම්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදලේ පොළී ගෙවීම, සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය | | |
| 192 | නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, ගමන් වියදම්, සැපයුම්, වාහන නඩත්තුව හා වෙනත් සේවා සඳහා වන ප්‍රතිපාදන | 11,004,000 | - |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | අයවැය යෝජනා අනුව ශ්‍රී ලංකා පොලීසිය මගින් සංචාරක පොලිස් ස්ථාන 20 ක් පිහිටුවීම, පොලීසිය ප්‍රතිසංස්කරණය කිරීම හා ප්‍රජා පොලිස් සංකල්පය හඳුන්වා දීම, පොලිස් හා අපරාධ අධිකරණ විශ්වවිද්‍යාලයක් පිහිටුවීම, සයිබර් අපරාධ පරීක්ෂණ ඒකකය ශක්තිමත් කිරීම හා පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම | - | 745,000,000 |
